ශ්‍රීසඞ්ඝබොධි විජයබාහු පරිවෙණාධිපති

ෂඞ්භාෂාපරමෙශ්වර

තොටගමුවේ

ශ්‍රීරාහුල සඞ්ඝරාජොත්තමයාණන්වහන්සේ

විසින් විරචිත

# සැලලිහිණි සංදේශය

සහ-එහි

## පුරාතන සන්නය.

පැලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

පූජ්‍යාචාර්‍ය්‍ය

රත්මලානේ ධර්‍මකීර්ත්ති ශ්‍රීධර්‍මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ

ප්‍රධානනායකස්ථවිර ස්වාමිපාදයන්වහන්සේවිසින්

කරනලද

ප්‍රතිසංස්කරණයෙන් හා අභිනව භාවසන්න

ග්‍රන්ථිපදවිවරණාදියෙන් උපලක්ෂිතයි.

ඩී. ජ්. වණිගසූරිය අප්පුහාමි විසින්

සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි අච්චුගස්වනලදී.

ශ්‍රී බු. ව. 2451.

ක්‍රි. ව. 1908.

# THE
# SELALIHINI SANDESA
## WITH A PARAPHRASE

BY

**SANGHARAJA SRI RAHULA MAHA STHAVIRA**

PRESIDENT OF THE

*Sri Sanghabodhi Vijayabahu Pirivena of Totagamuwa.*

---

REVISED AND EDITED BY

**The Venerable**

**DHARMAKIRTI SRI DHARMARAMA NAYAKA STHAVIRA**

M. R. A. S. (Ceylon Branch)

*High Priest of Colombo and Chilaw Districts and*

*Principal of the Vidyalankara (Oriental) College*

PELIYAGODA, KELANIYA.

---

PUBLISHED BY

D. A. WANIGASURIYA APPUHAMY.

PRINTED AT THE SATYASAMUCHCHAYA PRESS.

---

A. B. 2451.

A. D. 1908.

[All Rights Reserved.]

ශ්‍රීසඞ්ඝබොධි විජයබාහු පරිවේණාධිපති

ෂඞ්භාෂාපරමෙශ්වර

තොටගමුවේ

ශ්‍රීරාහුල් සඞ්ඝරාජොත්තමයාණන්වහන්සේ

විසින් විරචිත

# සැලලිහිණි සන්දේශය

සහ-එහි

## පුරාතන සන්නය.

---

පෑලියගොඩ විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති

පූජ්‍යාචාර්‍ය

රත්මලානේ ධර්‍මකීර්‍ත්ති ශ්‍රීධර්‍මාරාමාභිධාන

කොළඹ හලාවත දෙදිශාවේ

ප්‍රධානනායකස්ථවිර ස්වාමිපාදයන්වහන්සේවිසින්

කරනලද

ප්‍රතිසංස්කරණයෙන් හා අභිනව භාවසන්න

ග්‍රන්ථිපදවිවරණාදියෙන් උපලක්ෂිතයි.

---

ඩී. ජේ. වණිගසූරිය අප්පුහාමි විසින්

සත්‍යසමුච්චය යන්ත්‍රාලයෙහි අච්චුගස්වනලදී.

---

ශ්‍රී බු. ව. 2451.

ක්‍රි. ව. 1908.

# ශාරිකාසන්දේශ

# සංශෝධනය.

ශාරිකාසන්දෙශ නම් වූ මේ කාව්‍යය වර්ණනාතික්‍රාන්තවූ මධුර මනොහර ස්වභාෂාකාව්‍යයකි. සම්භාවනීය පුරාතන සන්නයකින්ද යුක්තවූ මේ කාව්‍යය ගතවූ අවුරුදු (49) එකුන්පනසක් අතර බොහෝ වාරගණනක්හි මුද්‍රිතව භාවිතව පවත්නේය. පළමුවර මුද්‍රණයේදී සංශොධනය කළ ප්‍රසිද්ධ පඬිවරයා ඉතා උත්සාහගෙන යථාශක්තින් ශුද්ධකොටත් එහි ඇතම් ශුද්ධි අසම්පූර්ණබව ප්‍රකාශකෙළේය. එසේද වුවත් දෙවෙනි තෙවෙනි ශොධකයෝ ඊට වැඩි ශුද්ධියක් නොකළෝය. එහෙයින් මේ පොත මිට පළමු එකවරක් ශුද්ධවූ ග්‍රන්ථයක් ලෙස සැලකියයුතු වේ. අවුරුදු ( 49 ) එකුන්පනසකින් පෙර ස්වභාෂා ශුද්ධියෙහිද මෙකල ස්වභාෂාශුද්ධියෙහිද මහත් විශෙෂයක් විද්‍යමානබව ශාස්ත්‍රාභ්‍යාසය කරන්නෝ දනිති. මේනිසා ඒ පූර්වශුද්ධියම ප්‍රමාණ නොකොට මෙකල විද්‍යාර්ථීහු නොයෙක්තැන සංශයප්‍රාප්ත වෙති. සියලු ප්‍රාචීනවිද්‍යාර්ථීන් අතට පත්වන සිතුමිණිරුවනක් බඳු මේ කාව්‍යය සුපිරිසුදුවම ප්‍රකාශකර වුවමැනවැයි කතිපය සුධීජනකෙනකුන්විසින් ආරාධිතවූ අපි මෙකල දුර්ලභවූ පුරාතන හස්තලිඛිත පුස්තක කීපයක් ලදින් ඒ පොත් හා සසඳ ලීමෙන් යථාවකාශයෙන් මෙහි ශුද්ධිය කෙළෙමු. පුරාණ සන්නයේ ආරම්භයෙහි ග්‍රන්ථාන්තරයෙන් උපුටා ගෙනහැර දක්වනලද ලිපිදොෂාකීර්ණවූ සමහරශ්ලොකයන්ගේ පාඨශොධනයවත් අර්ථවිවරණයවත් මිට පළමු ශුද්ධකළ උගතුන්විසින් නොකරනලදී. හෙද ප්‍රකරණානුමිතියෙන් ශුද්ධ කොට ඊට පදාර්ථවිවරණත් කෙළෙමු. පූර්වමුද්‍රණයෙහි පැනෙන භාවසන්නද ගැටපදවිවරණයද අපේ ශුද්ධිය හා සංසක්ත නොවනහෙයින් අභිනව භාවසන්නයක් පුරාතන සන්නයෙන් යට රේඛා පරිච්ඡින්නකොට යුක්තකෙළෙමු. අවසානයෙහි අපේ අභිනව ග්‍රන්ථිපදවිවරණයද සංක්ෂෙපවිධියකින් දක්වීමු.

අපගේ ශුද්ධියෙහි ඇති විශෙෂස්ථාන දක්වත්හොත් බොහෝය. එහෙයින් කතිපයස්ථානයක් පමණක් සඳහන්කරමු.

1 වෙනි ගීයෙහි "සැරද" යනු මෙකල්හි සර්වසම්භාවිත පාඨයකි. එසේද වුවත් මේ සඳහා පරීක්ෂණයට පැමිණි අපට "සැර දෙ" යන සුවිශුද්ධ පාඨය පුරාතන ලිපියෙකින්ම දෘශ්‍යමාන විය. එයින් 94 වෙනි කවෙහි විපරීතාක්ෂරයෙන් තුබූ "සුරවර සැරද" යනුත් "සුරවර දෙ සැර" යි ශුද්ධයට පමුණුවාලියහැකි වීමු. මේ දෙකවෙ අන්‍යොන්‍ය

ශුද්ධියෙන් චිරකාලයක් අශුද්ධව තුබූ ප්‍රධානස්ථානයක් ශුද්ධලෙස ආධුනිකයන් වෙත පත්කරන්ට අවස්ථාව ලත්හෙයින් මහත් ප්‍රීතියක් භජනය කරම්හ.

10 වෙනි කව පොතෙන් බැහැර කොට අමුතු කවකැයි බොහෝ දෙනාවිසින් සලකනලද්දකි. ඒ එසේනොවනබැව් බොහෝ අත්පොත්හි එය එතන්හිම ලියනලදහෙයින්ද ස්ථානොචිතහෙයින්ද සමාන සංඥාරීතිය ඇතිහෙයින්ද සලකාගෙන යථාස්ථානයෙහි යුක්ත යෙළෙමු. සන්නපොත්හි ඊට සන්නයක් නොලැබුණෙන් එහි පදවිසන්නය අප විසින් පූරණය කරනලදි.

96 වෙනි කවෙහි පූර්වශොධකයන්ගේ පොත්වල "තල්ලූරුතුනයා" යන පාඨය පුරාණ අත්පොත් එකකවත් අපට දකින්ට නොලැබුණේය. ඒ පොත්වල පෙනෙන පාඨය "නන්නූරුතුනයා" යනුයි. මේ "නන් නූරු" යන නාමභාගය සම්භාව්‍යවූ ශිලාලෙඛනයෙක්හිද පැණේ. අර්ථයටද අවිරුද්ධබැව් ද්‍රාවිඩනිඝණ්ටුවලින් ප්‍රකාශ වේ. එහෙයින් පුරාණ අත්පොත්හි තුබූසේම "නන්නූරුතුනයා" යන පාඨය පිළිගතිමු.

අෂ්ටාදශමාත්‍ර පාදාන්විත සමුද්‍රඝොෂවෘත්තයෙන් නිබද්ධ පාදඇති කවි අතරෙහි සප්තදශමාත්‍රික පාදද මෙහි බොහෝ තැන දක්නාලැබේ. ඒ ලිපිදොෂයැයිද සැලකිය නොහේ. බන්ධවෛශිෂ්ට්‍යයට බාධාවක් නොපැනෙන හෙයිනි. එහෙයින් එය කවීන්ද්‍රයාණන්ගේම උපජාති බන්ධන විශෙෂයකැයි සැලකුවමනායි. මෙබඳු කවි පූර්වශොධකයෝ අමුතුමාත්‍රාවක් හෙළාලීමෙන් කිසිතැනෙක පූරණය කළහ. කිසිතැනෙක නොකළහ. අපි ඒ කිසිත් විකෘතියක් නොකෙළෙමු. අෂ්ටාදශසප්තදශමාත්‍රාසම්මිශ්‍රණයෙන් පෙර තුබූසේම පිළිගතිමු. මෙසේ අපගේ සංශොධනයෙහි බොහෝ විශෙෂඇතිවූයේ අප මහාකවීන්ද්‍රයන්වහන්සේගේ කෘතිය ප්‍රකෘතිභාවයට පත්වනසේ පුරාතන ලිපි ගුරුකිරීමෙන් සකස්කරන්ට වන්හෙයිනි. අභිමානවිරහිතව සාවධානචිත්තයෙන් මෙතෙහි කරන ප්‍රමාණානුසාරි විඥයෝ අපගේ මේ ප්‍රයාසයෙහි සතුටුවෙතැයිද ඒසම අපගේ ශ්‍රමසාඵල්‍යයයිද සලකම්හ.

*DHARMAKIRTI SRI DHARMARAMA.*

*H. P.*

බුද්ධවර්ෂ 2451 පොසොන් අව 6 වක්ලස්
ක්‍රි. ව. 1908 ජුනි 19 වෙනි සිකුරාදා
විද්‍යාලඞ්කාර පිරිවෙන්හිදීය.

# ශුද්ධිපත්‍රය.

| පිට. | පේළි. | අශුද්ධ. | ශුද්ධ |
|---|---|---|---|
| 3 | 1 | සැරද | සැර දෙ |
| 6 | 0 | පැසුලු | පැසුළු |
| ,, | 15 | ,, | ,, |
| 13 | 33 | මනොඥ | බබලන |
| 16 | 1 | පක්ෂින්ගෙ | පක්ෂීන්ගේ |
| 24 | 29 | වේලාව | වේලාවක් |
| 30 | 8 | අඟු | අඬගු |
| 31 | 24 | ප්‍රදීපයන් | ප්‍රදීපයන් |
| 43 | 8 | ෂ-සඃ-ගා | ස-ඊ-ග |
| ,, | ,, | බෙ-නි | බ-නි |
| 48 | 24 | පුළුලුකුල | පුළුලුකුළ |
| ,, | 33 | ශ්‍රී | ශ්‍රී |

## සඞ්කෙත නිරූපණය.

**ග්‍රන්ථිපද විවරණයෙහි**

( පා ) පාලිශබ්ද ගැන සලකුණය.

( සි ) සිංහලශබ්ද ගැන සලකුණය.

මේ ලකුණු නොයෙදූ ශබ්ද සංස්කෘතයයි දතයුතු.

## විඥප්තියයි.

ශ්‍රීමත් විද්‍යාලඞ්කාර පරිවෙණාධිපතීන්වහන්සේගේ සන්න ගැටපද විවරණසහිත සංස්කරණයෙන් යුක්තවූ මේ පොත නැවත අච්චු ගැස්වීම මෙම පිරිවෙනෙන් අවසරලත් අයෙකුවිසින්ම කටයුතුයි.

මෙයට-

*D. J. RAJAPAKSHA*

විද්‍යාලඞ්කාර පිරිවෙණේ

කැපකරුනැන.



# සැලලිහිණිසන්දේශ

## ස න් න ය.

**නමඃ ශ්‍රීඝනාය.**

" ප්‍රසිද්ධං නායකීකෘත්‍ය පුරුෂං වා'ථ යොෂිතම්
සන්දෙශම් ප්‍රෙෂයෙච්චාන් දූතෛර්මෙඝාදිභිශ්ශුභෛඃ.
ඉතිහාසකථාපූර්වමාශීඃපූර්වමථාපි වා
දූතානාං වර්ණනයෙද්දෙශ කුශලප්‍රශ්නපූර්වකම්.
වර්ණනානන්තරං තස්‍ය ගන්තව්‍යස්ථානකීර්තනම්
පශ්චාත්තත්‍රව්‍රජෙත්‍යුක්ත්වා මාර්ගදෙශාදි වර්ණයෙත්.
තත්‍රස්ථදෙශනගරනායකානාං ගුණස්තුතිඃ
තතො වෘත්තාන්තකථනං දූතස්‍යාශීර්වචඃ පරම්".

යනාදි දූතකාව්‍යලක්ෂණයෙන් යුක්තවූ විභීෂණදෙවිරජහු දක වර ප්‍රාර්ථනාවක් කිරීම කථාශරීරකොට ඇත්තාවූ සන්දෙශයක් ශාරිකාපක්ෂිහු දූතක්‍රියායෙහි යොදා රචනාකරනුකැමැත්තාවූ සංස්කෘත ප්‍රාකෘත මාගධී අපභ්‍රංශ පෛශාචී ශෞරසෙනී යන ෂඩ්භාෂාකවිත්වයෙහි සමර්ථවූ ශ්‍රීසඞ්ඝබොධිවිජයබාහුපරිවෙණාධිපති **ශ්‍රීරාහුල** ස්වාමිපාදයෝ ත්‍රිවිධ කාව්‍යමුඛයන් අතුරෙන් ආශීර්වාද පුරස්සර කොට "සැර දෙ සුලකළකුරු" යනාදි කව කීහු.

මෙහි පූර්වාර්ධයෙන්;—

" ස්වරාමෘතෙනොපජගුශ්ච ශාරිකා-
ස්තථෛව තත්පෞරුෂගායනීකෘතාඃ " යි *

---

* නෛෂධප්‍රථමසර්ගයෙහි 103 වෙනි පද්‍යයයි.

" තදර්ථමධ්‍යාප්‍ය ජනෙන තවනෙ
ශුකා විමුක්තාඃ පටවස්තමස්තුවන්
ස්වරාමෘතෙනොපජගුශ්ච ශාරිකා-
ස්තථෛව තත්පෞරුෂගායනීකෘතාඃ".

නෛෂධීයකාව්‍යයෙහි කීහෙයින් සියලුපක්ෂීන් අතුරෙන් මධුරාක්ෂරවචනයෙන් ප්‍රසිද්ධවූ ශාරිකාපක්ෂිරාජයාහට එම විද්‍යමානවූ නෛසර්ගික ගුණයෙන් ස්තුති කළහ. අපරාඪියෙන්;-

“කෘතෙ න වො'ගුඃ කවිතාඃචමුජ්ජගුඃ
කාලමපිකාඃ පඨමමඤ්ජුවචවඃ
ගෘහාඩගණං වතුකිංණ 'මෘජංසතරාං
වචොහරා යත්‍ර වධුෂු ශාරිකාඃ” යි-

ශ්‍රීසනාතනදකාව්‍යයෙහි කීහෙයින්ද වාසවදත්තාකාව්‍යයෙහි ශාරිකා පක්ෂීහු ලවා සන්දෙශපත්‍ර ගමන් කරවා වාසවදත්තාවගේ මනොරථ සිඩිය වූයේය යනු පෙනෙනහෙයින්ද මේ පක්ෂිරාජයා රහස්‍යසම්භාෂණයෙහි සමර්ථබව ප්‍රකාශකොට කීමෙන් තදර්ථසාධකවූ දූතක්‍රියාවද එහිම අනනුගීතවචනහෙයින් මේ පක්ෂීහු රාජකුලයාහට දූතාමාත්‍යයන්ට බඳු බුද්ධියෙන් යුක්තයයි සංස්කාරජන්‍යගුණවිශෙෂයෙන් ස්තුති කළහ යනු මෙහි සමුදායාර්ථයැ. අවයවාර්ථ කියනුලැබේ.

1 සැර දෙ සුලකලකුරු–මියුරු තෙපලෙන් රඳනා
රජකුලරහසැ මැතිනිය-සියනිහි සැලලිහිණිසඳ.

“සුලකලකුරු මියුරු තෙපලෙන් රඳනා රජකුලරහසැ මැතිනිය සැලලිහිණිසඳ සියන් ඉහි සැර දෙ” යනු මෙහි වාක්‍යයොජනායි.

I සුලකලකුරු, මනාකොට හොබවනලද අක්ෂරයෙන් යුක්තවූ; මියුරු, ශ්‍රවණමධුරවූ; තෙපලෙන්, වචනයෙන් හෙවත් කාව්‍යසුභාෂිතාදිපද්‍යනයෙන්; රඳනා, රඤ්ජමානවූ; නොහොත් ජනරඤ්ජනය කරන්නාවූ; රජකුලරහසැ, රාජකුලයාගේ රහස්‍යවිෂයෙහි හෙවත් ගුප්තභාෂණවිෂයෙහි; මැතිනිය, මන්ත්‍රීන්ගේ ඥානයට බඳු ඥාන ඇති; සැලලිහිණිසඳ, ශාරිකාපක්ෂිරාජොත්තමය; සියන් ඉහි, ස්වකීය බන්ධූන් හා එක්වැ; සැර දෙ, චිරාත්කාලයක් ජීවත් වා; බොහෝ කලක් පවතු.

---

1 ඉතා අලඞ්කෘත කොට කියන අක්ෂර ඇති මධුරවචනයෙන් සිත් අලවන්නාවූ; රාජකුලයාගේ රහස්හි මන්ත්‍රියක්හට බඳු නුවණ ඇති; සැලලිහිණි පක්ෂිරාජය, බන්ධූන් හා සමග තුඹ බොහෝකලක් ජීවත් වන්.

මේ ‘ යහනී ’ නම් වෘත්තයයි. එහි ලක්ෂණ

“නවෙකොළොස්වසමැ–එකොළොස්බැවින් සෙමෙහි
ළහු බහලින් බඳුයෙ- යහගීය මේ නිදසුන්”

ප්‍රථම තෘතීය පාදයන්හි ක්‍රමයෙන් මාත්‍රා නවයක් එකොළොසක්ද ද්විතීය තෘතීය පාදයන්හි එකොළොසක් එකොළොසක් දැයි දෙසාලිස් මතෙකින් බඳනාලද්දේ ‘ යහනී ’ නම් වෘත්තයයි–මේ ඊට නිදර්ශනයි.

"සැලළිහිණිසඳ සැරද" යි කියා ධනුර්ගුණසම්බන්ධන්‍යායයෙන් යොජනය කොට කියයි දතයුතු.

මෙහි පළමුවන යහනියෙන් ශාරිකාපක්‍ෂිහුගේ චතුරවචනය සියලු ජනයන්ගේ ශ්‍රවණමනොහාරිය සන්තොෂජනකයයි ශිෂ්ටාභිමතවූ ජලපානාවස්ථාව ගෙන දූතයාහටද මඞ්ගලය පිණිස බන්ධුමිත්‍රයන් හා සමඟ චිරාත්කාලයක් ජීවත් වයි ආශීර්වාද කොට තමන් පළමුවෙන් නොකියන ලද රූපවර්ණනාවෙන් ශාරිකාපක්‍ෂිහුගේ කුශලප්‍රශ්න කොට තමාගේ චිත්තප්‍රීති හඟවන්නාහු "පුල්මල්කෙසරු" යනාදි සැහැල්ල කිහු.

සැහැල්ලෙහි අටවැනි දසවැනි පදයෙන් "සබඳිනි" යනුද "තොප" යනුද සිංහාවලොකනන්‍යායයෙන් අනුවර්තනය කටයුතු.

2 පුල්මල්කෙසරුමෙන්-රන්වනි තෙලෙ සරණයුග

සපුමල් කැලෙව් තුඩ මඳ රතිනි මනහ ර
නිලුපුල් දෙලෙව් සම්වනි පිය පියපත ර
මලින් කළ රූවෙව්—එබැවින් නුබින් එනවර
නිලු ද ළඳ සිඳුබුවෝ දිගුවරලැ නි ලු
නිලු ද වට බිඟුපෙළ අද තඹරනි ලු
ව න දෙව්ලියෝ නොකොළොද සවන අබර ණ
එ න මඟ දුකෙක් නොවිඳ සබඳිනි කල ණ
සෙ න හස බැඳුණු තැනැ නොහරිනා කැරැ දියු ණ
වෙ න සැප කුමට තොප දකිනා එම පම ණ

2 සබඳිනි, මිත්‍රයාණෙනි; තොප, යුෂ්මතුන්ගේ; තෙලෙ සරණයුග, මේ (දෘශ්‍යමානවූ) චරණයුග්මය; පුල්මල්කෙසරු මෙන්, විකසිත කුසුම කෙශරයන් මෙන්; රන්වනි, පිඤ්ජරවර්ණ වන්නේය; (තෙලෙ) තුඩ, (මේ) චඤ්චුව; සපුමල්කැලෙව්, චම්පක කලිකාවක් වෙන්; මඳරතිනි, ඊෂද්රක්තභාවයෙන්; මනහර, මනොඥ වන්නේය; (තෙලෙ, මේ;) පිය, ප්‍රියවූ; පියපතර, පක්‍ෂපත්‍රසංහතිය; නිලුපුල්දෙලෙව්, නිලොත්පලපත්‍රයන් මෙන්; සම්වනි, ශ්‍යාමවර්ණ වන්නේය; එබැවින්, ඒ භාවයෙන්; මලින් කළ රූවෙව්, පුෂ්පමය රූපයක් මෙන්; නුබින්, නභස්ථලයෙන්; එනවර, එන්නාවූ කාලයෙහි; ළඳ සිඳුබුවෝ, තරුණ සිද්ධාඞ්ගනාවෝ; නිලු, නීල වර්ණවූ; දිගුවරලැ, දීර්ඝවූ කෙශකලාපයෙහි; නිලුඳ, ප්‍රක්ෂේප නොකොළෝද; තඹරනිලු, තාමරස නිලය කොට ඇත්තාවූ හෙවත් පද්මයෙහි වාසය කරන්නාවූ; බිඟුපෙළ, භෘඞ්ගාවලිහු; අද, අවුත්; වට නිලුද, පරික්ෂෙප නොකොළෝද හෙවත් සිසාරා නොගත්තාහුද; වනදෙව්ලියෝ, වනදිව්‍ය ස්ත්‍රීහු; සවනඅබරණ නොකොළොද, කර්ණාවතංස නොකොළෝද; එන, ආගමනය කරන්නාවූ, මඟ, මාර්ගයෙහිදී; දුකෙක් නොවිඳ, (සිද්ධාඞ්ගනා

භෘඞ්ග වනදෙවතාවන්විසින්) කිසිපීඩාවක් නුවූයේද; බැඳුණුතැනැ, (මනො) බන්ධනය කළාවූ ස්ථානයෙහි; දියුණු කැරැ, අධික කොට; සෙනෙහස, ස්නෙහාධ්‍යාශය; නොහැරිත, පරිත්‍යාග නොකරන්නාවූ; කලණ සබඳිනි, කල්‍යාණමිත්‍රයාණෙනි, තොප, යුෂ්මත්හු; දකිනා, දර්ශනය කරන්නාහට; එව, ඒ (දර්ශනය)ම; පමණ, පර්‍යාප්ත වන්නේය; වෙන සැප, අන්‍ය සෞඛ්‍යසම්පත්තියක්; කුමට, කිමර්ථද ? කවර ප්‍රයොජනයෙක්ද ?

3 ල ප නොමවන් සඳවන් සොමිගුණ ගිහි ණී
බ ප වැඩි ගත හෙල්මැලි සියුමැලි පැමි ණී
සැ ප සිරි දෙන වැනි රසබසැති සිතුමි ණී
තො ප දුකුමෙන් අප පින් කල බව දැනු ණී

3. ලප නොමවන්, ලාඤ්ඡනප්‍රවෙශයක් නුවූ; සඳවන්, චන්ද්‍රයාට බඳුවූ; සොමිගුණ ගිහිණී, සෞම්‍යගුණග්‍රහණය ඇත්තාවූ; නො හොත්-සොමිගුණ, සෞම්‍යගුණයෙන්; ගිහිණී, ගහනවූ; හෙල්මැලි, කහ්ලාරයට බඳුවූ; සියුමැලි පැමිණී, සෞකුමාර්‍ය්‍යප්‍රාප්තවූ; ඔපවැඩි, කාන්තියෙන් අතිරික්තවූ; ගත, ගාත්‍රයක් ඇත්තාවූ; සැපසිරි දෙන, (අති මත) සෞඛ්‍යසම්පත්තිප්‍රදානය කරන්නාවූ; රසබසැති, මධුරවචනො

---

2 මිත්‍රයාණනි, තොපගේ මේ (පෙනෙන) දෙපතුල පිපුණුමල් රොන් මෙන් රන්වන්ය; (මේ) තුඩ සපුමල් කැකුළක්සේ මදරත් පැහැ යෙන් සිත් ගන්නේය; (මේ) ප්‍රියවූ පියාපත් සමූහය නිල්මහනෙල්පෙති සේ අඳුරුනිල්වන්ය; එබැවින් මලින් කළාවූ රූපයක් සේ අහසින් එන කල්හි තරුණ සිද්ධාඞ්ගනාවෝ (තා අල්වාගෙන ඔවුන්ගේ) නිල්දිගු කෙශකලාපයෙහි බහා නොගත්තුද ? නෙළුම්මල්හි වසන බමරසමූහ යෝ (මලෙකැයි සිතා) අවුත් වටලා නොගත්තුද ? වනවැසි දෙවඟනෝ (මලෙකැයි සිතා අල්වාගෙන) කර්ණාභරණයක් කර නොගත්තුද ? (මෙසේ) එන්නාවූ අතරමඟදී (සිද්ධාඞ්ගනා–භෘඞ්ග-වනදිව්‍යස්ත්‍රීන් කරණ කොට ) කිසියම් දුකෙක් නොවූයේද ? සිත බැඳුණුතැන දියුණු කොට ඒ ස්නෙහාධ්‍යාශය අත්නොහරින්නාවූ යහපත් මිත්‍රයාණනි, තොප දක්නාහට ඒ දැකීමම ඇත. අන් සැපතක් කුමටද ?

මේ 'උපජාති'නම් දසපද සැහැල්ලයි. එහි ලක්ෂණ–

"කඩවක්හි පිරියතැ–සිව්පෙදෙහි යම්පිරිනක්
බහා බඳහොත් දන්නේ–උවදැනම් සැහැලිනම්"

'සිහිලිහි'දෙකකින්වූ 'කඩවක්'නම් (සපද) වෘත්තයාගේ අන්තයෙහි යම්සිව්පද වෘත්තයක් ලා බඳහොත් ඒ 'උපජාති' නම් සැහැලි වෘත්තය වේ.

3 සසලපය නැති සඳමඬලක්සේ ( නිෂ්කලඞ්ක ) සෞම්‍යගුණ යෙන් ගහනවූ; හෙල්මැලිනම් ජලජපුෂ්පය මෙන් මොළොක්බවට පැමිණි ඉතා කාන්තිමත් ශරීරයක් ඇත්තාවූ; කැමැති සැපසම්පත්

පෙතවූ; සිතුම්ණි වැනි, චිත්‍රාමාණික්‍යයක් බඳුවූ; තොප දැකුමෙන්, පූෂ්මත්හුගේ දර්ශනයෙන්; අප, අස්මද්ශබ්දවාච්‍යයන්ගේ; පින් කළබව, කෘතපුණ්‍යභාවය; දැනුණි, පරිඥාත වී.

4 මි තු රු තු මෝ දුක්සැප දෙකෙහිම පැවැ ති
බි තු සි තු චම් රූමෙන් පිටු නොපාවි ති
යු තු ම තු වැඩ මතෙපල එවැනි ගුණ ඇ ති
සි තු නතු කැරැ අස යහළුව වඩන රු ති

4. මිතුරුතුමෝ, මිත්‍රොත්තමයෝ; පැවැති, ප්‍රවෘත්තවූ; දුක් සැප දෙකෙහිම, දුඃඛසෞඛ්‍ය ( අවස්ථා ). චයෙහිම; බිතුසිතුවම්රූ මෙන්, භිත්තියෙහි (අඳනාලද) චිත්‍රකර්මරූපයන් මෙන්: පිටු නොපාවිති, පරාඞ්මුඛ නොවෙති; එවැනි ගුණ ඇති, තාදෘශගුණයෙන් යුක්තවූ; රුති වඩන, අභිලාෂවර්ධනය කරන්නාවූ; යහළුව, මිත්‍රය; මතු, අනාගතකාලයෙහි; වැඩයුතු, අභිවෘද්ධියෙන් යුක්තවූ; මතෙපල, මාගේ වචනය; සිතු නතු කැරැ, චිත්තය අවනත කොට; අස, ශ්‍රවණය කර.

මෙසේ යථොක්තක්‍රමයෙන් ශාරිකාපක්ෂිරාජයාහට මිත්‍රයන්ට සුදුසුවූ ප්‍රියසම්භාෂණය කොට ඔහුවිසින් කළමනා දෙයට නියෝග කරන්නාහු "පව්රදකඳ" යනාදී කව කීහු.

5 ප ව් රද කඳ නාලෝමුල් දිගතු බ ර
ලෙ ව් තුරු සුසැදු යස මිණිමුතු මල්පත ර
ස ව් සිරි පිරි සුරපුර වත් කැලණිපු ර
දෙ ව් මෙහසුන් විබිසණ සුරිඳුට පව ර

5 පව්රදකඳ, පර්වතරාජ නමැති හෙවත් මහාමෙරු පර්වත නමැති ස්කන්ධයක් ඇත්තාවූ; නාලෝමුල්, නාගලොක නමැති මූලයෙන් යුක්ත

---

දෙන රසබස් ඇති (එහෙයින්) සිතුම්ණිරුවනක් බඳුවූ; තොපගේ දැකීම හෙතු කොටගෙන අප පෙර පින්කළතැනැත්තන් බව හැඟෙන්නේය. තොප දැකීම අපගේ පෙර පිනකින් සිදුවිය යිසේයි.

'සමුද්‍රඝොෂ'නම් වෘත්තයයි. එහි ලක්ෂණ -

"දෙසෙන් අටෙන් යති-අටලොස්මතින් බඳහොත්
වේ සමුදුරුගොසනම්-නිදසුන්ද දනු මෙමෙසේ"

4 උතුම් මිත්‍රයෝ තුමූ පැවැත්තාවූ දුක්සැප කාලදෙක්හිම බිත්තියෙහි ඇඳි චිත්‍රකර්මරූප මෙන් පිටිනොපාන්නෝය. එබඳු ගුණයෙන් යුත් ප්‍රිය වඩන මිත්‍රයාණනි, මතු වැඩඇත්තාවූ මාගේ වචනය සිත යොමු කොට අසව.

5 මෙරු පර්වත නමැති කඳ ඇති නාගලොක නමැති මූල්ඇති දිශා නමැති අතුබර ඇති ලොක නමැති වෘක්ෂයෙහි; (තමාගේ) කීර්ති

වූ; දිගතුබර, දිශානමැති ශාඛාභාර ඇත්තාවූ; ලෙව්තුරු, ලෝක නමැති වෘක්ෂයෙහි; යස, කීර්ති නමැති; මිණිමුතු, ප්‍රබුඞවූ; මල්පතර, පුෂ්පසමූහය; සුසැදු, සුසජ්ජිතකළාවූ; සුරපුරවන්, දිව්‍යපුරය මෙන්; සව් සිරි, සකලසම්පත්තියෙන්; පිරි, සම්පූර්ණවූ; කැලණිපුර, කල්‍යාණීපුර යෙහි; පවර, ප්‍රවරවූ; විබිසණ්සුරිඳුට, විභීෂණසුරේන්ද්‍රයාහට; මෙහ සුන්, මේ සන්දේශය; දෙව්, දානය කරව්.

6 ගනවන් මියුරු නද දෙන ගුවන වන් වි ට
විලසින් මෙමා කරවන මිතුර මන් තු ට
එහසුන් පැසුලු පවසමි රස තුසුන් කො ට
අස දූන් තු යන මහ සලකුණු මෙතැන් සි ට

6 ගුවන වන් විට, (සමුද්‍රයෙන් ජලග්‍රහණය කොට) ආකාශයට ප්‍රවිෂ්ටවූ කාලයෙහි; මියුරු නදදෙන, මයූරයන්ට සන්තොෂජනනය කරන්නාවූ; ගනවන්, මෙඝයක් මෙන්; විලසින්, (ශරීර) ලාවණ්‍යයෙන්; මෙමා මන්තුට කරවන, මේ මාගේ චිත්තසන්තොෂය කරවන්නාවූ; මිතුර, සහච්ච; පැසුලු, පශ්චාත්කාලයෙහි (හෙවත් මාර්ගවර්ණනාවට) පසුව; එහසුන්, ඒ සන්දේශවාක්‍යය; රස තුසුන් කොට, මාධුර්‍ය්‍යවිච්ඡේදය නොකොට; පවසමි, ප්‍රකාශකෙරෙමි; දූන්, අධුනාකාලයෙහි; මෙතැන් සිට, මේ (අප උන්නාවූ) ස්ථානයෙහි පටන්; තු යන, තොප ගමනය කරන්නාවූ; මහ සලකුණු, මාර්ගසංකෙතයන්; අස, ශ්‍රවණය කර.

දූන් ඒ පක්ෂිරාජයා නික්මෙන්නාවූ පුරය වර්ණනා කරන්නාහු "පොහොසද්දන ඇති" යනාදි කීහු.

පොහොසද් දන ඇති තුනුරුවනැ බැතිපෙ මා
මු ලු ව ද් දන සුරපුර පිරි සිරින් හැ මා
ජය ව ද් දන කිරුමෙන් සුසැදු තමන මා
ජය ව ද් දන පුරවර දනු මිතුරුනු මා

7 තුනුරුවනැ, (බුඩාදි) රත්නත්‍රයෙහි; බැතිපෙමා, භක්තිප්‍රෙම ඇත්තාවූ; පොහොසද්දන ඇති, ප්‍රභූජනයා ඇත්තාවූ; පිරි, සම්පූර්ණවූ;

---

නමැති පිපිමල්සමූහය සැදුවාවූ නොහොත් ලොක නමැති වෘක්ෂය (සච්කිය) කීර්තිනමැති පිපිමල්රැසින් සැරසුවාවූ දිව්‍යනගරයක් මෙන් සකලශ්‍රීන් පිරුණාවූ කල්‍යාණීපුරයෙහි උතුම්වූ විභීෂණසුරෙන්ද්‍රයාහට මේ හස්න (පර්වුධය) දෙව.

6 (මුහුදෙන් දිය ගෙන) අහසට නැඟිකල්හි මොනරුන්ට සතුටු උපදවන්නාවූ මෙඝයක් මෙන් රූපවිලාසයෙන් මේ මාගේ සිත සතුටු කරවන්නාවූ මිත්‍රය ( මාර්ගවර්ණනාවෙන් ) පසු ඒ හස්න රසවත් කොට කියමි. දූන් මේ ස්ථානයෙහි සිට තා යන්නාවූ මාර්ගයාගේ සල කුණු අස.

7 මිත්‍රොත්තමය ! (බුඩාදි) තෙරුවනකෙරෙහි භක්තිප්‍රෙමාන්විතවූ

හැමා සිරින්, සකලසම්පත්තියෙන්; සුරපුර, දිව්‍යපුරය; මුලුවද්දන, කොණ්ප්‍රවෙශ කරන්නාවූ; ජයවද්දන කිරුමෙන්, ජයවර්ධනකරණය හෙතුකොටගෙන; තමනමා, ස්වකීය නාමය; සුසැදු, (අර්‍ථාන්විත හෙයින්) සුසජ්ජිත කලාවූ; ජයවද්දන්පුරවර, ජයවර්ධන නම්වූ පුරප්‍රවරය; මිතුරු තුමා, මිත්‍රොත්තමය; දනු, අවබොධනය කර.

8 සැදි රතනඹර පෙල රනතිසරුන් රුවැ ති
විදි දියදහර ලෙලදෙන දිගු නරුපටැ ති
රැදි රලරැලැති හොය දියවන්නා නමැ ති
ඇඳි පුරඅගන පටසළු සිරි රැපැසි නි ති

8 රතනඹරපෙල, රක්තවර්ණවූ තාමරසපඞ්ක්තියෙන්; සැදි, සජ්ජිතවූ; රනතිසරුන් රුවැති, ස්වර්ණහංසයන්ගේ රූපයෙන් යුක්තවූ; විදි දියදහර, (එක්දෙශභාගයෙකින් ආවරණවශයෙන් බඳනාලද පාෂාණයෙහි) විකීර්ණවූ ජලධාරා නමැති; ලෙලදෙන, ලීලොපෙතවූ; දිගු, දීර්ඝවූ; නරුපටැති, නිවිපට්ටයෙන් යුක්තවූ; රැදි, රඤ්ජිතවූ; රල රැලැති, තරඞ්ග නමැති වලි ඇත්තාවූ; දියවන්නා නමැති, දියවන්නා යන නාමයක් ඇත්තාවූ; හොය, නදීතොමෝ; පුරඅගන, පුරනමැති අඞ්ගනාවවිසින්; නිති, නිරන්තරයෙන්; ඇඳි, ආච්ඡාදනය කලාවූ; පට සළු සිරි, පට්ටවස්ත්‍රශ්‍රිය; ඇරැපැයි, ගෙනහැර දක්වූ.

9 සමනල මුහුල මහසමුදුර මෙවුල්බ ර
සුලකල පුවල ලකගන සිරි යොවුන් ව ර
නරකල විසල් වාසල් යතුරු මෙතුව ර
බැඳහල රුවන් තනපට කියලිය පවු ර

9 සමනලමුහුල, සමන්තකූටපර්වත නමැති ධම්මිල්ලයක් ඇත්තාවූ; මහසමුදුරමෙවුල්බර, (හාත්පසින් වටකරනලද) මහාසමුද්‍ර නමැති

---

අධිපති ජනයා ඇති; පිරුණුවූ සකලසම්පත්තිය කරණකොට ගෙන දෙව්පුරය මුලුගන්වන්නාවූ; ජයවැඩීම හෙතුකොටගෙන (ජයවර්ධන යන) තමාගේ නාමය (අන්වර්ථකරණයෙන්) සැරසුවාවූ (මේ) ජයවර්ධන නම් රාජධානිය දැනගන්න.

8 රත්නෙළුම්පෙළින් සැරසුණාවූ; ස්වර්ණහංසයන්ගේ රූපයෙන් යුක්තවූ; විසුරුණු ජලධාරා නමැති සැලෙන දික් නරුපට ඇත්තාවූ; රඳනා දියරළ නමැති රැලි ඇත්තාවූ; දියවන්නානමැති නදීතොමෝ ජයවර්ධනපුරී නමැති අඞ්ගනාවවිසින් ඇඳගත් පටසළුවස්ත්‍රයේ ශොභාව නිතර ගෙනහැර දක්වූ.

9 මේ නුවරෙහි ප්‍රාකාරයතෙම සමන්තකූට නම් පර්වත නමැති කොණ්ඩයක් ඇති, මහාසාගරනමැති බරවූ මෙඛලාභරණයක් (ඉණ පලඳනාවක්) ඇති, මනාකොට සැරසුණාවූ (මෙසලට) වැඩිසිටියාවූ

මෙඛලාභාරයක් ඇත්තාවූ; සුලකළ, මොනවට අලඞ්කෘතවූ; පුවළ, (මේ වර්තමානකාලයට ) පෞණිවූ; ලකඟන, ලඞ්කාඞ්ගනාව; සිරි, ඓශ්වර්‍ය්‍යී යෙන්; යොවුන්වර, යෞවනාවස්ථායෙහි; බැඳහළ, බන්ධනය කොට හරන ලද්දාවූ; විසල් වාසල්, විශාලවූ ගොපුර නමැති; තරකළ, ස්ථිරීකෘතවූ; යතුරු, යන්ත්‍රබන්ධන ඇත්තාවූ; රුවන්තනපට (සිරි), රත්නමය පයෝධරපට්ට (ශොභාවක්); මෙනුවර පවුර, මේ නගරයෙහි ප්‍රාකාරය තෙම; කිසලිය, ප්‍රකාශ කෙළේයි.

10 දු ව න බඳකිකිණි හයකුරපහරන ඳ
ස ව න තලනිනද ගිජිඳුන් සෙමෙර බ ඳ
ර ව න නොයෙක තුරු ජයසක්හඬනොම ඳ
දෙ ව න මුහුද මෙන් ගුම් ගනි පුර නිබ ඳ

10 දුවන, ධාවනය කරන්නාවූ; බඳකිකිණි, බඩ කිඞ්කිණි ඇති; හය, අශ්වයන්ගේ; කුරපහරනද, ඛුරප්‍රහාරයෙන්වූ නාදයෙන්ද; සෙමෙරබඳ, චාමරබඩවූ; ගිජිඳුන්, ගජේන්ද්‍රයන්ගේ; සවනතලනිනද, කර්ණතාලශබ්දයෙන්ද; රවන, නාදකරවනුලබන්නාවූ; නොයෙකතුරු, අනෙකතූර්‍ය්‍යයෙන්ද; නොමඳ, අමන්දවූ; ජයසක්හඬ, ජයශඞ්ඛශබ්දයෙන්ද; පුර, ( මේ ජයවර්ධන ) පුරය තෙම; දෙවනමුහුද මෙන්, ද්විතීයසමුද්‍රයක් මෙන්; නිබඳ, අනවරතයෙන්; ගුම් ගනි, ඝොෂග්‍රහණය කෙරේ.

11 සිහි ල් සපු සුවඳ ගෙන එන උයන්ව ල
සිහි ල් නෙලෙන් හඬවන මිණි කිකිණිකැ ල
විපු ල් රත්සෙමෙර බඳ රත්දද සස ල
ලක ල් මෙපුර තුළ වළහා රිවිතැවු ල

11 උයන්වල, ගෘහොද්‍යානයන්හි; සිහිල්සපුසුවඳ, චන්දනචම්පක පුෂ්පයන්ගේ සුගන්ධය; ගෙන එන, ග්‍රහණය කොට එන්නාවූ; සිහිල් නෙලෙන්, ශීතලමාරුතයෙන්; හඬවන, ශබ්ද පවත්වන්නාවූ; මිණි කිකිණිකැල, මාණික්‍ය කිඞ්කිණිසමූහ ඇත්තාවූ; විපුල්, මහත්වූ; රත් සෙමෙර බඳ, රක්තවර්ණ චාමර බඳනාලද්දාවූ; සසල, චචලවූ;

---

ලඞ්කානමැති අඞ්ගනාව ( පෙර ) ඓශ්වර්‍ය්‍යයෙන් තරුණව සිටිකල්හි (ඉණ) බැඳ හැරදමනලද, මහවහසල්දොරනමැති යන්ත්‍රබන්ධන ඇති, රත්නයෙන් කරනලද පියවුරුපටක්හුගේ; ශොභාව ප්‍රකාශකෙළේය.

10 දුවන්නාවූ රසුබැඳි අසුන්ගේ කුරපහර නාදයෙන්ද; සෙමෙර බැඳි ඇත්රජුන්ගේ කන්තල නාදයෙන්ද; වයනුලබන්නාවූ නොයෙක් භෙරීමෘදඞ්ගාදි තූර්‍ය්‍යයෙන්ද; බොහෝවූ ජයශඞ්ඛ නාදයෙන්ද; මේ ජය වර්ධනපුරයතෙම දෙවැනි මුහුදක් මෙන් නිතර ගිගුම් ගන්නේය.

11 ගෙළයන්හි සඳුන්වල්සපුමල්සුවඳ ගෙන එන සිහිල් සුළ ඟින් හඬවන මැණික්රසුසමූහ ඇත්තාවූ; මහත්වූ රත්චාමර බඳනා

රන්දද, සුවර්ණ (පට්ට) ධ්වජතෙම; ළකල්, මනොඥවූ; මෙපුරතුළ, මේ පුරාභ්‍යන්තරයෙහි; රිවිතැවුල, සූර්‍ය්‍යසන්තාපය; වළහා, පහකෙරේ.

මෙහි සඳුන්මල්සපුමල්සුවඳින් මිශ්‍රවූ චාරුතවර්ණනාවෙන් හා රක්තචාමර රන්පතාකා වර්ණනාකිරීමෙන්ද වසන්තකාලයෙහි එනුවර පවත්නාවූ මකරධ්වජපූජොත්සව දැක්වූහු.

12 ත් ර් සර හිවි මහල් මෙහි පහඹපෙළ නිතො ර
සු ර සිදු විදුදරන් සැදි සඳලු මනහ ර
කර වන මඟුල්කෙළියෙන් නොමැති අවිස ර
පු ර සිරි බලනලෙස බට සුරවිමන් යු ර

12 මෙහි, මේ පුරයෙහි; තරසර, ස්ථිරසාරවූ; හිවි, උස්වූ; මහල්, ත්‍රිභූමක පංචභූමකාදීන් යුක්තවූ; පහපෙළ, ප්‍රාසාදපඞ්ක්තියෙහි; නිතොර, නිරන්තරයෙන්; සුරසිදුවිදුදරන්, දෙව සිද්ධ විද්‍යාධර (ප්‍රතිමාරූප) යෙන්; සැදි, සැරහී සිටියාවූ; මනහර, මනොඥවූ; සඳලු, චන්ද්‍රශාලාවෝ; කර වන, (සන්තුෂ්ටවූ නාගරික ජනයන්විසින්) කාර්‍ය්‍යමාණවූ; මඟුල්කෙළියෙන්, මඞ්ගලොත්සව ක්‍රීඩායෙන්; අවසර නොමැති, අවකාශයක් නැත්තාවූ; පුරසිරි, පුරශ්‍රීසමෘද්ධිය; බලනලෙස, නිරීක්ෂණය කරනපරිද්දෙන්; බට, (ආකාශයෙන් භූමියට) අවතීර්ණවූ; සුරවිමන් යුර, දෙවවිමානයන් හා සමාන වන්නාහුයි.

13 සි සි වන චුවන ඉහසුග ගතහැකි මිටි න
නි සි පුළුලුකුල රියසක යුරු තිසර ත න
දි සි රනලියෙව් රූසිරියුත් මෙපුරහ න
ඇ සි පිය හෙළන පමණින් නොවෙති දෙවඟ න

13 සිසිවන, චන්ද්‍රයාට බඳුවූ; චුවන, මුඛ ඇත්තාවූ; මිටින ගතහැකි, මුෂ්ටිග්‍රහණය කළහැක්කාවූ; ඉහසුහ, කෘශවූ මධ්‍යප්‍රදෙශ ඇත්තාවූ;

---

ළඳ චචලවූ රතන (රන්කම් කළ) පට්ටධ්වජසමූහතෙම මනොඥවූ මේ ජයවර්ධනනගරය තුළ ඉරඅවුව වළක්වයි.

12 මෙනුවර ඉතා ශක්තිමත් උස් මහල්ඇති ප්‍රාසාදපඞ්ක්තියෙහි නිරන්තරයෙන් දෙව සිද්ධ විද්‍යාධරරූපයෙන් සැරසී සිටිනා මනොඥවූ චන්ද්‍රශාලාවෝ (සතුටුවූ නාගරිකයන්විසින්) කරවන මඞ්ගලොත්සවක්‍රීඩන යෙන් අවකාශයක් නොමැත්තාවූ ( ජයවර්ධන ) පුරයාගේ ශ්‍රීසමෘද්ධිය බලනපරිද්දෙන් (අහසින් බිමට) බැස්සාවූ දෙවවිමාන වැන්නාහුය.

13 චන්ද්‍රයාට බඳු මුහුණුඇති මිටින් අල්වාගතහැකි සිහින් ඉඟ ඇති (කැමැතිවීමට) යොග්‍යවූ රථචක්‍රවැනි පුළුල් උකුළුඇති හංසාකාර පයොධරඇති ස්වර්ණමය ලතාවන් මෙන් පෙනෙන්නාවූ රූපශොභා

ඊයසකපුරු, රථචක්‍රාකාරවූ; නිසි, (අභිලාෂකිරීමට) යොග්‍යවූ; පුළුලු කුළ, පෘථුලශ්‍රොණීභාග ඇත්තාවූ, තිසරතන, හංසයන්ට බඳුවූ පයො ධරයුග්මයන් ඇත්තාවූ; රනලියෙව්, ස්වර්ණලතාවන් මෙන්; දිසි, දෘශ්‍ය මානවූ; රුසිර්යුත්, රූපශ්‍රීයෙන් යුක්තවූ; මෙපුරඟන, මේපුරස්ත්‍රීහු; ඇසි පිය හෙළන පමණින්, අක්ෂිපක්ෂ්මස්පන්දනය කරන මාත්‍රයෙකින්; දෙව ඟන නොවෙති, දිව්‍යස්ත්‍රීහු නොවෙති, (සෙසු රූපවිලාසයෙන් දිව්‍යස්ත්‍රීන් හා සමානයහ යනු භාවයි).

14 සොඳුරු සිය්නදන් අනතුරු දෙස සිටි න
කිනු රු නිසසරන් කදහස වෙතනොව න
ඉ සු රු දනදසිය නිකෙලෙස් තැන රඳ න
උ තු රු දිගිඳුපුර දිනී මෙපුර වැජඹෙ න

14 සොඳුරුසියනදන්, (අලකාපුරය මෙන් නොවී) සොඳුරු, සුන්දරවූ; සියනදන්, සියගණින් නිධාන ඇත්තාවූ; නොහොත්–සොඳුරු, මනොඥවූ; සිය, ස්වපක්ෂයන්ට; නදන්, නන්දනීයවූ; අනතුරුදෙසසිටින- (අලකාපුරය මෙන් උත්තර දිශායෙහි නොපිහිටා) අනතුරුදෙස, තමහට ඉතිරියක්හු නැත්තාවූ දික්හි හෙවත් දක්ෂිණදිශායෙහි; සිටින, ස්ථිතිය කරන්නාවූ; කිනුරුනිසසරන්, (අලකාපුරය මෙන් අශ්වමුඛාදි කිනනර යන් හා යක්ෂයන් ආසනන නොවී) කදහස, කිසිකාලයෙකත්; කිනුරු, කුත්සිත නරයන් හා; නිසසරන්, වෛරයන්; වෙතනොවන, සමීප නො වන්නාවූ; නිකෙලෙස් තැන–(අලකාපුරය මෙන් එක ඊශ්වරයක්හු එක ධනදයක්හු කෛලාසස්ථානයෙහි සේ වාසය නොකොට)නිකෙලෙස්තැන, නිඃක්ලෙශස්ථානයෙහි; හෙවත් බාධාවක් නැත්තාවූ ස්ථානයෙහි; ඉසුරු දනදසිය, සියගණින් ඊශ්වරයන් හා සියගණින් ධනදයන්; රඳන, සංචාරය කරන්නාවූ; වැජඹෙන, විජෘම්භමාණවූ; මෙපුර, මේ පුරයතෙම; උතුරුදිගිඳුපුර, උත්තරදිශාධිපතිවූ වෙසවුණුමහරජහුගේ අලකානම් රාජධානිය; දිනී, ජයගත්තේයි.

---

යෙන් යුක්තවූ මෙනුවර ස්ත්‍රීහු ඇසිපිය හෙළීමය යන සලකුණ පමණෙ කින් දිව්‍යස්ත්‍රීහු නොවෙති. සෙසු රූපශ්‍රීලක්ෂණ කරණකොටගෙන දෙවඟනෝමය සීසේයි.

14 (මහාපද්ම, පද්ම, ශඞ්ඛ, මකර, කච්ඡප, මුකුන්ද, කුන්ද, නීල, වර, යන නවනිධානයක් ඇති උත්තරදිශායෙහි පිහිටියාවූ කින්නරයන් හා රාක්ෂසයන්ගේ හැසිරීම්ඇති එකම ඊශ්වරයකු හා එකම ධනපතියකු ඇති කෛලාසමස්තකයෙහි පවත්නාවූ වෛශ්‍රවණයාගේ අලකාපුරය ජයවඩිනපුරයට අඩුතරම් කොට ශ්ලෙෂාලඞ්කාරයෙන් වර්ණනා කරන් නාහු "සොඳුරු සියනදන්" යනාදි කව කීහු.)

යහපත් සියගණින් නිධානඇති නොහොත් සුන්දරවූ ස්වකීය ජනයන් සතුටුකරවන්නාවූ උතුම්වූ නොහොත් උතුරට විරුඩදිශායෙහි (දකුණු දිශායෙහි) පිහිටියාවූ කින්නරයන් (නින්දිතමනුෂ්‍යයන්) හා නිශාචරයන්

මෙසේ පුරවර්ණනා කොට ඉක්බිති සන්දෙශහරවූ පක්ෂීහු තීක් මෙන්ට ශුභනක්ෂත්‍රමුහූර්තා කියන්නාහු "උදේ සැපත්" යනාදි කීහු.

15 උ දේ සැපත් සුරගුරු අලුකැරු අව ට
ස දේ මුදු න් පත අස්විද නැකතැ සි ට
නා දේ සිහි න් තමකුල දෙවිය සිහිකො ට
යෙ දේ ගම න් යහළුව මෙපුරෙන් තොප ට

15 සුරගුරු, වෘහස්පතිහු; අවට, හාත්පසින්; අලුකැරු, ආලොක කොට; උදේසැපත්, උදාවීමට පැමිණිකල්හි; අස්විදනැකතැ, අශ්විනී නක්ෂත්‍රයෙහි; සිට, අවස්ථිතව; සඳේ මුදුන්පත, චන්ද්‍රයා (නභො) මධ්‍යයට පැමිණිකල්හි; නදේසිහින්, සන්තොෂචිත්තයෙන්; තමකුලදෙවිය, තමාගේ කුලදෙවතාවා; සිහිකොට, ස්මරණය කොට; හෙවත් තුනුරුවන් සිහිකොට; යහළුව, මිත්‍රය; තොපට, භවත්හට; මෙපුරෙන්, මේ පුරයෙන්; ගමන් යෙදේ, ගමනාරම්භය යුක්තවන්නේයි.

මේ කවියෙහි අස්විදනැකත මුදුන්වූ කල්හි කර්කටකලග්නය සම්භව වීමද ඒ ලග්නයෙහි සිටි බෘහස්පතිහු උච්චක්ෂෙත්‍රගතව රශ්මිසහිතව බලවත්බව දැක්වීමෙන් "ලග්නස්ථඃ සර්වදොෂඝ්නඃ" යන නිර්දෙශයාව යෙන් යෙදීමද,

"සන්ධ්‍යාකාලමතික්‍රම්‍ය කිඤ්චිද්දෘශ්‍යන්ති තාරකාඃ
යොගො'යං විජයො නාම සර්වකර්මසු පූජිතඃ"

යන විජයයොගය යෙදීමද "අශ්විනී ගමනෙ ශ්‍රෙෂ්ඨා" යන නක්ෂත්‍ර යොගයද දැක්වූහු.

ඉක්බිති සුබනිමිති දක්වන්නාහු "නල මුදු සුවද" යනාදි කීහු.

---

(සොරුන්) කිසිකලෙකත් ලංනොවන්නාවූ සියගණින් ඊශ්වරයන් (ප්‍රභූජනයන්) හා සියගණින් ධනපතින් (ධනවතුන්) ඇත්තාවූ නිකෙලෙස් තන්හි (කෙලෙසයෙන් පිටත හෝ පීඩාරහිත ස්ථානයෙහි) පවත්නාවූ (මෙකී උදාර ගුණ කරණකොට ගෙන) විජෘම්භණය කරන්නාවූ මේ (ජයවර්ධන) පුරයතෙම උතුරුදික්හිමි වෙසවුණුදෙව්රජහුගේ (අලකා) පුරය පැරදවී.

15 යහළුව බෘහස්පති තාරකාව හාත්පසින් ආලොක කොට උදාවූ කල්හි අස්විද නැකතේ සිට සඳ මුදුන්පත්කල්හි සතුටුසිතින් තමාගේ කුලදෙවිහු සිහිකර යුෂ්මත්හට මෙනුවරින් (නික්ම) යාම යොග්‍ය වේ.

16 නල මුදු සුවඳ පිරිකුඹු මිසුරු අඹගෙ ඩි
පු ල හෙළකුසුම ලිය පියතෙපල රන්කෙ ඩි
ස ල සුදුසෙමෙර සේසත් ගිජිඳුනොද වැ ඩි
බ ල සුබනිමිති පෙරමඟ නැකතටත් වැ ඩි

16 සුවඳ, සුගන්ධයෙන් යුක්තවූ; මුදු, මොළොක්වූ; නල, (අනුකූල) මාරුතයද; පිරිකුඹු, පූර්ණකුම්භයන්ද; මිසුරු, මධුරයන්ද; නොහොත්-මියුරු, මධුරවූ; අඹගෙඩි, අඹඵලද; පුල, ප්‍රඵුල්ලවූ; හෙළකුසුම, (ජාතිමාලතාදී) ශ්වෙතපුෂ්පයන්ද; පියතෙපල, ප්‍රියවචන කියන්නාවූ; ලිය, ස්ත්‍රීන්ද; රන්කෙඩි, (ජලභරිතවූ) සුවර්ණභිඞ්කාරද; සල, විජ්‍යමානවූ හෙවත් සලනුලබන්නාවූ; සුදුසෙමෙර, ශ්වෙතචාමරද; සේසත්, ශ්වෙතච්ඡත්‍රයන්ද; ඔදවැඩි, ඔජසින් අධිකවූ; ගිජිඳුන්, හස්තීන්ද (යන); පෙරමඟ, ප්‍රතිපථයෙහි; නැකතටත් වැඩි, නක්ෂත්‍රයොගයටත් වඩා (විශිෂ්ට)වූ; සුබනිමිති, ශුභනිමිත්තයන්; බල, නිරීක්ෂණය කර.

“බලසුබනිමිති පෙරමඟ නැකතටත් වැඩි” යනුයෙන් “නක්ෂත්‍රාවජ්ජිකුනං වරම්” යන ඍෂිවාක්‍යය දැක්වූහු.

ඉක්බිති ශ්‍රීදන්තධාතූන්වහන්සේට නමස්කාර දක්වන්නාහු “ලොවැ විහිදූ” යනාදි කීහු.

17 ලොවැ විහි දූ සුදුපැහැ සඳරැසෙව් සැ දී
දෙන නොමඳූ සිරිසඟ මොක්සැප නිසැ දී
ල ද මු නි ඳූ දම්කඳ පහස මනබැ දී
ව ඩු ද ළු ඳූ හිමි තෙමහල් පහය රැ දී

17 සඳරැසෙව්, චන්ද්‍රරශ්මියක්මෙන්; සැදි, සජ්ජිතවූ; සුදුපැහැ, අවදාතරශ්මීන්; ලොවැ, ලොකයෙහි; විහිදූ, ව්‍යාපතකොට; නිසැදි, නිරන්තරයෙන්; නොමඳූ, අනල්පවූ; සඟසිරි, ස්වර්ගලොකයෙහි ඓශ්වර්යයද; මොක්සැප, මොක්ෂසෞඛ්‍යයද; දෙන, දානය කරන්නාවූ; මුනිඳු,

---

16 සුවඳ මඳ පවනද පුන්කලස්ද මොන්රුන් හෝ මධුර රසවත් අඹපලද පිපියාවූ (දෑසමන් බොලිද්ද ආදී) සුදුමල්ද ප්‍රිය තෙපුල් කියන කාන්තාවන්ද (දියපිරූ) රන්කෙණ්ඩිද සලන සුදු චාමරද සෙසත්ද බඳ වැඩිසිරි ඇතුන්දැයි පෙරමඟ (සම්මුඛවන්නාවූ) උතුම්වූ ශුභ නිමිත්තයන් බලව.

17 සඳරැස් මෙන් සැදුණාවූ සුදු (බුදු) රැස් ලොකයෙහි විහිදුවා නිතර බොහෝවූ දිවසිරි හා නිවන්සැප දෙන්නාවූ බුදුරජාණන්වහන් සේගේ සිත්හි බැඳුණාවූ ධම්මස්කන්ධයන්ගේ ස්පර්ශය ලැබූ තුන්මහල් ප්‍රාසාදයෙහි රජිතවූ දංෂ්ට්‍රාධාතූන්වහන්සේට වන්දනා කර.

මුනීන්ද්‍රයාණන්වහන්සේගේ; මනබැඳි, මනොබද්ධවූ; දම්කඳ, සුවිශුද්ධහසක් ධම්මස්කන්ධයාගේ; පහස ලද, ස්පර්ශ ලද්දාවූ; තෙමහල්පහය රැඳි, ත්‍රෛභූමක ප්‍රාසාදයෙහි පිහිටියාවූ; දළදාහිමි, ශ්‍රීදන්තධාතුස්වාමීන්වහන්සේට; වඳු, නමස්කාර කර.

ඉක්බිත්තෙන් රාජගෘහප්‍රවේශයට හා රාජදර්ශනාදියට නියොග කරන්නාහු "ගනරන්කොතින්" යනාදි කීහු.

18 ගන රන් කොතින් දිලිහෙන මිණිරුස් විහි ද
පව නින් ලෙලෙන පලඅග මුතුලැල් සිනි ද
සඳකැන් මිණෙ න් බඳ යුතු බිතුපෙළින් රු ද
එතනින් ගො සින් සැණෙකින් රජවිමන් ව ද

18 විහිදූ, ව්‍යාප්තකරනලද; මිණිරුස්, මාණික්‍යරශ්මි ඇත්තාවූ; ගන රන් කොතින්, ඝනකනකශෘඞ්ගයෙන්; දිලිහෙන, දීප්‍යමානවූ; පලඅග, ඡදනාග්‍රයෙහි; පව්නින් ලෙලෙන, මාරුතයෙන් චඤ්චලවන්නාවූ; සිනිඳු, සනිග්ධවූ; මුතුලැල්, මුක්තාලතිකා ඇත්තාවූ; සඳකැන්මිණෙන්, චන්ද්‍රකාන්ත පාෂාණයෙන්; බඳ, බඳනාලද්දාවූ; රුදු, මහත්වූ; බිතුපෙළින් යුතු, භිත්ති පඞ්ක්තියෙන් යුක්තවූ; රජවිමන්, රාජවිමානයට; එතනින් ගොසින්, ඒ ධාතුමන්දිරයෙන් ගොස්; සැණෙකින්, ක්ෂණයෙකින්; වදු, ප්‍රවෙශ වව.

19 රි වි බි ම් බා සුරු රිවිකුලකමලක ර
පි යු ම ම් බා නිතොරව රැඳි උරමැදු ර
මෙ න ර ම් බා හිමිරූසිරිනි පැහැස ර
පැ ර කු ම් බා නරනිඳුසඳ දකු මිතු ර

19 රිවිකුල, සූර්‍ය්‍යවංශ නමැති; කමලකර, පද්මාකරය(ප්‍ර බො ධකිරීමට); රිවිබිම්බායුරු, සූර්‍ය්‍යමණ්ඩලය හා සමානවූ; නිතොරව, නිරන්තරව; පියුම්බා, ශ්‍රීකාන්තාවවිසින්; රැඳි, වාසයකළාවූ; උරමැඳුර, උරඃස්ථල නමැති මන්දිරයක් ඇත්තාවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; රූසිරිනි, රූපශ්‍රිය කරණ

---

18 විහිදෙන මාණික්‍යරශ්මිඇති ඝනවූ රන්කොතින් දිලියෙන්නාවූ සෙවෙනිකෙළවරෙහි සුළඟින් චඤ්චලවන සිනිඳුමුතුලැල් ඇත්තාවූ චන්ද්‍රකාන්ත නම් පාෂාණයෙන් බඳනාලද මහත් භිත්තිපෙළින් යුක්තවූ රාජමන්දිරයට ඒ දළදාපායෙන් ( නික්ම ) ගොස් ඇසිල්ලකින් වදුව.

19 සූර්‍ය්‍යවංශ නමැති හෙවත් මහාසම්මතරාජවංශ නමැති පියුම්විල ප්‍රබොධකිරීමට රිවිමඬල වැනිවූ නිරතුරුව ශ්‍රීකාන්තාව ඇසුරුකළාවූ වක්ෂඃස්ථලනමැති මන්දිරයක් ඇති මනොඥරූපශ්‍රියෙන් රම්භානම් දෙවඟනගේ හිමිහු හෙවත් කුවෙරපුත්‍ර 'නලකූබර' නම් දෙවිහු වැනිවූ පරාක්‍රමබාහුනරෙන්ද්‍රොත්තමයා මිත්‍රය දැකගන්න.

කොට ගෙන; රම්බා හිමිමෙන, රම්භාවට වල්ලභවූ නලකූබරයා හා සමානවූ; පැරකුම්බා නරයිඳුසඳ, ශ්‍රීපරාක්‍රමබාහු මහාරාජෝත්තමයාණන්; මිතුර, මිත්‍රය; දකු, නිරීක්ෂණය කර.

20 උ නු නොව බරණ සිව්සැට වොටුනුත් පැල ඳ
වෙ නු මෙන් පසක් උන් සඳ සිහසුන්මැ ද
ම නු රජකුලෙන් පැවතෙන පිළිවෙළ නොසි ඳ
ග නු අවසර එනරනිඳු සිරිපතුල් වැ ඳ

20 වොටුනුත්, කිරීටසහිතවූ නොහොත් වොටුන්න ඇතුළුවූ; සිව්සැට බරණ, චතුෂ්ෂෂ්ටි ආභරණයන්; උනුනොව, අඩුවක් නැතිව; පැලඳ, ප්‍රසාධනය කොට (ඒ නරේන්ද්‍රයා); පසක්වෙනුමෙන්, ප්‍රත්‍යක්ෂ විෂ්ණුහු මෙන්; සිහසුන්මැද, සිංහාසනමධ්‍යයෙහි; උන්සඳ, නිෂණ්ණකාලයෙහි; මනුරජකුලෙන්, මහාසම්මතරජහුගේ වංශයෙන්; පිළිවෙළ නොසිඳ, සන්තතිවිච්ඡේදයට නොපැමිණ; පැවතෙන, ප්‍රවෘත්තව එන්නාවූ; එනරනිඳු, ඒ (පරාක්‍රමබාහු) නරේන්ද්‍රයාගේ; සිරිපතුල්වැඳ, ශ්‍රීපාදයට නමස්කාර කොට; අවසර ගනු, අනුඥාග්‍රහණය කර.

මෙසේ කවිහු පළමුවෙන් තමන් වාසය කරන්නාවූ පුරය වර්ණනා කොට එනුවර්න් දූතයා නික්මෙන නක්‍ෂත්‍රමුහුර්තාදිය නියම කොට ඉක්බිති ශ්‍රීදන්තධාතූන්වහන්සේට නමස්කාර දක්වා රජගෙට ගොස් මහරජ්ජුරුවන්ගෙන් අවසර ගෙන යන්ට නියොග කොට එතැන්පටන් මාර්ගවර්ණනා කරන්නාහු "පෙරව සඳ කිරණ" යනාදි කීහු.

21 පෙර ව සඳකිරණ පිපිකුමුදු මල්ව පි න්
ප ර ව තඹරපෙතිගිලි දියතලාපි පි න්
ත ර ව සිහිඇතිව පරතෙරට යන අ පි න්
ක ර ව පියාසර සකි කොන්තගම්තො පි න්

21 සඳකිරණ, චන්ද්‍රකිරණයෙන්; පෙරව, ප්‍රාවෘතව; වපින්, හාත් පසින්; පිපි, ප්‍රබුඩවූ; කුමුදුමල්, කෛරව පුෂ්පයන් ඇත්තාවූ; පරව, පරිණතභාවයට පැමිණ; ගිලි, ගලිතවූ; තඹරපෙති, තාමරසපත්‍රයන්

20 වොටුන්න හා සමහ චතුෂ්ෂෂ්ටි ආභරණයන් අඩුනොව පැලඳ ඇසට පැනෙමින් සිටි විෂ්ණුදිව්‍යරාජයා මෙන් සිංහාසනමධ්‍යයෙහි (රජු) වැඩහුන්කල්හි මහාසම්මතවංශයෙන් පිළිවෙළ නොකඩව පැවතඑන්නාවූ ඒ පරාක්‍රමබාහුමහරජාණන්ගේ ශ්‍රීපාදතලයන් වන්දනය කොට (තාගේ ගමන සඳහා) අවසර ගන්න.

21 චන්ද්‍රකාන්තීන් පෙරවගෙන හාත්පසින් පිපියාවූ හෙළමහනෙල් මල්ඇති පරව වැටුණු නෙළුම්පෙතිඇති ජලයාගේ මතුභාගය ඇත්තාවූ 'කොන්තගම'නම් ග්‍රාමයෙහිවූ නොවුපළින් එගොඩට යනුකැමැත්තෙන් මිත්‍රය සම්රව සිහිඇතිව පියාසර කරව.

ඇත්තාවූ; දියනලාපිරින්, ජලතල මතුභාගයෙන් (උපලක්ෂිතවූ); කොන්ත ගම්තොටින්, කොන්තගම්තොට යන නදීප්‍රදේශයෙන්; පරතෙරට, පර තීරයට; යනඅරින්, ගමනෞචිත්‍යයෙන්; තරව, ස්ථිරීභූතව; සිහිඇතිව, ස්මෘතිමත්ව; සකි, සඛීහෘදය; පියාසර කරව, (ආකාශමාර්ගයෙන්) පක්ෂප්‍රසාරණය කරව..

22 කළුවැල් කපුරුදුම්තුළ ලෙලෙන දදපෙළ
සුවිසල් මිහිඟුසක්සන් මිණිහඬපතළ
කැරැලොල් සතන් පවසන තියුහිදෙමළ
මනකල් ඉසුරුකෝවිලැ ලගිනේ ලකළ

22 කළුවැල්කපුරුදුම්, කාලාගුරුකර්පූරධූමයන්විසින්; අතුල, ආස්තරණය කරනලද්දාවූ; නොහොත් – කළුවැල්කපුරුදුම්, කාලාගුරු කර්පූරධූමයන්ගේ; ඇතුළ, අභ්‍යන්තරයෙහි; ලෙලෙන, චචලවන්නාවූ; දදපෙළ, ධ්වජාවලී ඇත්තාවූ; සුවිසල්, අත්‍යන්තයෙන් විශාලවූ; මිහිඟු සක්සන්, මෘදඞ්ගනාදශඞ්ඛනාදයන් හා; මිණිහඬ, ඝණ්ටාරාවයෙන්; පතළ, ව්‍යාපතවූ; ලොල් කැරැ, (මහදෙවියාගේ ගුණයෙහි) ලොභය කොට පවසන, (අෂ්ටාදශරාගයෙන්) කථනය කරනුලබන්නාවූ: දෙමළ තියුති, ද්‍රවිඩභාෂායෙන් කරනලද ස්තුති ගීතිකාවන් ඇති; සතන්, (ශෛවසමයෙහි දීක්ෂිතවූ සත්වයන් (ඇත්තාවූ); ලකළ, අලඞ්කෘතවූ; මන කල්, මනොඥවූ; ඉසුරුකෝවිලැ, ශිවදෙවාලයෙහි; (සකි යනු යටින් වැටේ) සකි, සඛිය; ලගිනේ, නිවාසග්‍රහණය කරන්නේයි.

23 වෙස හන තුහු තනයුග රොන් කොකුමහර
පිස එත මඳපවන් හැඳූ විල්ලිහිණිසර
ගොස අලුයම් පසතුරු සවනතෙහි කර
ඇස නිදිගැට හැරැ නැඟිසිටු උදුහිර

23 වෙසහන, (සමීපවර්තීවූ පුරවාසී) වෛශ්‍යාවන්ගේ; තුහු, (ගජ කුම්භාකාරයෙන්) උන්නතවූ; තනයුග, පයොධරයුග්මයෙහි; කොකුමහර රොන්, කුඞ්කුමාඞ්ගරාගරේණූන්; පිස, සම්මාර්ජනය කොට; විල්

---

22 කළුඅගිල්දුමින් හා කපුරුදුමින් අතුරනලද හෝ ඒ දුම් ඇතුළෙහි ලෙළදෙන ධ්වජපඞ්ක්ති ඇති ඉතා මහත් මිහිඟුබෙරහඬින් හා සක්හඬින්ද මිණිහඬින්ද පතළාවූ (මහෙශ්වරයාගේ) ගුණයෙහි ලොල් කොට (අෂ්ටාදශරාගයෙන් හෙවත් අටළොස් වැදෑරුම් ගීතස්වරයෙන්) කියන දෙමළ ස්තුතිගීතිකා ඇති ශිවාගමෙහි නියම (ව්‍රත) සමාදන්වූ ජනයන්ගෙන් යුක්තවූ සරසනලද සිත්කලුවූ ඊශ්වරදෙවාලයෙහි (මිත්‍රය) ලැගුම් ගන්න.

23 ගණිකාවන්ගේ උස්වූ පියවුරුයුවළයන්හි (තැවරූ) කුඞ්කුම විලෙපනයන් පිසගෙන විල්ලිහිණිපක්ෂීන්ගේ නාදය ඇදගෙන මඳ

ලිහිණි සර, සාරසපක්ෂීන්ගෙ නාදය; හැඳ, අකාර්ණය කොට; මඳපවන් එක; මන්දමාරුතය හමනකාලයෙහි; අලුයම්පසතුරු, ප්‍රත්‍යූෂකාලයෙහි පවත්නා පචාඩ්ගික තූර්‍ය්‍යයන්ගේ; ගොස, ඝොෂය; සවනතෙහි සර, ශ්‍රවණයෙහි පමුණුවා අසා; උදුහිර, සූර්‍ය්‍යොදයකාලයෙහි; ඇස, ඇක්ෂියෙහි; නිදිගැට හැර, නිද්‍රාග්‍රන්ථිමොචනය කොට; (සති, යහළුව;), නැඟිසිටු, (නා රාත්‍රියෙහි ශයනය කළාවූ ස්ථානයෙන්) උත්ථානය කර.

24 උ දු ගිරිකසුන් රිවිවැටහිස බැබ ළි
එ දු සහසකර පහනෙව් කරතහෙ ළි
යොදු නුවන් ඉසුරුට කරනපුදකෙ ළි
වි දු පියා නිලඹර යත් නොවී මැ ළි

24 උදුගිරි, උදයපර්වත (ශිඛර) නමැති, කසුන්රිවිවැටහිස, කාඤ්චනදීප යෂ්ටිමස්තකයෙහි; බැබළි, භ්‍රාජිතවූ; පහනෙව්, ප්‍රදීපයක්මෙන්; සහස කර, ආදිත්‍යයා; එදු, ඒද්දිනයෙහි; හෙළිකරත, පහන්කරනකල්හි; ඉසුරුට කරන පුදකෙළි, ඊශ්වරයාහට කරන්නාවූ පූජොත්සවය; නුවන්, නෙත්‍රයෙහි; යොදු, යොජිතකොට; මැළිනොවී, (ශීතාදිකාරණයෙකින්) ආලස්‍යයකට නොපැමිණ; පියා විදු, පක්ෂප්‍රසාරණය කොට; නිලඹර, නීලවර්ණවූ ආකාශයට; යත්, ප්‍රයාණය කරන්.

25 සු ර ර දු සමන් සමඟින් සුරඟන එව ර
පැහැ නඳ මඳුරා පරසතු මල්පත ර
ක ර පු දු වඩින රැදි මුනිසිරිපාතඹ ර
ස කි ස ඳ පෙනේ සමනලගල නැඟෙනහි ර

25 සකිසඳ, මිත්‍රොත්තමය; එවර, (තොප ආකාශයට නැංගාවූ) ඒ කාලයෙහි; සුරඟන සමඟින්, දිව්‍යාඞ්ගනාවන් හා එක්ව; සමන්සුර රදු, සුමනදිව්‍යරාජයාවිසින්; පැහැනඳ, ප්‍රභායෙන් ආර්ද්‍රවූ හෙවත් කාන්තියෙන් තෙමීගියාක් වැනිවූ; මඳුරාපරසතුමල්පතර, මන්දාරපාරිජාත

---

පවන් හමනකල්හි අලුයම්හිවූ පචාඞ්ගතූර්‍ය්‍යනාදය කන්හි පමුණුවා හෙවත් අසාගෙන ඉර උදුවනකල්හි ඇසෙහි නිදිගැට (නින්දෙන්වූ ඇසි පියබැඳුම්) මුදා යහළුව තෝ නැඟී සිටුව.

24 උදයපර්වත (මස්තක) නමැති රන්පහන්කඳමුදුනෙහි බැබළුණුවූ පහනක් මෙන් සූර්‍ය්‍යයා එදවස ආලොක කරනකල්හි ඊශ්වරයා පිණිස කරනුලබන පූජොත්සවය නෙත්‍රයෙහි යොදා හෙවත් ඇසින් දක නොමැළිව පියාසර කොට අහසට නැඟෙව.

25 උතුම්වූ මිත්‍රය ඒ තොප අහසට නැඟිකල්හි දෙවඟනන් හා සමඟ සමන්දෙව්රජහුවිසින් කාන්තියෙන් තෙත්වූ මඳුරා පරසතුමල්

කුසුමසමූහය; පුදකර, පූජාකොට; වඳින, නමස්කාර කරනුලබන්නාවූ; මුනි, සර්වඥයන්වහන්සේගේ; සිරිපාතඹර, ශ්‍රීපාදපද්මය; රැඳි, පිහිටියාවූ; සමනළගල, සමන්තකූටපර්වතය; නැඟෙනහිර, පූර්වදිග්භාගයෙහි; පෙනේ, දෘශ්‍යමාන වේ.

26 ග තේ මිණිබැබළි කිරණෙවි සත පා ය
ර ණේ සටග සැවුලිඳුදද ගල පා ය
අ නේ ලකර කළ පුර අප නර පා ය
පෙ නේ දකුණු මහසෙන් දෙව්රද පා ය

26 අප නරපාය පුර, අපගේ නරොත්තමයාගේ පුරයෙහි; සතපාය, ශ්‍රුතරශ්මිහුගේ හෙවත් ආදිත්‍යයාගේ; කිරණෙවි,රශ්මිකදම්බයන් වැනිවූ; ගතේ, ඝනවූ; මිණි, මාණික්‍යයෙන්; බැබළි, භ්‍රාජිතවූ; රණේසටග, සවර්ණඝණ්ටාග්‍රයෙහි; සැවුලිඳුදද, කුක්කුටෙන්ද්‍රධ්වජයන්; ගලපාය, ඝටනා කොට; අනේලකර කළ, අනෙකාලඞ්කාරයෙන්(අලඞ්කෘත)කරනලද්දාවූ; මහසෙන්දෙව්රදපාය, ෂණ්මුඛදෙවරාජයාගේ ප්‍රාසාදය; දකුණු, දක්ෂිණ දිශාභාගයෙහි; පෙනේ, දෘශ්‍යමාන වේ.

27 ව ල දින.අදහසින්මෙන් සුරගඟ අහ න
න ල බල සසල දලරලපෙල නුබනැඟෙ න
වෙ ල ලසැ ගැවසි මුතුසක්පබළු බබල න
බ ල මහමුහුද එමසඳ උතුරෙන් පෙනෙ න

27 සුරගඟ අහන, ආකාශගඞ්ගා නමැති අඞ්ගනාව; වලඳින අදහසින් මෙන්, ආලිඞ්ගනය කරන අභිලාෂයෙන් මෙන්; නුබනැඟෙන, ගගනොල්ලඞ්ඝනය කරන්නාවූ; නලබල, මාරුතශක්තියෙන් හෙවත් වාත වෙගයෙන්; සසල, චඤ්චලවන්නාවූ; දලරලපෙළ, මහත්වූ තරඞ්ගපඞ්ක්ති යෙන් යුක්තවූ; වෙලලසැ, වෙලාතටයෙහි; ගැවසි, සඤ්ජනිතවූ; මුතුසක්

---

රැසින් පුදකොට වඳනාලබන්නාවූ මුනින්‍ද්‍රයන්වහන්සේගේ ශ්‍රීපාදපද්මය පිහිටි සමන්තකූටපර්වතය (කට) නැඟෙනහිරදික්හි පෙනේ.

26 අප මහරජාණන්ගේ නුවරෙහි සූර්යයාගේ රශ්මිසමූහයන් බඳු ඝනවූ මාණික්‍යසමූහයෙන් බැබළුණුවූ රන්සටකෙළවරෙහි (රනින් කරනලද ධ්වජදණ්ඩයන්ගේ මුදුන්හි)මහත් කුකුළුරුවින් යුත් ධ්වජයන් බැඳ නොයෙක් අලඞ්කාරයෙන් සරසනලද මහාසෙනදිව්‍යරාජප්‍රාසාදය (ෂණ්මුඛදෙවාලය) දකුණුදිශායෙහි පැනේ.

27 අහස්ගඟ නමැති කාන්තාව වැලඳගන්නා කැමැත්තෙන් මෙන් අහසට නැඟෙන්නාවූ සුළංවෙගයෙන් චඤ්චලවන්නාවූ මහත් රළපෙළින් යුක්තවූ වෙරළලඟ ගැවසුණු මුතු සක් පබළුමිණි යන මෙයින් බබලන්නාවූ එවිට උතුරෙන් පෙනෙන්නාවූ මහාසමුද්‍රය (මිත්‍රය) බලව.

පබළු, මුක්තාශඛප්‍රවාලයෙන්; බබලන, භ්‍රාජමානවූ; එමසඳ, එම ක්ෂණයෙහි; උතුරෙන්, උත්තරදිශාභාගයෙන්; පෙනෙන, දෘශ්‍යමානවූ; මහ මුහුද, මහාසමුද්‍රය; බල, නිරීක්ෂණය කර.

28 සන් නන් සිහින්ගෙදි සෙවණළු වැලිතෙලෙ න
තැන් තැන් වලම සැතපී සියුමැලි බැවි න
රන් වන් කරල්ගෙන එන ගිරවුන් අහි න
යන් මන් තොසින් මහතොරතුරු නියම දැ න

28 (සකිසඳ යනු පදින් වැටේ)සකිසඳ, සඛීන්ද්‍රය; නන්සිහින්ගෙදි, නොයෙක් සිහින්කෙන්ද වෘක්ෂයන්ගේ; සෙවණළු, ඡායාමණ්ඩලාක්‍රාන්තවූ; වැලිතෙලෙන,(ධවල) පුලිනතලයෙන්; සන්, ගැවසිගත්තාවූ; තැන් තැන් වලම, ඒ ඒ ස්ථානයන්හිම; සියුමැලිබැවින, සුකුමාරභාවයෙන් යුක්තවූ හෙයින්; සැතපී, විශ්‍රාමයට පැමිණ; රන්වන්කරල් ගෙන, (කල්‍යාණිපුර සමීප ශාලික්ෂෙත්‍රවලින්) පිඤ්ජරවර්ණවූ (පරිණත) සස්‍යමඤ්ජරීන් ග්‍රහණය කොට; එන, අභිමුඛව එන්නාවූ; ගිරවුන් අහින, කීරපක්ෂීන්කෙරෙන්; මහ, (යන්නාවූ)මාර්ගයාගේ; තොරතුරු, විශෙෂවිභාගයෙහි; නියම දැන, නිශ්චය පරිඥානය කොට; මන්තොසින්, චිත්තසන්තොෂයෙන්; යන්, ප්‍රයාණය කර.

මේ සන්දෙශය කියන අවධියට "සෙම්බගප්පෙරුමාල්" නම්වූ සෙනානායක රාජකුමාරයන් යුධයට ගොස් කර්ණාටකසේනාව පරදවා යාපාපටුන්නුවර ගෙන දෙවනු මහරජ්ජුරුවන් දකින්ට එනවුන් කයිකාවලින් මෙපිට පැමිණිහෙයින් ආගන්තුකවිඝ්නයක් දක්වන්නාහු "නිලතුරඟුට නැගෙමින්" යනාදි කීහු.

29 නිල තුරඟුට නැගෙමින් රිවිදෙව්සිරි න
දුල කැරැ සේසත් මිණිබරණ කිරණි න
බල පිරිසෙන් සහ යාපාපටුන් ගෙ න
බල සේනානායක සපුකුමරු එ න

29 රිවිදෙව්සිරින, සූර්‍ය්‍යදෙව පුත්‍රයා හා සමානවූ ශොභායෙන් යුක්තව; නිලතුරඟුට නැගෙමින්, හරිතවර්ණවූ නෙවත් පලාවන්වූ අශ්වවාහනයකට අරූඪව; මිණිබරණකිරණින, රත්නාභරණකාන්තියෙන්; සේසත්,

---

28 (විග්‍රහය) නොයෙක් සිහින්කෙන්ද වෘක්ෂයන්ගේ සෙවණින් ආකුලවූ (සුදු) වැලිතලායෙන් ගැවසිගත්තාවූ ඒ ඒ තැන්වලම (තා) ඉතා සුවසේ වැඩුණුකුබැවින් සැතපී (විඩාහැර) (කැලණිපුරයට නුදුරු ඇල්කෙත්වලින්) රන්වන් හැල් කරල් ගෙන එන්නාවූ ගිරවුන් අතින් මාර්ගවිස්තරය නියතයෙන් දැනගෙන සිතසතුටින් යන්න.

29 සූර්‍ය්‍යදිව්‍යරාජයා හා සමානවූ ආලොකයෙන් යුක්තව නිල්වන් අශ්වයකුපිට නැගී මැණික්පලඳනාවන්ගේකාන්තියෙන්(තමන් මත්තෙහි අල්වනලද) සේසත දිලුම් කොට බලවත් (චතුරඞ්ග) සෙනාව හා සමඟ

ශෞවනවජ්‍රය; දුලකැරැ, ජ්වලිත කොට; බලපිරිසෙන් සහ, බලවත්වූ සෙනාව හා එක්ව; යාපාපටුන්ගෙන, යාපාපට්ටන නම් පුරය තමා වශග කොටගෙන; එන, (අභිමුඛව) එන්නාවූ; සේනානායක, චමූපති ස්ථානාන්තරයට පැමිණියාවූ;සපුකුමරු, (උලකුඩය දෙවින්ගේ ජ්‍යෙෂ්ඨභ්‍රාතෘවූ) චම්පකාභිධාන රාජකුමාරයා; බල, අවලෝකනය කර.

30 අ ග පිපිමල් මලිගියලිය කැ ලේ යා
ව ගි බැඳහෙන රජහසපුල් වි ලේ යා
ල හ තුරු මල් ගිලිහුණු රොනවූ ලේ යා
ම ග බැස යව පළ හෙළ වැලිතෙ ලේ යා

30 අග, ලතාග්‍රයෙහි; පිපිමල්, පුෂ්පිත පුෂ්පයන් ඇත්තාවූ; මලිගියලියකැලේයා, මාලතීලතාප්‍රධානයෙන් යුක්තවූ; වග බැඳ, වර්ග බන්ධනය කොට; හෙන, (පෙළසැදී)පතනය වන්නාවූ; රජහස, ("රාජහංසාස්තු තෙ චඤ්චුචරණෛර්ලොහිතෛස්සිතාඃ" යනු හෙයින් රත්වූ තුඩු හා පාඇති සර්වාඞ්ගධවලවූ) රාජහංසයන් ඇත්තාවූ; පුල්විලේයා, ප්‍රබුද්ධ පද්මාකරයන් ඇත්තාවූ; ළඟ, මාර්ගසමීපයෙහි සිටියාවූ; තුරු, වෘක්ෂයන්ගේ; මල්ගිලිහුණු, පුෂ්පයෙන් ගලිතවූ; රොනවුලේයා, මකරන්ද කිණ්ණිවූ; (රේණුවෙන් ගැවසීගත්තාවූ); පළ, ව්‍යක්තවූ; හෙළ, ධවලවූ; වැලිතෙලේයා, පුලිනතල ඇත්තාවූ; මඟ බැස, මාර්ගයට අවතීර්ණවැ; යව, ගමනය කර.

31 අ යි රාවණ වුවත් නවතන රිසින් එ න
අ යි රාදහස් දිලි දුනුකොත් සිපත් ගෙ න
ක යි කාවලෙහි දක සෙබළුන් රැක සිටි න
ච යි යා කරත් මල් තුරුගත චනහිසි න

31 එන, (විපක්ෂභාවයෙන් අභිමුඛව) එන්නාවූ; අයිරාවණ වුවත්, ඓරාවණ හස්තිරාජයා වීනමුත්; නවතනරිසින්, නිවාරණය කරන්නාවූ රුචියෙන්; අයිරාදහස්, සහස්‍රයෙන් අධිකවූ;දිලිදුනුකොත්සිපත්, ජ්වලිතවූ

---

(පෙර ශත්‍රුකලඞ්කයෙන් යුක්තව තුබූ) යාපාපට්ටන නම් නගරය තමා වශයට ගෙන (තට ඉදිරි මාර්ගයෙහි පියඹහරජහු දක්නාපිණිස ජයවර්ධනපුරය බලා) එන්නාවූ සෙනාධිපති 'සෙම්බගප්පෙරුමාල්' නම්වූ හෙවත් චම්පකාභිධානවූ රාජකුමාරයාණන් දැකගනුව.

30 මුදුනෙහි පිපුණුමල්ඇති දෑසමන්වැල්සමූහ ඇත්තාවූ රළ බැඳ අවුත් පතිතවන රාජහංසයන් ඇති පිපුණු නෙළුම්විල් ඇත්තාවූ ළඟතිබෙන වෘක්ෂයන්ගේ මලින් වැටුණු රොනින් ආකූලවූ, ප්‍රකාශව පැනෙන සුදුවැලිතලා ඇති, මාර්ගයට; බැස යව.

31 (සතුරුව ඉදිරියට) එන ඓරාවණහස්තිරාජයා වීනමුත් ආපසු යවනුකැමැත්තෙන් දහස්ගණනින් වැඩි දිලිසෙන දුනු කුන්ත කඩුපත්

චාපකුසුමබාණගපත්‍රයන්; ගෙන, ග්‍රහණය කොට; කයිකාවලෙහි, කයිකා-වලනම්වූ රක්‍ෂාස්ථානයෙහි හෙවත් කඩවතෙහි; රැකසිටින, රක්‍ෂා-කොට සිටිනාවූ; සෙබළුන්, සුභටයන්; දක, දර්‍ශනය කොට; මල්තුරු ගත, පුෂ්පවෘක්‍ෂයෙන් සාන්‍ද්‍රවූ; වනකිසින; වනමස්තකාකාශයෙන්; වයි, ශීඝ්‍රව; යා කරන්, යාත්‍රා කර.

32 නිම ල් සඳපහන් වැනි වැලිපිට උදු ල
සුපු ල් මල්යහන් ලියමඬු ලියගෙපෙ ල
එක ල් කෙළන වනදෙව්ලිය දක කොම ල
ළස ල් රුකෙක සැතපෙව ළපලුසිහිල ල

32 නිමල්, (මෙඝාපගමයෙන්) නිර්‍මලවූ; සඳපහන්වැනි, චන්‍ද්‍රකාන්තිය හා සමානවූ; උදුල, උජ්ජ්වලිතවූ; වැලිපිට, වාලුකාස්ථලයෙහි; සුපුල්, සුත්ඵුල්ලවූ; මල්යහන්, පුෂ්පශයනයෙහිද; ලියමඬු, (මාධවිආදි) ලතාමණ්ඩපයෙහිද; ලියගෙපෙළ, ලතාගෘහපඞ්ක්තියෙහිද; කෙළන, ක්‍රීඩා කරන්නාවූ; කොමළ, කොමලවූ; වනදෙව්ලිය, වනදිව්‍යස්ත්‍රීන්; දක, දර්‍ශනය කොට; එකල්, ඒ (දෙවඟනන්ගේ මල්කෙළි දක්නා) කාලයෙහි; ළපලු, තරුණ පල්ලවයෙන්; සිහිලළ, ශීතලභාවය එළවූවාවූ; ළසල් රුකෙකැ, බාල ශාලවෘක්‍ෂයෙක්හි; සැතපෙව, විශ්‍රාමය කර.

33 ම ල් ද ම් සුවඳ දුම්දුන් සොඳ වරල සි නි
ක ල් ගි ම් නිවා සැනහෙන සිහිලසර සි නි
කොල් ල ම් ගසින් නිල් ඉවුරැති පොකුණ සි නි
ව ල් අ ම් බලම දක යාගත් සඟතො සි නි

33 මල්දම්, (මහනෙල් දෑසමන් ආදි) පුෂ්පදාමයන් හා; සුවඳදුම්, (කාලාගුරුධූපාදිවූ) සුගන්‍ධධූපයන්; දුන්, දෙනලද්දවූ; වරලසිනි, කෙශකලාපයෙන්; සොඳ, සුන්‍දරවූ; කල්, කාන්තාවන්විසින්; ගිම් නිවා, ග්‍රීෂ්ම නිර්‍වාපණය කොට; සැනහෙන, සන්‍තානය කරනුලබන්නාවූ; සිහිලසරසිනි,

---

ගෙන කයිකාවල නම් මුරපලෙහි රැක සිටිනාවූ යහපත් යොධභටයන් දක මල්රුකින් ඝනවූ වනමුදුනෙන් යුහුව යව.

32 (වලාකුළුනැත්තෙන්) පිරිසුදුව සඳපහන බඳුව දිලියෙන වැලිතලාමත්තෙහි මනාව පිපියාවූ මල්යහන්හිද (යොහොඹුලියආදි) ලතාමණ්ඩපයන්හිද ලතාවෙන් ගෘහාකාරව සැදුණු ) ලතාගෘහපෙළෙහිද ක්‍රීඩනය කරන මොළොක්වූ වනදෙවඟනන් දක ඒ ඔවුන්ගේ ක්‍රීඩා පවත්නා) කාලයෙහි ළාදළුයෙන් සිහිලස ගෙනදෙන තරුණ සල්ගසක් මුදුනෙහි විඩා හරුව.

33 (මිශ්‍රොත්තමය) මල්මාලා හා සුවඳදුම් ගැන්වූ හිසකේ වැටියෙන් ශොභනවූ අඟනන්විසින් ග්‍රීෂ්මය නිවාහෙන සන්‍තානය කරනුලබන සිහිල්

ශීතලජලයෙන් උපලක්ෂිතවූ; කොල්ලම්ගසින්, තමාලගච්ජයන් කාරණ කොටගෙන; නිල්, නීලවර්ණවූ; ඉවුරැති, (උභය) කූලයන් ඇත්තාවූ; පොකුණසිනි, පුෂ්කරිණීපාශ්වයෙන් යුක්තවූ; ,වල්අම්බලම, එනම් විශ්‍රාමශාලාව; දැක, නිරීක්ෂණය කොට; සහතොසිනි,. සන්තොෂ සහි. තව; යා ගන්, යත්‍රාග්‍රහණය කර. ,

34 කස්තුරිතිලක සැදිනලලත සුම · වා න
පුල්මහනෙල් මල්දම් හිස දව · වා න
සලෙලුන් යනෙන නිති කැරැ කෙළිකව · වා න
රිවිමුදුනත වනමැද වදු සුමු · වා න

34 සුමටාන,සුමෘෂ්ටවූ හෙවත් මනොඥවූ සිලුටු ඇත්තාවූ;කස්තුරිතිලක,. කස්තුරීතිලකයෙන්; සැදි,අලඩකෘතවූ;නලලත, ලලාටඵලක ඇතිව;පුල්, පිපුණුවූ; මහනෙල්මල්දම්, රක්තොත්පලපුෂ්පදාමයන්; හිස, ශීර්ෂයෙහි;. දවටාන, වෙෂ්ටනය කොට; කෙළිකවටාන, ක්‍රීඩාපරිහාසයන්; කැරැ, කොට; නිති, නිරන්තරයෙන්; සලෙලුන්, සංලාලයන්ගේ; යනෙන, ගම නාගමන ඇත්තාවූ; සුමුටාන වනමැද, සුමුටාන නම්වූ වනමධ්‍යයට:. රිවිමුදුනත, මධ්‍යාහ්නකාලයෙහි;.වදු, ප්‍රවිෂ්ට වව.

35 මගනි ල මි න් සිරි නා දෙඹ නී පිය · ල
පිය ස ල මි න් මලගෙඟ සෙළු රොනිතව · ල
තතුඩ ල මි න් බිඳ විලිකුහ් මියුරුප · ල
ඉ සුඹු ල මි න් යෙහි සැල දඹපඳුරුව · ල

35 මග, මාර්ගයෙහි; නිලමින් සිරි, ශ්‍යාමායමානව පෙනෙමින් සිටිනාවූ; නා, නාගවෘක්ෂය; දෙඹ, පුන්නාග වෘක්ෂය; නී, නීපවෘක්ෂය හෙවත් බක්මීවෘක්ෂය; පියල, පියාලවෘක්ෂය හෙවත් මොරවෘක්ෂය යන

---

දිය ඇති, කොල්ලම්ගසින් නිල්වූ ඉවුරු ඇති, පොකුණෙහි; අංශයෙකින් ( උපලක්ෂිතවූ ), වල්අම්බලම නම් ශාලාව; දැක සතුටුසහගතව ගමන් කරව.

34 ඉතා සිලුටු කස්තුරීතිලකයෙන් සැරසූ නළල්තල ඇතිව පිපුණු (.රත් ) මහනෙල්මල්මාලා හිසෙහි දවටාගෙන කෙළිකවටබස් කියමින් නිතර තරුණයන්ගේ යාම් ඊම් ඇත්තාවූ, සුමුටාන නම් අරණ්‍යයාගේ; මධ්‍යයට ඉරමුදුන්වේලෙහි වදුව.

35 ශාරිකාපක්ෂිය, මාගී( සමීප )යෙහි නිල්පැහැය දක්වමින් සිටින නා දෙඹ බක්මී මොර යන වෘක්ෂයන්ගේ රෙණුවෙන් ගැවසීගත් මල්මුදුනෙහි පියාපත් සලමින් ක්‍රීඩා කොට ඉදුණු මිහිරි (දඹ) ගෙඩිවල නාගේ තුඩ ප්‍රවෙශකෙරෙමින් බිඳ ( ඵලරස වළඳා ) දඹ පඳුරුවල විඩා හරිමින් යව.

මේ වෘක්‍ෂයන්ගේ; රොනිනවල, පරාගයෙන් ගැවසී ගත්තාවූ; මල ගෙහි, පුෂ්පාග්‍රයෙහි; පිය සලම්න්, පක්‍ෂ චලනය කෙරෙමින්; කෙළැ, ක්‍රීඩා කොට; විලිකුත් මියුරුපල, පක්වමධුර ඵලයෙහි; කතුඩ ලමින්, තාගේ චඤ්චු ප්‍රක්‍ෂෙප කෙරෙමින්; බිඳ, භෙදනය කොට නො හොත් අනුභව කොට; දඹරදුරුවල, ජම්බුසතම්බ සමූහයෙහි; ඉසුඹු ලමින්, විශ්‍රාමය කෙරෙමින්; සැල, ශාරිකාපක්‍ෂිය; යෙහි, ගමනය කරන්නෙහි.

36 රි වි තැ වු ලේ පිපි කම ලේ විල්ගැව සි
මත කො වු ලේ තුරු වද ලේ හඬන නි සි
වන සැ වු ලේ මඟ අස ලේ පොරසැල සි
ගුරු බැ වු ලේ යව අ වු ලේ නොවී කි සි

36 රවිතැවුලේ, සූර්‍ය්‍යසන්තාපයෙන්; පිපිකමලේ, පුෂ්පිත පද්ම යන් ඇත්තාවූ; විල්, තඩාගයෙන්; ගැවසි, සඤ්ජනනාවූ; නිසි, (සඤ්චාර යට) යොග්‍යවූ; තුරු, (අඹාදි) වෘක්‍ෂයන්ගේ; වදලේ, මුවායෙහි; හඬන, නාද කරන්නාවූ හෙවත් රැව්පිළිරැව් පවත්වන්නාවූ; මතකොවුලේ, මත්තකොකිලයන් ඇත්තාවූ; මඟඅසලේ, මාර්‍ගසන්නායෙහි; පොර සැලසි, යුධප්‍රවෘත්තවූ; වනසැවුලේ, වලිකුලන් ඇත්තාවූ; ගුරුබැවුලේ, ගුරුබැවුල නම්වූ උන්නතභූමිප්‍රදෙශයෙහි; කිසිඅවුලේ නොවී, ස්වල්ප මාත්‍රවූද අකුලයක් (බාධාවක්) නැතිව; යව, ප්‍රයාණය කරව.

37 වනසි රි පියුම්රා බඳ රනබරණයු රැ
වට පි රි සුපුල් දුනුකේ මල්මුරුතතු රෑ
හිඟු පි රි වැරෑ ඔලූපුලැඹුලවල තඹු රැ
හිමස රි සිහිල්දිය හෙබ දූක යන් මිතු රැ

37 වනසිරි, වනලක්ෂ්මියගේ; පියුම්රා බඳ, පද්මරාගමාණික්‍ය යෙන් බඳනාලද්දාවූ; රනබරණයුරු, ස්වර්ණාභරණයට බඳුවූ ආකාර ඇති; මල්මුරුතතුරු, පුෂ්පසහිත අශ්වකර්ණ වෘක්‍ෂයන්ගේ අන්තරයෙහි; සුපුල්දුනුකේ, සුප්පුල්ලවූ රාජකෙතකීවෘක්‍ෂයෙන්; වට, හාත්පස්හි; පිරි,

36 ඉරඅව්ව කරණකොටගෙන පිපුණු නෙළුම් ඇති විලින් ගැව සුණාවූ, හැසිරීමට සුදුසු ( අඹආදි ) රුක්වදලෙහි රාවප්‍රතිරාව නාදයන් පවත්වන මත්කොවුලන් ඇත්තාවූ, මාර්ගය අසල පොරගසමින් සිටින වලිකුළුපක්‍ෂීන් ඇත්තාවූ, ගුරුබැවුල නම් උස්බිම් පෙදෙසෙහි; කිසි අවු ලක් නොව ගමන් කරව.

37 වනශොභා නමැති කාන්තාවගේ රක්තමාණික්‍යයෙන් බැඳි රන්පලඳනාවකට බඳු ආකාරඇති මල්සහිත මුරුතගස් අතරෙහි මනා සේ පිපුණු දුනුකේරුක්වලින් හාත්පස පිරුණාවූ, බමරුන්විසින් පිරි

සම්පූර්ණවූ; බිඟුපිරිවැරූ, භෘඞ්ගයන්විසින් පිරිවරනලද්දාවූ; ඔලු, ශාලූක පුෂ්පය; උපුල්, උත්පලය; ඇඹුල, කෛරවය යන මොයින්; අවල, ගැවසී ගත්තාවූ; තඹුරු, තාමරසයන් ඇත්තාවූ; හිමසරිසිහිල්දිය, හිම (රාශි යක්) මෙන් ශීතලවූ උදකයන් ඇත්තාවූ; හෙබ දක, (මහා) හ්‍රදය දර්ශනය කොට; මිතුරු, මිත්‍රය; යන්, ප්‍රයාණය කරන්.

38 ස ලා දු ලා පියවුරු තඹර රොන් ර   ත
පු ලා නී ලා උපුලන් ලාගන කන   ත
ක ලා පි ලා* නොවැ ඇල්ගෙවි කෙළින ඉ   ත
බ ලා ප ලා යව අස්වන් ගුරුළුකෙ   ත

38 දුලා, උජ්ජ්වලත්වූ; පියවුරු, පයොධරයෙහි; තඹර, තාමරස යන්ගේ; රතරොන්, රක්තරේණූන්; සලා, විකීර්ණ කොට; නිලාඋපු ලන්, නීලොත්පලයන්; පුලා, ප්‍රඵුල්ල කොට හෙවත් පෙති විදා; කනත, කර්ණාන්තයෙහි; ලාගෙන, වින්‍යාස කොටගෙන; කලාපිලා නොවැ, කලහපිලාවක් නොවී; ඉත, අන්‍යොන්‍යමිත්‍රව; කෙළින, ක්‍රීඩා කරන් නාවූ; ඇල්ගෙවි, ශාලිගොපිකාවන් ඇත්තාවූ; අස්වන්, ශස්‍යසමෘඬි යෙන් යුක්තවූ; ගුරුළුකෙත, ගුරුළුකෙත නම්වූ ශාලික්ෂෙත්‍රය; බලා, නිරීක්ෂණය කොට; පලායව්, ප්‍රයාණය කරව.

39 බ න් නේ මරාමිණිදුල පබළු මුතුප   ට
වැ න් නේ ගම්බුගෙලෙ පලමල් කුමුකුව   ට
ග න් නේ තසිත එබැවින් නොවැද කෙළිය   ට
ය න් නේ වෙළඳගොඩ දක මදකලක් සි   ට

39 පල, (නීලවර්ණ රක්තවර්ණ) ඵලයෙන් හා; මල්, පුෂ්ප (පරිලිකා වෙන්) යුක්තවූ; කුමුකුවට, (පතුවගල) වෘතිවූ පූගවෘක්ෂ; ගම්බුගෙලෙ,

---

වරනලද ඔලු ( නිල්රත් ) මානෙල් එළමානෙල් යන මල්වලින් ගැවසී ගත් නෙළුම්මල් ඇත්තාවූ, පිනිවැනි සිහිල්දිය ඇත්තාවූ, ගැඹුරු ජලා ශය; දක මිත්‍රය යව.

38 දිලෙන පයොධරවල රත්නෙළුම්රේණු විසුරුවාගෙන නිල් මානෙල්කැකුළු පෙති විහිදවා(ප්‍රබොධ කර) කන්අග බහාගෙන ඩබ්රය කින් බාධාවක් නොව ඔවුනොවුන් මිතුරුව ක්‍රීඩාකරන ඇල්ගෙවි ලියන් ඇත්තාවූ, සමෘඩ ශස්‍යඇති, ගුරුළුකෙත නම් ඇල්කෙත; දක ගමන් කරව.

39 (නිල්රතු) ගෙඩි හා (සුදු) මල් (කොළපු) ඇති (අතු ගැලවුණු) පුවක්වැට ග්‍රාම ( භූමි ) නමැති අඞ්ගනාවගේ කරේ බැන්දාවූ නොයෙක්

---

* මේ දන්ත්‍යලකාරවත් 'පිලා' ශබ්දය "පිල-ප්‍රතිෂ්ඨමෙහා" යන ධාතු වෙන් නිපන් පිලාශබ්දය ප්‍රභව කොට ඇත්තේ වේ.

ග්‍රාම (භූමි) අම්බිකාවගේ (කාන්තාවගේ) කණ්ඨයෙහි; බත්, බඳනාලද; ගෙත්, අනෙකවූ; මරාම්ණි, මරකතමාණික්‍යයෙන්; උදුල, බබළන්නාවූ; පබළු මුතුපට වැන්නේ, ප්‍රවාලමිශ්‍රවූ මුක්තාකලාපයක් වැන්නේය; එබැවින්, ඒභාවයෙන්; තසිත ගන්නේ, තාගේ මනොරඤ්ජනය කරන්නේය; (එහෙයින්); කෙළියට නොවැද, ක්‍රීඩාපිණ්ස ප්‍රවිෂ්ටනොව; වෙළඳගොඩ; වෙළඳගොඩනම්වූ ග්‍රාමය; දූක, දර්ශනය කොට; මඳකලක් සිට, ස්වල්ප කාලයක් අවස්ථානය කොට; යන්නේ, ගමනය කරන්නෙහි.

40 අවට සුපිපි සපු දුනුකේ සල ලා න
හඬන තැනින්තැන විලිකුළු කිර ලා න
පැසී නැමි කරල් රත්හැල් සහ ලා න
වඩින මැනවි මහවෙල මැද වෙර ලා න

40 අවට, හාත්පසින් හෙවත් ක්ෂෙත්‍රය වටකොට; සුපිපි, සුපුෂ්පිතවූ; සපු, චම්පකවෘක්ෂය; දුනුකේ, රාජකෙතකීවෘක්ෂය; සලලාන, සරලවෘක්ෂය හෙවත් සොරගසය යන මේ ආදී වෘක්ෂයෙන් යුක්තවූ; තැනින් තැන, ඒ ඒ ස්ථානයෙහි; හඬන, නාද කරණ්නාවූ හෙවත් රාව පිළිරාව දෙන්නාවූ; විලිකුළුකිරලාන, කාදම්බපක්ෂීන් හා කුරරපක්ෂීන් ඇත්තාවූ; පැසී, පරිණතභාවයට පැමිණ; නැමි, අග්‍රාවනතවූ; කරල්, සස්‍යමඤ්ජරීන් ඇත්තාවූ; රත්හැල්, රක්තශාලියෙන්; සහලාන, යුක්තවූ; වෙරලාන, වෙරලාන නම්වූ; මහවෙල මැද, මහාක්ෂෙත්‍රමධ්‍යයෙහි; වඩිනමැනවි, ප්‍රස්ථානය කිරීම යහපත් වන්නේයි.

41 ප ත් ගන පුල්මල් දෙඹතුරෙක පියක රු
සි ත් පිනවා ඉඳ සැලලිහිණින් අතු රු
ග ත් සරතැස හැර විඳ සුවඳ මඳම රු
කි ත් සිරිමේ වෙහෙරට වදුව පස්ව රු

41 පත්ගන, පත්‍රයෙන් ඝනවූ; පුල්මල්, ප්‍රඵුල්ල පුෂ්පයෙන්; පියකරු, මනොඥවූ; දෙඹතුරෙක, පුන්නාග වෘක්ෂයෙක්හි; සැලලිහිණින්

---

මරකත (පච්ච) මාණික්‍යයෙන් දිලෙන පබළුමැණික්මුසු මුතුහරක් වැනිවූයේ එබැවින් තාගේ සිත අලවාගන්නේය. (එහෙයින් ඒ පුවක් රුක්හි) ක්‍රීඩාපිණ්ස නොවැදී වෙළඳගොඩ නම් ගම දූක මඳවේලාව සිට ගමන් කරන්නෙහි.

40 වටකර (බිම්හි) මනාව පිපුණු සපු දුනුකේ සොරආදි රුක් ඇත්තාවූ, ඒ ඒ තැන නාද පවත්වන විලිකුළන් හා කිරලුන් ඇත්තාවූ, පැසී නැමුණුකරලින් යුත් රත්හැල් ඇත්තාවූ, වෙරලාන නම්වූ මහා ක්ෂෙත්‍රයාගේ; මධ්‍යයෙහි (මින්ත්‍රාන්තමය) වඩිනු මැනවි.

41 කොළවලින් ඝනවූ පිපුණුමල් කරණකොට ගෙන (සිතට) ප්‍රිය කරන්නාවූ දෙඹරුක්හි සැලලිහිණිය අත්‍යරති වාසය කොට

අතුරු, ශාඛිකාපක්‍ෂීන්ගේ මධ්‍යයෙහි; ඉඳ, නිශද්‍ය කොට; සිත්පිනවා, චිත්තප්‍රීතියට පමුණුවා; සුවදඹ්දමරු, සුගන්ධමන්දමාරුතය; විඳ, ස්පර්ශ කොට; ගත්සරතැස, ගාත්‍රයෙහි ශ්‍රාන්තභාවය; හැර, වර්ජිත කොට හෙවත් ගමන්විඩා දුරු කොට; පස්වරු, අපරාහ්ණකාලයෙහි; කිත්සිරි මේ වෙහෙරට, කීර්තිශ්‍රීමෙඝ නම්වූ විහාරයට; වදුව, ප්‍රවේශ වව.

42 සො ද මුනිරද පිඩුකල යස මෙරද ස ම
පු ද කල ඔහු නෙත් නිල්කැලුමෙව් බැර ම
ස ද සුරු සඳවෙලෙන්රුඳි රුසිරු මනර ම
ව ද නෙනි තෝ දගගැප් මහබෝ පිළි ම

42 සොද, (සර්වගුණසෞන්දර්‍ය්‍යයෙන්)ප්‍රශස්තවූ; මුනිරජ, සර්වඥරාජෝත්තමයාණන්වහන්සේගේ; පිඬුකල, පිණ්ඩීකෘතවූ හෙවත් කැටිකරනලද් දෑවූ; යසමෙරදසම, යශෝමරීචි හා සමානවූද; ඔහු, ඒ සර්වඥයන්වහන්සේ විසින්; පුදකල, පූජාකරනලද්දෑවූ; බැරම, බෘහත්වූ (බොහෝවූ); නෙත්, නෙත්‍රයන්ගේ; නිල්කැලුමෙව්, නීලකාන්තීන් හා සමානවූද; සඳවෙලෙන් රුඳි, සන්ධ්‍යාවලාහකයෙන් රජිතවූ; සඳසුරු, චන්ද්‍රබිම්බයට බඳුවූ ආකාර ඇති; මනරම, මනොඥවූ; රුසිරු, රූපශ්‍රී ඇත්තාවූද; දගගැප්මහබෝ පිළිම,( යථාක්‍රමයෙන්) ධාතුගර්භයද මහාබෝධීන්වහන්සේද ප්‍රතිමාරූපයද; තෝ වඳතෙහි, තෝ,නමස්කාර කරන්නෙහි.

43 ස ල් සපුකිණි දෙඹ රුරහ නා මිඳෙ ලී
පු ල් එරහැඳි හෝපලු මීඅඹ පලො ලී
පො ල් පුවකිගු රඹ මලබුලත සලිම ලී
නි ල් ගනසා සෙවණැලු ඥදතෙර මනක ලී

43 සල්, ශාලවෘක්‍ෂය; සපු, චම්පකවෘක්‍ෂය; කිණි, නමෙරුවෘක්‍ෂය; දෙඹ, පුන්නාගවෘක්‍ෂය; රුරහ, ඔෂධිවෘක්‍ෂය; නා, නාගවෘක්‍ෂය; මිදෙලි, නිවුලවෘක්‍ෂය; පුල්, ප්‍රඵුල්ලවූ; එරහැඳි, කෘතමාලවෘක්‍ෂය; හෝ, අශොකවෘක්‍ෂය; පලු, පිලුවෘක්‍ෂය; මීඅඹ, සහකාරවෘක්‍ෂය; පලොලි, පාටලී

---

සිත පිනවාගෙන සුවදමඳපවන් විඳ ඇහෙහි විඩා දුරුකොට සවස්වේලෙහි කිතිතිශ්‍රීමෙඝ නම්වූ(කිත්සිරිමෙවන් කැලණි)විහාරයට ප්‍රවේශ වව.

42 ( සියලු ගුණයන්ගේ යහපත්භාවයෙන් ) පසස්නාලද බුදුරජාණන්වහන්සේගේ කීර්තිරශ්මීන් පිඬුකලාක් වැනිවූද, උන්වහන්සේගේ විසින් ( අනිමිෂලොචනසප්තාහයෙහිදී ) පුදකරනලද බොහෝවූ නෙත්‍රයුග්මය පිළිබඳ නීලරශ්මීන් හා සමානවූද, සන්ධ්‍යාකාලයෙහි හටගත් වලාකුළින් රඳනාලද සඳමඬලට බඳු ආකාර ඇති මනහර රුසිරින් යුක්තවූද, (මෙකී විශෙෂණත්‍රයෙන් පිළිවෙළින් සැලකියයුතුවූ) දාගැප්, මහබෝ, පිළිම යන ත්‍රිවිධචෛත්‍යයන් තෝ නමස්කාර කරන්නෙහි.

43 සල් සපු කිණි දෙඹ රුරහ නා මිදෙල් යන වෘක්‍ෂ හා පිපුණු ඇසළ හොපලු මොර මීඅඹ පලොල් පොල් පුවක් ලක් රඹ හා මලබුලත්

වෘක්ෂය; පොල්, නාරිකෙලවෘක්ෂය; පුවක්, පූගවෘක්ෂය; ඉඟු, ඉඤ්ඤු වනය; රඹ, රම්භාවෘක්ෂය; මලබුලත, මලයතාම්බූලලතාලිඞ්ගිතවූ; සළ මලි, ශල්මලිවෘක්ෂය යන මොවුන්ගේ; නිල්, නීලවර්ණවූ; ගන, සාන්ද්‍රවූ; සා, ශාඛාවන්ගේ; සෙවණෙළු, ඡායාමණ්ඩලයන්; මනකලි, මනොඥවූ; දෙතෙර, උභයතීරයෙහි–

කුලකහෙයින් මෙහි "දෙතෙර" යනු මත්තෙහි තුන්වැනි කවියෙහි "ළවැලිපිට හිඳ" යන තැනට සම්බන්ධයි.

44 ගව සා සුපුල් කඩුපුල්මල් නිල් වර ල
සල සා උකුළුවට රසුදුළ මිණිමෙවු ල
සක සා දෙතන හරසඳුනෙන් කැරු සිහි ල
දෙප සා ඉසින නිල්පැහැ නෙතැ දිගුපුළු ල

44 නිල්වරල, (භ්‍රමර) නීලවූ ධම්මිල්ලයෙහි; සුපුල්, සුප්‍රඵුල්ලවූ; කඩු පුල්මල්, කාණ්ඩොත්පලපුෂ්පයන්; ගවසා, (සිදුරු නොපෙනෙන පරිද්දෙන්) පුරා පැළඳ; රසුදුළ, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; මිණිමෙවුල, මාණික්‍ය මෙඛලාදාමය; උකුළුවට, ජඝනවෘත්තයෙහි; සලසා, යොජිත කොට; දෙතන, පයොධරයුග්මය; හරසඳුනෙන්, මුක්තාහාරයෙන් හා (ගොශීර්ෂ) චන්දනයෙන්; සකසා, සජ්ජිතව; සිහිල කැරු, ශිතලභාවයට පමුණුවා; දිගුපුළුලනෙතැ, ආයතවිශාලනෙත්‍රයෙහි; නිල්පැහැ, නීල කාන්තින්; දෙපසා, උභය පාර්ශ්වයෙහි; ඉසින, සෙවනය කරන්නාවූ-

45 මන හර නාමණෙවියනිඳ ළවැලිපි ට
ගෙන මිණිවෙණ තත් නියගින් මැද රුව ට
කන හෙවැසියන බුදුගුණ ගී මියුරු කො ට
සැන හෙව කැලණිගඟබඩ මඳකලක් සි ට

---

ලියවැළඳි ඉඹුල් යන වෘක්ෂලතාවන්ගේ නීලවර්ණවූ ඝනවූ ශාඛාවන් සම්බන්ධ සෙවණැල්ලෙන් සිත්සතුටුකරන්නාවූ ගංඉවුරුදෙක්හි–

(මේ කවිය මතු කවිදෙක හා එකවාක්‍යතාවයෙන් සම්බන්ධ වේ. එහෙසින් මේ කවිතුන මුක්තකාදි කාව්‍යවශයෙන් "කුලක කාව්‍ය" නම් වේ. "පඤ්චභිඃ කුලකං මතම්" යනු ප්‍රායිකහෙයින් පසකින් හෝ ඉන් වැඩි අඩු ගණනෙකින් හෝ පරස්පරසම්බන්ධ එකවාක්‍යතාවයට පැමිණි පද්‍යයෝ "කුලක"නම් වෙති. එක්පද්‍යයෙකින් නිමි වාක්‍ය ඇත්තෝ"මුක්තක"නම්.)

44. (බමරපැහැය සේ) නිල්වූ කොණ්ඩයෙහි ඉතාහොඳින් පිපුණු කඩුපුල්මල් (එනම්; දිව්‍යපුෂ්පයන්) පුරා පැළඳගෙන ශොභායෙන් දිලිසෙන මැණික්ඉණපලඳනා උකුලවට යොදා පියවුරුයුවළ මුතුහරින් හා ගෝසිසඳුනෙන් මනාසේ සිහිල්කොට දික් පුළුල් නෙත්‍රයන්හි නීලප්‍රභා (ගත) දෙපසෙහි ඉසින්නාවූ-

45 (රූසිරින් දුටුවන්) සිත්ගන්නාවූ (දිව්‍ය) නාගයුවතීන්විසින් (ගංවතුරෙන්.) එළවනලද හෝ රැස්කරනලද (සුදු) වැලිතලාහි හිඳ

45 මනහර, මනොඥවූ; නාමණෝවියන්, නාගමාණවිකාවන් විසින්; අළුවැල්පිට, (ගංවතුරෙන්) වඩනලද්දවූ නොහොත් (ගඞ්ගා ප්‍රවාහයෙන්) අමුතුව රැස්කරනලද (ධවලවූ) පුලිනතලයෙහි; ඉඳ, නිෂද්‍යාව කොට; මිණිවෙණ, මාණික්‍යයෙන් අලඞ්කෘතවූ වීණාවන්; ගෙන, ග්‍රහණය කොට; තත්, තන්ත්‍රි (පඞ්ක්තීන්); නියගින්, නඛාග්‍රයෙන්; රුවට, (සම්රොත්පාදනය පිණිස) මනොඥකොට; මැද, මාර්ජනය කොට; මියුරු කොට, මධුරවනපරිද්දෙන්; කියන, කථනය කරනු ලබන්නාවූ; බුදුගුණ ගී, බුධගුණප්‍රතිසංයුක්ත ගීතිකාවන්; කන හෙව, කර්ණයෙහි බහා හෙවත් කන් නමා අසා; කැලණිගඟබඩ, කල්‍යාණී නම් ගඞ්ගාව සමීපයෙහි; මඳකලක් සිට, ස්වල්පකාලයක් අවස්ථානය කොට; සැනහෙව, (මාර්ගශ්‍රම දුරුකොට) සන්තපිණියට පැමිණෙව.

46 සපු මල් යොහොඹු ලා බැඳ වරල මනර ඟ
පැහැදුල් දෙඹකැකුළු හර කර ලා තන ග
රොනවුල් නා කුසුම් කන ලා කොඬොල් ර ඟ
දවහල් උයන්කෙළිකෙළෑ සලෙළුන් සම ග

46 සපුමල්යොහොඹු, චම්පකපුෂ්ප හා මාධවිපුෂ්පයන්; ලා, බහා; වරල, කෙශකලාපය; මනරඟ, සිත්වූපරිද්දෙන්; බැඳ, බන්ධනය කොට; පැහැදුල්, (ධවල) වර්ණයෙන් බබලන්නාවූ; දෙඹකැකුළු, පුන්නාග මුකුලයන්; තනග, පයොධරාග්‍රයෙහි; හර කර ලා, මුක්තාහාර කොට පැලඳ; රොනවුල්, (ස්වර්ණවර්ණවූ) පුෂ්පරේණුයෙන් ගැවසිගත්තාවූ; නාකුසුම්, නාගපුෂ්පයන්; කොඬොල්රඟ, කුණ්ඩලවිලාසයෙන්; කන ලා, කර්ණයෙහි ප්‍රසාධනය කොට; සලෙළුන් සමඟ, තරුණපුරුෂයන් හා එක්ව; දවහල්, දිවාභාගයෙහි; උයන්කෙළි කෙළෑ, උද්‍යානක්‍රීඩා කොට–

---

මාණික්‍යයෙන් සරසනලද වීණාවන් ගෙන (හඬ උපදවනුපිණිස) නිය අගින් මනාකොට වීණාතත් පිරිමැද මධුර කොට කියනුලබන බුදුගුණ ගී අසමින් කැලණිගඟබඩ මඳවේලාවක් සිට (විඩා හැර) සැනහෙව.

46 සපුමල් හා යොහොඹුමල් බහලා සිත්සේ කොණ්ඩය බැඳ (සුදු) පැහැයෙන් දිලෙන දෙඹමල්කැකුළු පියවුරුඅග්හි මුතුහර කොට (පැලඳ) (රන්වන්) රෙණුයෙන් ආකුලවූ නාමල් කුණ්ඩලාභරණ මෙන් කන්හි පැලඳ තරුණපුරුෂයන් හා එක්ව දහවල් කාලයෙහි උයන්බිම්හි ක්‍රීඩාකොට-(මතු දෙකාව හා කුලකයි.)

47 නු ව නි න් නිල්උපුල් මදහසිනි හෙළැඹු ල
වු ව නි න් කමල් පෑ ලවනගන් රතුපු ල
ප ව නි න් අඹල රන ලියවන් ලියන් කැ ල
රු ව නි න් ලකළ ගඟදිය කෙළෑ නිමුණුක ල

47 නුවනින්, නෙත්‍රයෙන්; නිල්උපුල්, නීලොත්පලයන්ද; මද හසිනි, මන්දහාස්‍යයෙන්; හෙළැඹුල, කුමුදයන්ද; වුවනින්, වක්ත්‍රයෙන්; කමල්, පද්මයන්ද; ලවනගන්, අධරයෙන්; රතුපුල, රක්තොත්පල යන්ද; පෑ, (ගඞ්ගාජලයෙහි) දක්වා; පවනින්, මාරුතයෙන්; අඹල, ආවෘතවූ; රනලියවන්, සවර්ණලතාවන් හා සාදෘශ්‍යවූ; ලියන්කැල, කාන්තා සමූහයා; රුවනින් ලකළ, රත්නයෙන් අලඞ්කෘතවූ; ගඟදිය කෙළෑ, ගඞ්ගාජලයෙහි ක්‍රීඩා කොට; නිමුණුකල, සමාප්තවූ කාලයෙහි-

48 ව දි මි න් සවසනල හැසිරෙන දිගතුව ල
සො බ ම න් සුනිල්මිණි නිල් නුබතුරු විපු ල
ප ත ස න් අවරගිරි නැවියෙන් වැටෙන ක ල
වි ල් කු න් සුරත් පලවැනිවේ රිවිමඬ ල

48 ("ගනකැන් සුනිල්පත් සඳවල නවකිසල" යනු අධ්‍යාහාරයි.) (ගනකැන්, මෙඝසමූහ නමැති; සුනිල්පත්, අතිනීලවර්ණවූ පත්‍රයන් ඇති; සඳවල, සන්ධ්‍යාවලාහක නමැති; නවකිසල, අභිනවපල්ලව ඇත්තාවූ;) දිගතුවල, දිශානමැති ශාඛාවන්හි; වදිමින්, ආස්ඵාලනය වෙමින්; හැසිරෙන, සඤ්චාරය කරන්නාවූ; සවසනල, සායාහ්න මාරුතය ඇත්තාවූ; සොබමන්, ශොභමානවූ; සුනිල්මිණිනිල්, යහපත් ඉන්ද්‍රනීලමාණික්‍යයක් මෙන් නීලවූ; විපුල, මහත්වූ; නුබතුරු, ආකාශ නමැති වෘක්ෂයෙහි; අවරගිරි, අපරපර්වත නමැති; නැවියෙන්, වෘන්තයෙන්; වැටෙනකල, (සමුද්‍රයෙහි) පතනය වන්නාවූ කාලයෙහි; අසන්පත්, ආසන්නප්‍රාප්තවූ; රිවිමඬල, සූර්ය්‍යමණ්ඩලයතෙම; විලිකුන් සුරත්, පාණ්ඩුරක්තවර්ණවූ; පල වැනිවේ, ඵලයක් හා සමාන වන්නේයි.

---

47 නෙත්වලින් නිල්මහනෙල්මල්ද, මඳසිනාවෙන් සුදුමහනෙල් මල්ද, මුහුණින් රත්නෙළුම්මල්ද, දෙතොලින් රත්මහනෙල්මල්ද (ගඟ දියෙහි) පෙන්වා සුළඟින් කරකැවුණු රන්ලතාවැනි අඟනන් සමූහය මාණික්‍යයෙන් හෙබියාවූ ගඞ්ගායෙහි ජලක්‍රීඩාකොට අවසානවූකල්හි-

48 (වලාකුළු සමූහ නමැති ඉතා නිල්කොළ ඇති, සැන්දෑවලා නමැති ලාදළු ඇති, ) දිශා නමැති අතුවල; වදිමින් ගමන සවස්සුළඟ ඇත්තාවූ, හොබනා යහපත් ඉන්ද්‍රනීල මාණික්‍යයක්සේ නිල්වූ, මහත්වූ, ආකාශ නමැති වෘක්ෂයෙහි; අස්තපර්වත නමැති නටුවෙන් ( ගිලිහී මුහු දට) වැටෙනකල්හි ( ජල ) සමීපයට පැමිණි සූර්ය්‍යමණ්ඩලය ඉදී රතුවූ ඵලයක් හා සමාන වේ.

49 ම හ තු න් හසළ තමහට යසපිහිටි ලෙ ස
නි සැ කි න් නොහලයුතුබව පැමිණෙන වෙහෙ ස
සු ද න න් පැවිති සිරිතැයි දන්වන විල ස
නු බ මි න් සමඟ ගෙවේනුය දවහල් දව ස

49 තුමහට යසපිහිටලෙස, තමාහට සුප්‍රතිෂ්ඨවිලාසයෙකින්; හසළ, සචරිතවූ; මහතුන්, මහාත්මයන්ට; වෙහෙස පැමිණෙන, විහිංසාවක් පැමිණිකල්හි; නිසැකින්, නිශ්චයෙන්; නොහලයුතුබව, පරිත්‍යාග නොකටයුතු භාවය හෙවත් නොහැරියයුතු බව; සුදනන්, සත්පුරුෂ ජනයන්විසින්; පැවති සිරිතැයි, ප්‍රවෘත්තවූ චාරිත්‍රයෙකැයි; දන්වන විලසින්; විඥාපනය කරන්නාවූ විලාසයෙන්; නුබමින් සමඟ, සූර්‍ය්‍යමණ්ඩලය හා එක්ව; දවහල් දවස, දිවාභාගය තෙම; ගෙවෙනුය, ක්ෂය වන්නේයි.

50 සැ දෑ ළෙන් වරුණ දෙවිරද මුහුද වි සු
ස දෑ සහසකර එන මඟවන සැල සු
වි දෑ උපුල් පිලමෙන් රත්පටින් වැ සු
සැ දෑ වලාපෙළ පැළදිග පෙනුණු ප සු

50 මුහුද විසූ, සමුද්‍රයෙහි වාසය කළාවූ; සදෑ, (දෙවජාතිවශයෙන්) සමානජාතිඇත්තාවූ; වරුණදෙවිරද, වරුණදෙවරාජයාවිසින්; සැදෑළෙන්, ශ්‍රද්ධාචිත්තයෙන්; සහසකර, සහස්‍රකිරණයා; එන, (තමාගේ වාසභවනයට) එන්නාවූ; මඟවන, මහාපථයෙහි; සැලසූ, යොජනය කරනලද්දාවූ; රත්පටින් වැසූ, රක්තපට්ටාස්තරණයෙන් ඡාදනය කරනලද්දාවූ; විදෑඋපුල්පිල මෙන්, කුරුවින්දපාෂාණයෙන් බඳවූ වෙදිකාවක මෙන්; සැදෑවලාපෙළ, සන්ධ්‍යාවලාහක පඞ්ක්තිය; පැළදිගැ, පශ්චිමදිශායෙහි; පෙනුණුපසු, දෘශ්‍යමානවූවාට පශ්චාත්කාලයෙහි–

---

49 තමහට යහපත් පිහිට ඇත්තන් ලෙස ඇසුරුකරනුලැබූ උතුමන්ට වෙහෙසක් පත්කල්හි නිශ්චයෙන්ම අත්නොහැරියයුතුබව සජ්ජනයන්විසින් පවත්වනලද චාරිත්‍රයෙකැයි දන්වන්නාක් මෙන් සූර්‍ය්‍යමණ්ඩලය හා සමඟ දවල්දවසද ගෙවෙන්නේය.

50 සමුද්‍රවාසිවූ (දෙවනිකායවශයෙන්) සවජාතිකවූ වරුණදෙවිරජහුවිසින් ශ්‍රද්ධාධ්‍යාශයෙන් යුක්තව තමාගේ වාසස්ථානයට සූර්‍ය්‍යදිව්‍යරාජයා එන්නාවූ මහාමාර්ගයෙහි සලසනලද රත්පටපිළියෙන් අතුලාවූ පද්මරාගමාණික්‍යයෙන් බැඳි පිළිකඩක් මෙන් සැඳෑවලාකුළුපෙළ බටහිරදික්හි පෙනුණුපසු–(මතු කවිදෙක හා කුලකයි.)

51 උ දු ළ සොම්කැලුම් නිසයුරුහිමි පුව ළ
පහ ළ වන බැවින් තමවෙත නිසඹු දෙ ළ
ලක ළ ගුවන්තල සිරියහනැ නිකස ළ
අතු ළ කුසුම්විලසින් සැදෙත තුරුවැ ළ

51 උදුල, උජ්ජ්වලිතවූ; සොම්කැලුම්, සෞම්‍යකාන්ති ඇත්තාවූ; පුවළ, ප්‍රෞඪවූ; නිසයුරු, නිශාකර නමැති; හිමි, වල්ලභයා; තම වෙත, ආත්මසමීපයට; පහළවනබැවින්, ප්‍රකාශවනභාවය හේතුකොටගෙන; දෙළ, සාභිලාෂීවූ; නිසඹු, නිශාඞ්ගනාවවිසින්; නිකසළ, (අගුමගිකාදීන්ගේ අභාවයෙන්) කච්චරරහිතවූ; ලකළ, අලඞ්කෘතවූ; ගුවන්තල සිරි යහනැ, ගගනතල නමැති ශ්‍රීශයනමස්තකයෙහි; අතුළ, ආස්තරණය කරනලද්දවූ; කුසුම්විලසින්, පුෂ්පවිලාසයෙන්; තුරුවැළ, තාරකාවළින්; සැදෙත, සජ්ජිත වනකල්හි-

52 ද න ගෙ න වුත් දමනගොදුරට නොහැකි ළි ය
පැ න පැ න දියෙන් ඔවුනොවුනැඟෙහි පෙර ළි ය
ලෙ ළෙ හෙ ළ න කෙළින කැරැ පෙණපිඬු රළරැ ළි ය
එ තැ නි න පියාසර කැරැ දකු මස්කෙ ළි ය

52 එතැනින, ඒ (පලමුවෙන් සිටියාවූ) කැලණිගඟබඩ සිට; පියාසර කැරැ, පක්ෂප්‍රසාරණය කොට; දන, ජනයන්විසින්; ගෙනවුත්, ග්‍රහණය කොට අවුත්: දමන, ක්ෂේපණය කරනුලබන්නාවූ; ගොදුරට, ආහාරයට; නොහැකිළිය, සඞ්කුචිත නොව; දියෙන්, (නදී) ජලයෙන්; පැන පැන, උල්ලඞ්ඝනය කොට කොට; ඔවුනොවුනැඟෙහි, අන්‍යොන්‍ය ශරීරයෙහි; පෙරළිය, පරාවෘත්ත වැ; පෙණපිඬු, ඩිණ්ඩීරපිණ්ඩයන්ද; රළරැළිය, තරඞ්ගභඞ්ගයන්ද; කැරැ, (නිෂ්පාදනය) කොට; ලෙළෙහෙළන, රොහිත මත්ස්‍යයන්විසින්; කෙළින, ක්‍රීඩාකරනුලබන්නාවූ; මස්කෙළිය, මස්කෙළිය නම්වූ නදීතීර්ථය; දකු, දර්ශනය කර.

---

51 දිලුණු සෞම්‍යකාන්ති ඇති ඉතා වැඩුණාවූ චන්ද්‍රනමැති ස්වාමිපුරුෂයා තමවෙතට පැමිණෙනබැවින් කැමැතිවූ රාත්‍රි නමැති කාන්තාව විසින් පිරිසිදුවූ සිත්කලුවූ අහස්තලනමැති සිරියහනෙහි අතුරනලද මල් රැසක් මෙන් තාරකාසමූහය සැදෙනකල්හි-

52 ඒ පළමුකී කැලණිගඟබඩින් පියාසර කොට ජනයන්විසින් ගෙනවුත් දමන ආහාරයට නොහැකිළී ගඟදියෙන් පැන පැන එකිනෙකාගේ ඇඟෙහි පෙරළී පෙණපිඬුද රළබිඳුම්ද නගා ලුහුළුමසුන්විසින් ක්‍රීඩාකරනු ලබන්නාවූ මස්කෙළිය නම් තොටුපළ දකුව.

53 පැහැ ස ර ණී ය මිණිපැමි ණී ය කොත්අග ට
බ ඳ කි කි ණී ය දද ගි හි ණී ය විමන්ව ට
නොවැ පැර ණී යු ව න රම ණී ය විටින් වි ට
සැ ල ලි හි ණී ය වදු කැල ණී ය පු ර ව ර ට

53 කොත්අගට, සතූපිකාග්‍රයට; පැමිණිය, ප්‍රාප්තවූ; පැහැසර ණීය මිණි, ක්‍රිරණශ්‍රෙණියෙන් යුක්ත මාණික්‍ය ඇත්තාවූ; බඳකිකි ණිය, බඳනාලද කිඞ්කිණීක (ජාලාවෙන්) යුක්තවූ; දදගිහිණිය, ධ්වජ යෙන් ගහනවූ; වට, හාත්පස්හි; විමන්, ප්‍රාසාදයන් ඇත්තාවූ; පැර ණිය නොවූ, පුරාණභාවයකට නොපැමිණි; විටින්විට, ක්‍ෂණක්‍ෂණ යෙහි; රමණීය වන, මනොඥවන්නාවූ; කැලණීයපුරවරට, කල්‍යාණී පුරප්‍රවරයට; සැලලිහිණිය, ශාරිකාපක්‍ෂිරාජය; වදු, ප්‍රවිෂ්ට වව.

54 දි ය ක ඳ ගැඹර පිරිපුවතර මහසයු ර
මු ව ර ඳ ලෙසින් වන අගතිසි කරතඹ ර
ම න න ද කරන මිණිගණමෙන් දිසිඑව ර
පැහැ න ද පහන් එහි මහවෙයැ බල මිතු ර

54 ගැඹර, ගම්භීරවූ; දියකඳ, ජලස්කන්ධයෙන්; පිරි, සම්පූර්ණවූ; පුවතර, (ජගත්) ප්‍රසිඬවූ; මහසයුර, මහාසාගරය; අගතිසි, අගස්තිමහ ඍෂිහුගේ; කරතඹර, හස්තතාමරසයෙහි; මුවරඳලෙසින්, පුෂ්පරසයක් මෙන්; වන, වනකල්හි; හෙවත් සියලු සමුද්‍රජලය හස්තපුටයෙන් ගත් කල්හි; දිසි, දෘශ්‍යමානවූ; මනනඳ කරන, මනොනන්දනය කරන්නාවූ; මිණිගණමෙන්, මාණික්‍යරත්නසමූහයක්වැනිවූ; එවර, ඒ තරු පෙනෙන වේලෙහි; එහි, ඒ කල්‍යාණීපුරප්‍රවරයෙහි; මහවෙයැ, මහාවීථි යෙහි; පැහැනද, ප්‍රභායෙන් ආර්ද්‍රවූ හෙවත් ස්නිග්ධවූ ප්‍රභා ඇති; පහන්, ප්‍රදීපයන්; මිතුර, මිත්‍රය; බල, නිරීක්‍ෂණය කර.

---

53 කොත්මුදුනට පැමිණි රැස්විහිදීමෙන් යුත්වූ මැණික් ඇති බඳනාලද කිකිණිදැලින්යුත් ධවජවලින් ගැවසිගත්තාවූ හාත්පස ප්‍රාසාද ඇති, ජරාබවකට නොගොස් ඇසිල්ලක් පාසා මනොරම්‍යවන්නාවූ, කල්‍යාණි නමැති උතුම් නගරයට; සැලලිහිණිය ප්‍රවෙශ වව.

54 ගැඹුරු දියකඳින් පිරුණු (ලොක)ප්‍රසිඬ මහාසමුද්‍රය අගස්ති නම් මහරුසිහුගේ අතුල් නමැති පියුමෙහි මල්මීලෙසින් වනකල්හි හෙවත් ඒ ඍෂිතු සියලු මුහුදුදිය තමාගේ අත්ලට ගත්කල්හි ( මුහුදු පත්ලෙහි) පෙනෙන මනොහරවූ මාණික්‍යසමූහය මෙන් ඒ රාත්‍රිකාල යෙහි කැලණිපුර මහාවීථියෙහි ( පෙනෙන්නාවූ ) සිනිදුපැහැඇති ප්‍රදීප යන් මිත්‍රය බලව.

55 උ ද ය ග පියුම්රා පැහැ වැදමෙන් ඇ ලූ ණු
පෙරදිග පෙනෙන සඳ සඳකැල්මෙන් දි ලූ ණු
මන ර ඟ එපුර සඳකන ගෙහඹින් ගැ ලූ ණු
සුර ග ඟ පතිනි දම්රැකුමෙහි'මැ නියැ ලූ ණු

55 උදයග, උදයපර්වතශිඛරයෙහි; පියුම්රාපැහැ, පද්මරාග මාණික්‍ය ප්‍රභාව; වැද, ස්පර්ශව; ඇලූණුමෙන්, රජිතවූවාක්මෙන්; සඳකැල්මෙන්, සන්ධ්‍යාකාන්තියෙන්; දිලූණු, විස්ඵුරිතවූ; සඳ, චන්ද්‍රයා; පෙරදිග, පූර්වදිශා භාගයෙහි; පෙනෙන, දෘශ්‍යමානවනකල්හි; එපුර, ඒ පුරයෙහි; මනරඟ, මනොඥවූ; සඳකනගෙහි, චන්ද්‍රකාන්තපාෂාණයෙන් නිර්මිතවූ ගෘහයෙහි, අඹින් ගැලූණු, ජලය කරණකොටගෙන වහනවූ; සුරගඟ, ආකාශගඞ්ගානොමෝ; පතිනිදම්රැකුමෙහිමැ, පතිව්‍රතාධර්මරක්‍ෂායෙහිම; නියැලූණු, තත්පර වූ.

චන්ද්‍රදර්ශනය හෙතුකොටගෙන ගඞ්ගාවල්ලභවූ සමුද්‍රය ජලාභිවෘද්ධියට පැමිණෙන කාලයෙහි වෙපුරෙහි උස්වූ චන්ද්‍රකාන්තපාෂාණමය ප්‍රාසාදයන්ගේ සලිලසංසර්ගයෙන් ආකාශගඞ්ගාවට ජලාභිවෘද්ධිය වූහෙයින් සමානසුඛදුඃඛතාලක්‍ෂණවූ පතිව්‍රතාධර්මය රක්‍ෂාකළායයි කීහු.

56 සුනිල් වලා නවසඳ නිලුපුල් පබ ළු
විමල් සක් ගිජිඳුකුඹු සිරිවස බැබ ළු
විපුල් පුලින රඹ සිකිගල මුතුලද ළු
ළකල් රනලියන් සරනෑ බල යහ ළු

56 සුනිල්, අතිනීලවූ; වලා, මෙඝය; නවසඳ, අභිනවචන්ද්‍රය; නිලුපුල්, නීලොත්පලය; පබළු, ප්‍රවාලය, විමල්, නිර්මලවූ; සක්, ශඞ්ඛය;

---

55 උදයගිරි මුදුනෙහි රක්තමාණික්‍යයන්ගේ කාන්තිය වැදී ඇලූණක් මෙන් සන්ධ්‍යාකාන්තියෙන් දිලූණවූ සඳමඬල නැගෙනහිරදික්හි පෙනෙනකල්හි එනුවර චන්ද්‍රකාන්ත නම් ( සඳපහනින් දිය වැහෙන ) මාණික්‍යවිශෙෂයෙන් කරනලද ගෘහයන්හි (හිතතියෙන් වැහෙන) ජලයෙන් ගලායන්නාවූ ආකාශගඞ්ගානොමෝ පතිව්‍රතාධර්මරක්‍ෂණයෙහිම නියුක්තවූවාය.

මෙහි ආකාශගඞ්ගාව සමුද්‍රයාගේ පත්නීත්වයෙන්ද සමුද්‍රය ඇයගේ වල්ලභත්වයෙන්ද විවක්‍ෂිතයි. චන්ද්‍රදර්ශනයෙන් ගඞ්ගාවල්ලභවූ සමුද්‍රයාගේ ජලාභිවෘද්ධිය වනකල්හි පත්නීවූ ආකාශගඞ්ගාවගේද චන්ද්‍රකාන්තපාෂාණජලසංසර්ගයෙන්වූ අභිවෘද්ධිය අඹුසැමිදෙදෙනාගේ සමානසෞඛ්‍යතාලක්‍ෂණය වේ. හිමිහට පැමිණීදුකෙහි දුක්වීමද සුවෙහි සුවපත්වීමද පත්නියගේ සමානසුඛදුඃඛතාලක්‍ෂණ පතිව්‍රතාධර්මය සීසේයි.

56 ඉතා නිල්වලාය බාලචන්ද්‍රය නිල්මහනෙල්ය පබළුමැණික්ය නිදොස්වූ සක්ගෙඩිය ඇත්කුඹුය බබළන්නාවූ ශ්‍රීවත්සය මහත්වැලිතලාය කෙසෙල්කඳය මොනරුන්ගේ ග්‍රීවාය මුතුඇටය ළාදළුය යන මෙයින් සිත ප්‍රියකරන්නාවූ ඇවිදින ස්වර්ණලතාවන් මිත්‍රය [illegible]

ගිජිඳුකුඹු, ගජරාජකුම්භය; බැබළු, භ්‍රාජිතවූ; සිරිවස, ශ්‍රීවත්සය; විපුල්, මහත්වූ; පුලින, වාලුකාස්ථලය; රඹ, කදලිස්කන්ධය; සිකිගල, මියුර කණ්ඨය; මුතු, මුක්තාඵලය; ලුදළු, බාලපල්ලවය යන මෙයින්; ළකල්, මනොඥවූ; සරනා, සඤ්චාරය කරන්නාවූ; රනලියන්, ස්වර්ණලතාවන්; යහළු, මිත්‍රයා; බල, දර්ශනය කර.

57 ඔ ද වැඩි කෙළිමඟුල් ලැබ තුටු නිසාක ල
සෑ ද සක්මදෙයිනැද දෙන දුනුකැන් දුහු ල
සොඳ පුරඟන පහසුමුඟින් පැහැ උදු ල
සෙ ද දුනඹරමතු ඇය රැස්මිණිමෙවු ල

57 ඔදවැඩි, ඔජෝභූයිෂ්ඨවූ; කෙළිමඟුල්ලැබ, (ඒ පුරාඞ්ගනාව විසින් පමුණුවනලද රාත්‍රිභාගයට යොග්‍යවූ මධුපානරත්‍යුත්සවාදි) ක්‍රීඩාමඞ්ගලයට ප්‍රාප්තවැ; තුටු, සන්තුෂ්ටවූ; නිසාකල, නිශානමැති කාන්තාවවිසින්; සඳසක්මදෙයින්, චන්ද්‍ර (මණ්ඩල) නමැති ශඞ්ඛමඤ්ජූෂායෙන් හෙවත් සක්පෙට්ටියෙන්; ඇද, ආකර්ෂණය කොට; හයාගෙන; දුනුකැන්, ජ්‍යොත්ස්නාසමූහ නමැති හෙවත් සඳපහන් නමැති; දුහුල, දුකූලය; සුදුපට; දෙන, දානය කරනකල්හි; සොඳ, සුන්දරවූ; පුරඟන, පුරාඞ්ගනාතොමෝ; පැහැඋදුල, ප්‍රභායෙන් උජ්ජ්වලත්වූ; පහසුමුඟින්,

අතිප්‍රසිද්ධිය හෙතුකොට උපමානයෙන්ම උපමෙයය හඟුන්වන මේ සමාසොක්ති යෙන් ස්වර්ණලතොපමවූ පුරස්ත්‍රීන් වර්ණනා කළහ.

ඉතා නිල්වලා බඳු කෙශකලාපයෙන්ද බාලචන්ද්‍රයාට බඳු ලලාටයෙන්ද නිල්මහනෙල්පෙතිබඳු නෙත්‍රයෙන්ද ප්‍රවාලමාණික්‍යසේ රක්ත වර්ණවූ දෙතොලින්ද පිරිසිදු සක් සේ ධවලවූ දන්තයෙන්ද ඇත්කුම්බු වැනි පීනපයොධරයෙන්ද ශ්‍රීවත්ස නම් ශෙවතරොමාවර්ත විශෙෂය වැනි වක්ෂාරොදින්ද මහත්වැලිතලාවක් වැනි පුළුලුකුළින්ද කෙසෙල් කඳබඳු වෘත්තොරුයෙන්ද මොනරකර බඳු ජඞ්ඝායෙන්ද මුතු බඳු නියපෙළින්ද ළදළුබඳු අතුල්පතුල් හා අඞ්ගුලියෙන්ද සිත්කලුවූ ඇවිදිනා රන්ලතාවන් වැනි පුරඟනන් බලව යනු අභිප්‍රායයි.

57 (ඒ නගරී නමැති කාන්තාවවිසින් කරවනලද මධුපාන රති උත්සවාදි) ක්‍රීඩාමඞ්ගලයන් ලැබ ප්‍රීතිබහුල වැ සතුටුවූ රාත්‍රි නමැති කාන්තාවද (ඊට ප්‍රත්‍යුපකාර කරන්නියක මෙන්) සඳමඬල නමැති සක් පෙට්ටියෙන් නිකුත්කොටගෙන චන්ද්‍රරශ්මිසමූහනමැති සුදුපටසළුව (නගරී නමැති කාන්තාවට) දෙනකල්හි ඒ යහපත්වූ නගරී නමැති කාන්තාතොමෝද පැහැයෙන් දිලෙන්නාවූ රත්නප්‍රාසාදනමැති කරඬු වෙන් හැරගෙන (මුක්තාමාණික්‍යාදීන්ගේ) රශ්මිනමැති මෙවුල්දම ඒ රාත්‍රි නමැති කාන්තාවගේ, වක්ෂමස්තකයෙහි හෝ ආකාශමස්තකයෙහි වහාම පැලඳවූ.

ප්‍රාසාදනමැයි සමුද්ගයෙන් හෙවත් කරඬුවෙන් (යැරගෙන); රැස්මිණි මෙවුල, රශ්මිනමැයි මාණික්‍යමෙඛලාදාමය; ඇය, ඒ නිශාකාන්තාව ගේ; අඹරමතු, වස්ත්‍රමස්තකයෙහි දෙහෝ නොහොත් ආකාශමස්තක යෙහි; සෙද, ශිසුව; දුන්, ප්‍රදානය කළා.

රාත්‍රී නමැති කාන්තාවවිසින් චන්‍ද්‍රමණ්ඩල නමැති සක්පෙට්ටියෙන් සඳපහන් නමැති සුදු පටසළුව ඇරගෙන පුරාඞ්ගනාවට දුන්කල්හි ඒ පුරාඞ්ගනාතොමෝද ප්‍රත්‍යුපකාර කරන්නියක මෙන් රත්නප්‍රාසාද නමැති රන්කරඬුවෙන් රශ්මිනමැති මාණික්‍යමෙඛලාදාමය ඇරගෙන නිශාකාන්තාවගේ අම්බරමස්තකයෙහි දෙහෝ නොහොත් ආකාශ මස්තකයෙහි පැලඳවූවාය සනු භාවයි.

58 ත ව ර කැරූ කොකුම්සඳුනෙන් තුනුසිය ල
ප ව ර සුවඳ මල්දම් පැලඳ මතක ල
බැහැර සිතුනොලූ හිමිනඹුවො කෙළිලො ල
එ පු ර ඉඳිති සඳපාණෝ සඳලුව ල

58 කොකුම්සඳුනෙන්, කුඞ්කුමයෙන් යුක්තවූ චන්‍දනාඞ්ගරාග යෙන්; සියල තුනු, (ආලෙපයොග්‍යවූ) සකල ශරීරය; තවර කැරූ, විලිප්ත කොට; පවර, උතුම්වූ; සුවඳ, (කස්තූරිකාදි) සුගන්ධද්‍රව්‍යයන්ද (මුව ලා); මතකල, මනොඥවූ; මල්දම්, පුෂ්පදාමයන්ද; පැලඳ, ප්‍රසාධනය කොට; බැහැර, අන්‍යවිෂයයෙක්හි; සිතු නොලූ, චිත්තාධානය නොකළාවූ; කෙළි ලොල, ක්‍රීඩාලෞල්‍යයෙන් යුක්තවූ; හිමිනඹුවො, දම්පතීහු; එපුර, ඒපුර යෙහි; සඳලුවල, චන්‍ද්‍රශාලාවන්හි; සඳපාණෝ, චන්‍ද්‍රාලොකයෙහි; ඉඳිති, නිෂද්‍ය කරන්නාහුය.

59 මුවලඹ රඹ වලුබර ර න්තැඹිලි තු රූ
සැදි ගෙළයන් ගෙවමින් වේමග අ තු රූ
කරකැවෙමින් දකුණට අවුදින් මි තු රූ
වදු වෙහෙරට සිහිකැරූ නවගුණම තු රූ

59 මුවලඹ, මුඛාවලම්බනයෙන් උපලක්ෂිතවූ; රඹ, කෙසෙල් ගසින්ද; වලුබර, ඵලභරිතවූ; රන්තැඹිලිතුරූ, කනකසන්නිරවෘක්ෂ

58 කොකුමින් යුත් සඳුන්විලවුනින් (ආලෙප කටයුතුවූ) සියලු දෙහය ගල්වා උතුම් කස්තූරුආදි සුවඳ (මුඛයෙහි ලා) සිතට ප්‍රියවූ මල් දම් පැලඳගෙන අන්‍යස්ථානයෙක්හි සිත නොහැරියාවූ ක්‍රීඩනයෙහි ලොල්සිත් ඇති ජයම්පතීහු (අඹුසැමියෝ) සඳපහන ඇති රාත්‍රියෙහි එනු වර (මතුමහල්තල) චන්‍ද්‍රශාලාවන්හි හිඳිත්.

59 මුව එලෙන්නාවූ කෙසෙල්ගසින්ද වලුබරින් යුත් රන් තැඹිලි රුකින්ද සැරසුණාවූ ගෘහොද්‍යාන (ගේ අවට උයන්) ඇති විපිමාගී

ඝොණ්ද; සැදී; අලඞ්කෘතවූ; ගෙළයන්, ගෑහොඬ්න ඇත්තාවූ; චේවක අතුරු, වීථිමාර්ගීගානගරය; ගෙවමින්, අවසානකෙරෙමින්; දකුණට කර කැවෙමින්, දක්ෂිණාවෘතත වෙමින්; අවුදින්, ආගමනය කොට; නවගුණ මතුරු, නවගුණමන්ත්‍රය: සිහිකැරැ, අනුස්මරණය කොට; මිතුරු, මිත්‍රය; වෙහෙරට, විහාරයට; වදු, ප්‍රවිෂ්ට වව.

60 දිය තෙ ක් පැතිර සිරි බුදුගු ණ කියා හැ ම
සග්මො ක් ලබනුවස් පියයුග ඔබා බි ම
සි ය ස ක් පුරා දුටුමෙන් තුටුවැ මුනිතු ම
ච ඳු ල ක් තිලකගෙහි වැඩළුන් මහපිළි ම

60 හැම දියතෙක්, සියලු ජගත්‍රයෙහි; පැතිර, ව්‍යාප්තව; සිරි, අවස්ථානය කළාවූ; බුදුගුණ, ( ගාථාවිශෙෂයෙන් විරචිතවූ ). බුද්ධගුණ යන්; කියා, කථනය කොට; සගමොක් ලබනුවස්; ස්වර්ගමොක්ෂ ( සම්පත්ති) ප්‍රතිලාභය පිණිස; පියයුග, පාදපත්‍රයුග්මය; බිම ඔබා, භූමියෙහි පිහිටුවා; මුනිතුම, ( ධ්‍රියමාණවූ ) මුනීන්ද්‍රයන්වහන්සේ; සියසක්, ස්වකීය නෙත්‍රය; පුරා, ( රූපවිලාසයෙන් ) පරිපූර්ණ කොට; දුටුමෙන්, දර්ශනය කළාක්මෙන්; තුටු වැ, සන්තුෂ්ට වැ; ලක්තිලකගෙහි, ලඞ්කාතිලක නම්වූ ප්‍රතිමාලයෙහි; වැඩළුන් මහපිළිම, ( වජ්‍රාසනාරූඪ වැ ) වැඩහුන් මහපිළිමවහන්සේ; වඳු, (මස්තකයෙන්) නමස්කාර කර.

61 පෙ ර ද ල නිදු දියකඳ රටබිම් ගල න
යු ර කු ල හිමි රකිනුව ලක මැවූ න
ම න ක ල ඒ සමුදුර පැහැයෙන් දිමු න
ච ඳු ස ල පිළිමයිම් සිරිසරණ සියප න

61 පෙර, පූර්වකාලයෙහි හෙවත් කැලණිතිස්සරජසමයෙහි; දල නිදු, ජලනිධිහුගේ; දියකඳ, ජලස්කන්ධය; රටබිම් ගලන, ජනපද භූමි ප්‍රදෙශයන් නිමග්න කරනකල්හි; ලකසත, ලඞ්කාවාසි සත්වයන්; රකි

---

නගරය පසුකරමින් දකුණට කරකැවී අවුත් "ඉතිපි සො භගවා" යනාදී නවගුණපාඨ නමැති මන්ත්‍රය සිහි කොට මිත්‍රය විහාරයට ඇතුළු වෙව.

60 මුළු (තුන්)ලොව පැතිරසිරියාවූ (ගාථාරචනායෙන් ප්‍රකාශිතවූ) බුද්ධගුණයන් කියා ස්වර්ගමොක්ෂ සැප ලබනුපිණිස පියාපත් දෙක බිම පිහිටුවා ( ධරමානවූ ). ශාක්‍ය මුනීන්ද්‍රයාණන්වහන්සේ තමඇස් පුරා දුටු වාක් මෙන් සතුටු වැ ලඞ්කාතිලකනම් ප්‍රතිමාලයෙහි (වජ්‍රාසනාරූඪ වැ) වැඩහුන් මහාප්‍රතිමාවහන්සේ නමස්කාර කර.

61 අතීතයෙහි හෙවත් කැලණිතිස්නිරිඳුන්ගේ රාජ්‍යකාලයෙහි සමුද්‍රයාගේ ජලස්කන්ධය ජනපදභූමි නිමග්න කරනකල්හි ලක්වැසි සත්වයන්

නුව, රක්‍ෂාකරනු පිණිස; සුරකුලහිමි, ශක්‍රදෙවේන්ද්‍රයාවිසින්; මැවූ, නිර්මිතකළාවූ; මනකල, මනොඥවූ; ඒ සමුදුරපැහැයෙන්, ඒ සමුද්‍රයා ගේ වර්ණයෙන්; දිමුත, දීප්තිමත්වූ; සලපිළිමහිමි, ශිලාප්‍රතිමා ස්වාමීන්ගේ; සිරිසරණ සියපත, ශ්‍රීපාද නමැති පද්මය; වඳු, නමස්කාර කර.

62 හි ලි ය නොදී සැටම්හණන් බව්මහ ණ
ම ලි ය දෙව්තෙරිඳු වැඩහිඳ දෙසූ බ ණ
දි ලි ය පස්මහල් පායෙහි මිණිකිර ණ
බැ ලි ය හැකිවිනම් දැක වැඳ යා කල ණ

62 සැටම්හණන්, සැටක් පමණ ශ්‍රමණයන්වහන්සේ; බව මහණ, සංසාරමහාර්ණවයෙහි; ගිලියනොදී, නිමග්නවන්ට නොහැර; මලියදෙව් තෙරිඳු, මලියදෙවස්ථවිරයන්වහන්සේවිසින්; වැඩහිඳ, උප වේශනය කොට; බණදෙසූ, ජවකකසූත්‍රය දෙසනාකළාවූ; පස්මහල් පායෙහි, පංචභූමක ප්‍රාසාදයෙහි; දිලිය, උජ්ජ්වලිතවූ; මිණිකිරණ, මාණික්‍යරශ්මීන්; බැලියහැකිවිනම් දශිතක්‍ෂම විනම්; දැක, නිරීක්‍ෂණය කොට; වැඳ, නමස්කාර කොට; කලණ, කල්‍යාණය හෙවත් සුභ රාධනය; යා, යාත්‍රා කර.

63 පෙ ර උ වි ඳු ගෙ න ගි රි ඳු සිඳු සල ත
නැගි පැ හැ ඳු පෙ ණ ස මු ඳු සැටි තුමු ත
මෙ න උ ළි ඳු පැ හැ වි ගි ඳු නෙදිගුබි ත
සැ දි ව ට ඳු ගෙ හි ව ඳු ඳු ගැබ දිමු ත

63 පෙර, පූර්වකාලයෙහි; උවිඳු, උපේන්ද්‍රයා, ගිරිඳු, මන්දර පර්වත රාජයා; ගෙන, ග්‍රහණය කොට; සිඳු, (ක්‍ෂීර) සාගරය; සලත, මථනය කරනකල්හි; පැහැඳු, ප්‍රසන්නවූ; නැගි, උද්ගතවූ; පෙණසමුඳු, ඵේණ රාශියක්හුගේ; සැටි, සංස්ථානය; තුමුත, නොහැරියාවූ; උළිඳු මෙන, චන්ද්‍රයා හා සමානවූ; පැහැ, ප්‍රභාව; නෙදිගුබිත, නොයෙක් දිශාභිත්ති

---

රක්නා පිණිස සක්දෙවිඳුහුවිසින් මවනලද්දවූ සිත් ප්‍රියකරන්නාවූ ඒ සමුද්‍රයාගේ වර්ණයෙන් දිලෙන්නාවූ සලපිළිමවහන්සේගේ ශ්‍රීපාදපද්මය නමස්කාර කර.

62 භික්‍ෂූන් සැටනමක් භවසාගරයෙහි ගිලෙන්ට නොදී 'මලිය දෙව්'නම් ක්‍ෂීණාශ්‍රවස්ථවිරයන් වහන්සේ වැඩහිඳ ධර්මය දෙශනා කළාවූ පස්මහල් ප්‍රාසාදයෙහි දිලියෙන මාණික්‍යරශ්මීන් බැලිය හැකි වුවහොත් දැක වන්දනය කොට යහපත් ස්වරූපඇති මිත්‍රය ගමන් කර.

63 (බාහිරකථාවශයෙන්) අතීතකාලයෙක්හි විෂ්ණුහු මන්දරනම් මහාපර්වතය ගෙන (කිරි) සයුර කලඹනකල්හි පැහැදී පැන නැංගාවූ පෙණරැසක ආකාරය අත්නොහැරියාවූ චන්ද්‍රයාට බඳුවූ පැහැය නො

යෙහි; විහිදු, විස්තීර්ණ කොට; සැදි, සැරහුණාවූ; වටදාගෙහි, වෘතධාතුගෘහයෙහි; දිමුත, දීප්තිමත්වූ; දාගැබ, ධාතුගර්භය; වදු, නමස්කාර කර.

64 දි ගු නෙ ත් නිලුපුලෙව් රතදර පබළර ඟ
සි රි ම ත් සුපුන්සඳ වැනි මුවන මනර ඟ
පැ හැ ප ත් ලකළ රන්වන්විලසින් ලොව ග
වැද් හො ත් පිළිමහිමි වඳු පායැ පැළඳි ග

64 නිලුපුලෙව්, නීලොත්පලයට බඳුවූ; දිගුනෙත්, ආයත නෙත්‍ර ඇත්තාවූ; පබළරඟ, ප්‍රවාලාකාරවූ; රතදර, රක්තාධරයෙන් යුක්තවූ; සිරිමත්, ලක්ෂ්මීමත්වූ; සුපුන්සඳ වැනි, සම්පූර්ණ චන්ද්‍රයාට බඳුවූ; මනරඟ මනොරඤ්ජනය කරන්නාවූ; මුවන, ශ්‍රීමුඛමණ්ඩලයක් ඇත්තාවූ; පැහැපත්, ප්‍රභාප්‍රාප්තියෙන්; ලකළ, අලඞ්කෘතවූ; රන්වන්විලසින්, ස්වර්ණවර්ණවූ ( රූප ) විලාසයෙන්; ලොවග, ලොකොත්තමවූ; පැළඳිග පායැ, පශ්චිම දිශාභාගයෙහි ( පිහිටි ) ප්‍රාසාදයෙහි; වැද හොත්, ශයන ප්‍රාප්තවූ; පිළීමහිමි, ප්‍රතිමා ස්වාමින්වහන්සේ; වඳු, නමස්කාර කර.

65 අ හ සිත් අවුත් මිණිඅක්නයිඳු යැදුම ට
ර හ තන් මැදෙහි මුනි හිඳ මිණිපලඟපි ට
ද හ මුත් දෙසු තැනැකල සැටරියන්කො ට
ම හ දාගැප් හිමින් වඳු සොළොසතැන් සි ට

65 මිණිඅක්නයිඳු, මණිඅක්ඛිකනම් නාගරාජයාගේ; යැදුමට, යාච්ඤාවට; මුනි, සර්වඥයන්වහන්සේ; අහසින් අවුත්, ආකාශයෙන් වැඩ; රහතන් මැදෙහි, ( පන්සියක් ) ක්ෂීණාශ්‍රවයන් මධ්‍යයෙහි; මිණිපලඟ පිට, රත්නමය පර්‍ය්‍යඞ්කමස්තකයෙහි; හිඳ, උපවෙශනප්‍රාප්ත වැ; දහමුත් දෙසූතැන, ධර්මයත් දෙශනාකළාවූ ස්ථානයෙහි; සැටරියන් කොට,

යෙක් දික්නමැති බිත්තියෙහි විහිදුවා සැරසුණාවූ වටදාගෙහි දිලියෙන්නාවූ දාගැබ්වහන්සේ වන්දනය කර.

64 නිල්මහනෙල් ( පෙති ) බඳු දික්ඇස් ඇති ප්‍රවාලමාණික්‍යයට බඳු පැහැපුත් රත් අධරයුග්ම ඇති ශොභායෙන් යුත් පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන් සිත් සතුටු කරවන්නාවූ මුඛමණ්ඩලයක් ඇති පැහැපත්බැවින් අලඞ්කෘතවූ රන්වන් ශරීරශ්‍රීයෙන් ලොවට අග්‍රවූ බටහිර ප්‍රාසාදයෙහි සැතපෙන පිළිමවහන්සේ වඳුව.

65 මණ්‍යක්ෂනම් නාගරාජයාගේ ආරාධනාව සිදුකරනු සඳහා (ශාක්‍ය) මුනීන්ද්‍රයන්වහන්සේ ආකාශමාර්ගයෙන් වැඩ (පන්සියක්) අර්හතුන්ගේ මධ්‍යයෙහි මාණික්‍යපර්‍ය්‍යඞ්කමස්තකයෙහි වැඩහිඳ ( දානයත් පිළිගෙන) ධර්මයත් දෙශනාකළ තන්හි වඩුසැටරියන් ප්‍රමාණ කොට කරනලද මහාචෛත්‍යස්වාමීන්වහන්සේ ( ප්‍රදක්ෂිණ කෙරෙමින් ) සොළොස් තැනෙක සිට නමස්කාර කර.

ෂඩ්විහසතප්‍රමාණ කොට; කළ, කරනලද්දවූ; මහදගැප් ගිමින්, මහා චෛත්‍යස්වාමින්වහන්සේ; සොළොසතැන් සිට, ෂොඩශස්ථානයෙක්හි සිට; වඳු, වන්‍දනය කර.

66 ස ව න සතියැ වැසි ව සි නා දස දී ගෙ හි
පෙණි න සෙවෙණි මුදලිඳු නා ද් ර ණ ගෙ හි
ස ව න හිඳීඥුද න න ද නා නෙතුයු ගෙ හි
ව ඳි න මැ න වී පිළිමය නා පි ළි ම ගෙ හි

66 දස දිගෙහි, දශදිශායෙහි; වැසිවසිනා, (සහනාහවද්දලිකා වසයෙන්) වර්ෂණය කරන්නාවූ; සවන සතියැ, (මුදුවූ) සවන සප්තාහයෙහි; පෙණින, එණමණ්ඩලය කරණකොටගෙන; සෙවෙනි, ඡදනය ඇත්තාවූ; මුදලිඳුනා, මුචලින්‍දනම් නාගරාජයාගේ; දරණගෙහි, භොගාවලී ගෘහයෙහි; සවන, සර්‍වඥයන්වහන්සේගේ: හිඳිනු, වැඩහිඳිනා භාවය; දනන්, සත්ත්වයන්ගේ; නෙතුයුගෙහි, නෙත්‍රයුග්මයෙහි; අඳනා, අඤ්ජනය කරන්නාවූ නොහොත් දක්වන්නාවූ; නාපිළිඹගෙහි, නාගප්‍රතිමාලයෙහි; පිළිමය, ප්‍රතිමාව; වඳින මැනවි, නමස්කාරකරනු යහපති.

67 ස ස රි න් මුද ලෙව් සදහම් අ මා දී
එ ක ගි න් මුනිඳු උන්වැනිනිපර මා දී
ලකුණෙ න් සපිරි පිළිමය දක ස මා දී
වැ ද ග න් මිතුර තුන්සිත කැරැ ස මා දී

67 සදහම්අමා දි, සද්ධර්‍ම නමැති අමෘතය (විභාග කොට) දී; ලෙව්, සත්ත්වලොකයා; සසරින් මුද, සංසාර (බන්ධන) යෙන් මොචනය කොට; නිපරමාදී, සමෘතිවිප්‍රවාසයක් නැත්තාවූ; මුනිඳු, මුනීන්‍ද්‍රයාණන්වහන්සේ; එකඟින්, චිත්තෛකාග්‍රතායෙන් යෙදී; උන්වැනි, වැඩ උන්නාක් වැනිවූ; ලකුණෙන්, (උතුම් දශීනීය) ලක්‍ෂණයෙන්; සපිරි, සම්පූර්ණවූ; සමාදි පිළිමය දක, සමාහිතවූ ප්‍රතිමාව දර්‍ශනය කොට; මිතුර, යහළුව; තුන් සිත, ත්‍රිවිධ චිත්තය; සමාදී කැරැ, එකඟ කොට නොහොත් ප්‍රසන්න කොට; වැදගන්, නමස්කාර කොට (කුශල) ග්‍රහණය කර.

---

66 දසදිග වැසිවස්නාවූ බුඩත්වයෙන් සවෙනිවූ සප්තාහයෙහි පෙණමඬලින් කරනලද සෙවෙන්ඇති මුචලින්දනම් නාරජුගේ දරණ නමැති ලැගුම්ගෙහි සර්‍වඥයන්වහන්සේගේ වැඩහිඳීම ජනයන්ගේ දෙනෙතෙහි අඳවන්නාවූ නාගප්‍රතිමාලයෙහිවූ ප්‍රතිමාවහන්සේ වන්‍දනය කළහොත් මනොඥයි.

67 සදහම් නමැති අමාව බෙදා දී සත්ත්වසමූහයා සසරබැම්මෙන් මුදා අප්‍රමාදිවූ සර්‍වඥයන්වහන්සේ සිත එකඟින් සුත්ව වැඩඋන්නාක් වැනි (උතුම් දැකුම් කටයුතු) ලකුණින් පිරුණවූ සමාධිප්‍රතිමාවහන්සේ දැක මිත්‍රය තුන්සිත එකඟ කොට වැඳ පින් ලබා ගනුව.

68 අප මු නි ඳු බුදුවන දින මුරුත් පි ඳු
පැහැ විහි ඳු දිලි කලධෞයටින් යෙ ඳු
සැ දි සි නි ඳු ඉඳුනිල්මිණි සතෙකබ ඳු
වැ ඳ දු මි ඳු වන පින්පල තඅත්බ ඳු

68 අප මුනිඳු, අපගේ (ගෞතම) සර්වඥරාජෝත්තමයාණන්වහන්සේ; බුදුවන දිනු, සර්වඥපදප්‍රාප්ත වන දිනයෙහි; මුරුත් පිඳු, දෙවතාවන් විසින් පූජාකරනලද්දාවූ; පැහැවිහිඳු, ආලෝක පතුරුවනලද; දිලි, දීප්තිමත්වූ; කලධෞ යටින්, කලධෞත යෂ්ටියෙන් හෙවත් රිදිමිටකින්; යෙදු, යොජිතවූ; සැදි, අලඞ්කෘතවූ; සිනිඳු, සනිග්ධවූ; ඉඳුනිල්මිණි සතෙක බඳු, ඉන්ද්‍රනීලමාණික්‍යච්ඡත්‍රයක් හා සමානවූ; දුමිඳු, බොධිද්‍රැම රාජයාන්වහන්සේ; වැඳ, නමස්කාර කොට; වන, සම්භවවන්නාවූ; පින් පල, පුණ්‍යඵලය; ත අත්බඳු, තාගේ හස්තප්‍රාප්ත කර; නොහොත් තා ගේ චිත්තයෙහි බන්ධනය කර.

69 වි ට ං ක පැකිලිඳු දකුණ්ස දෙරටුයෙ න
නි ස ං ක සෙන් පුදනත්තුරුගොසසම් න
ක ල ං ක නොවැ කළ සුබලකුණු බබල න
නි ව ං ක නම් දෙපිළිම නැමද බැසග න

69 විටංක, කොබෝගෙඩිවලල්ලෙහි; පැකිලි, ප්‍රස්ඵලිතවූ; ඉඳු, චන්ද්‍රයා ඇත්තාවූ; දකුණ්සදෙරටුයෙන, දක්ෂිණ දිශාභාගයෙහි ගොපුර වාරයෙන් (නික්ම); නිසංකයෙන්, නිශ්ශඞ්කායෙන් හෙවත් සැකනැතිව; පුදනත්තුරුගොසසමින, පූජාපිවූ නොයෙක් තූර්‍ය්‍යඝොෂයන් ශ්‍රවණය කෙරෙමින්; කලංකනොවැ, දෝෂයක් නැතිව; කළ, කරනලද්දාවූ; සුබලකුණුබබලන, ශුභලක්ෂණයෙන් භ්‍රාජිතවන්නාවූ; තිවංකනම්, ත්‍රිවඞ්ක යනනමින් ප්‍රසිද්ධවූ; දෙපිළිම, ප්‍රතිමාද්වය; නැමඳ, නමස්කාර කොට; බැසගන, (මාර්ගයට) අවතීර්ණව–

---

68 අපගේ (ශාක්‍ය) මුනීන්ද්‍රයන්වහන්සේ බුද්ධපදප්‍රාප්තවන දින යෙහි දෙවියන්විසින් (උන්වහන්සේට) පුදනලද්දාවූ රැස්විහිද දිලියෙන රිදිමිටකින් යුක්තවූ සරසනලද සිනිදුවූ ඉන්ද්‍රනීලමාණික්‍ය ඡත්‍රයක් හා සමානවූ බොධිද්‍රැමෙන්ද්‍රයා නමස්කාර කොට එයින් ජනිතවන පුණ්‍ය ඵලය තාගේ හස්තයෙහි බැඳ ගනුව නොහොත් තාගේ සිතෙහි තබා ගනුව.

69 (ඉනාඋස්ගෙයින්) කොබෝගෙඩිවලල්ලෙහි වැදුණු (හැපුණු) සඳමඬලඇති දකුණුදිගවාසලින් (නිකුත්ව) නිසැකව පුදපිණිස පවත්වන නොයෙක් තූර්‍ය්‍යඝොෂයන් අසමින් නිදොස්ලෙස කරනලද ශුභ ලක්ෂණයෙන් බබලන්නාවූ ත්‍රිවඞ්ක නමින් ප්‍රසිද්ධවූ පිළිමදෙදෙනාවහන් සේ වැඳ මඟට බැසගන-

70 ස ම න ළ ගිරිගිජිඳු දිගුකළ සොඬෙක සැ පි
සි හි ල ළු ගඟැ සිලිල් සනහා මුනිනොගැ වි
පැහැ දු ළු තුන්සිවුරු ඇඳ පෙරෙවැ වැඩසි ටි
තැනැක ළ සිවුරු දාගැබ වඳු නොපෑ පි ටි

**70** සමනළගිරි, සමන්තකූටපර්වතනමැති; ගිජිඳු, ගජේන්ද්‍රයාවිසින්; දිගුකළ, ප්‍රසාරිතවූ; සොඬෙකසැපි, ශුණ්ඩාදණ්ඩයෙන් බඳුවූ සටහන් ඇති; සිහිලළු ගඟැ, ශීතලජලයෙහිවූ ගඞ්ගායෙහි; නොගැවි, විතරාගවූ; මුනි, සර්වඥයන්වහන්සේ; සිලිල් සනහා, ජලස්නානය කොට; පැහැදුළු, (සඞ්ඛාවලාහක) ප්‍රභායෙන් දිලිහෙන්නාවූ; තුන්සිවුරු, ත්‍රිචීවරය; ඇඳපෙරෙවැ, නිවාසනප්‍රාවරණය කොට; වැඩසිටි, ස්ථිතිප්‍රාප්තවූ; තැනැ, ස්ථානයෙහි; කළ, විරචිතවූ; සිවුරු දාගැබ, චීවරධාතුගර්භයට; පිටි නොපෑ, පරාඞ්මුඛ නොවී; වඳු, නමස්කාර කර.

**71** නි රි ඳු න් කැලණිතිස් නිවැරදි රහත් තැ න
සැක යෙ න් ලැවූ හුණුතෙල්සැළ තුබූතැ න
බැති යෙ න් පිනැතියන් කළ විසිතුරුවිම න
වැ ඩ උ න් පිළිමහිමි නමදින් යහදස න

71 කැලණිතිස් නිරිඳුන්, කල්‍යාණිතිස්ස රජහුවිසින්; නිවැරදි රහත්තැන, නිරපරාධ රහත්තෙනකුන්වහන්සේ; සැකයෙන්, ( අග්‍රමහිෂින්කෙරෙහි සම්බන්ධ ) ශඞ්කායෙන්; ලැවූ, ප්‍රක්ෂෙපකරවූ; හුණු තෙල්සැළ, තප්තතෛලස්ථාලිය; තුබූ තැන, ස්ථාපිතස්ථානයෙහි; පිනැතියන්, පුණ්‍යාර්ථීන්විසින්; බැතියෙන්, භක්තියෙන්; කළ, කරනලද් දවූ; විසිතුරු විමන, විචිත්‍ර ( කර්මාන්තයෙන් යුක්තවූ ) විමානයෙහි; වැඩඋන්, උපවෙශනප්‍රාප්තවූ; පිළිමහිමි, බුද්ධප්‍රතිමාස්වාමීන්; යහදසන, ප්‍රියදර්ශනය; නමදින්, නමස්කාර කරන්.

---

**70** සුමනකූටපර්වතනමැති ඇත්රජුවිසින් දිගුකළාවූ සොඬක් හා සමානවූ ශීතස්පර්ශීය ජලවූ (කලණි) ගඞ්ගායෙහි වීතක්ලේශවූ සර්වඥයන් වහන්සේ ජලස්නානය කරවදූරා (සැඳැවලා) පැහැයෙන් දිලියෙන තුන් සිවුරු ඇඳ පෙරෙව වැඩසිටි ස්ථානයෙහි කරනලද විසිතුරුවූ සිවුරුදා ගැබ පිටි නොපා වන්දනය කර.

**71** කල්‍යාණිතිස්ස නරෙන්ද්‍රයන්විසින් නිරපරාධිවූ රහත්තෙන කුන්වහන්සේ සාපරාධයහ යන සැකයෙන් ( වධපිණිස ) බහාලූ උණු තෙල්සැළ පිහිටි ස්ථානයෙහි (පසුකාලයෙක්හි ) පින්කැමැත්තවුන්විසින් ( චෛත්‍යවශයෙන් ) කරවනලද විසිතුරු මන්දිරයෙහි වැඩහිඳිනඉරියව් වෙන් යුත් බුද්ධප්‍රතිමාවහන්සේ ප්‍රිය දකුම් ඇති මිත්‍රය නමස්කාර කර.

72 පි රි සි ඳ නොහැකි මෙවැඳුම්පුදපින්පඬු රු
ම න බැ ඳ රැගෙන දෙනලෙස දුක එසුරවි රු
සු ර ර ඳ පායවන් විජයොත්නම් මහ රු
එ ම ස ඳ වඩන රජගෙට මිතුර වැඩක රු

72 පිරිසිඳ නොහැකි, පරිච්ඡේදයක් කොට ගත නොහැක්කාවූ; මෙවැඳුම්පුද, මේ සත්කාරපූජායෙන් (ජනිතවූ); පින්, පුණ්‍යචෙතනා නමැති; පඬුරු, ප්‍රාභෘතය; එසුරවිරු, ඒ විඛ්‍යාතනම් සුරවීරයා; දුක, දර්ශනය කොට; දෙනලෙස, දානය කරනපරිද්දෙන්; මන, චිත්තයෙහි; බැඳ, බන්ධනය කොට; ඇරැගෙන, ආහරණග්‍රහණය කොට; සුරරද, ශක්‍රදෙව රාජයාගේ; මහරු, මහාහිවූ; විජයොත්නම්, වෛජයන්තනම්වූ; පාය වන්, ප්‍රාසාදය හා සමානවූ; රජගෙට, (දෙව) රාජභවනයට; වැඩකරු, අභිවෘද්ධිකරවූ; මිතුර, මිත්‍රය; එමසඳ, ඒ ක්ෂණයෙහිම; වඩන, ගමන ප්‍රාප්ත වන්නෙහි.

73 පු ලා සුවඳමලවුල් කැරැ වරල් බැ ඳ
දු ලා රන්පතින් සරසා සවන් සො ඳ
නි ලා දිගු නුවන් රසඳුන් තනා ඇ ඳ
බ ලා සිටු රඟන රඟමඬල කල්බ ඳ

73 පුලා, ප්‍රඵුල්ලවූ; සුවඳමල්, (ජාතිකහ්ලාරාදි) සුගන්ධපුෂ්ප යෙන්; අවුල් කැරැ, අකුල කොට (ගවසා); වරල්, කෙශකලාපය; බැඳ, බන්ධනය කොට; සොඳ, සුන්දරවූ; සවන්, කර්ණපාශය; දුලා, ප්‍රභාස්වරවූ; රන්පතින්, කනකපත්‍රයෙන්; සරසා, අලඞ්කෘත කොට; නිලා, නීලවර්ණවූ; දිගු, දීර්ඝවූ, නුවන්, නෙත්‍රයන්හි; රසඳුන්, රසාඤ්ජන යන්; තනා, අලඞ්කෘත කොට; ඇඳ, අඦ්ජිත කොට; රඟමඬල, රඞ්ග මණ්ඩලයෙහි; රඟන, නෘත්‍යය කරන්නාවූ; කල්බඳ, (නාටක) ස්ත්‍රීන්: බලා සිටු, අවලොකනය කොට අවස්ථානය කර.

---

72 අසඞ්ඛ්‍යෙයවූ හෙවත් (ගණනාවෙන්) සීමාවක් නොකලහැකිවූ මේ වන්දන පූජනයෙන් (හටගත්) කුශලකර්මනමැති පුදපඬුරු ඒ විඛ්‍යාත සුරෙන්ද්‍රයා දුක පිළිගන්වනලෙසින් සිත්හි තබාගෙන සක්දෙව්රජහු ගේ මාහැඟිවූ වෛජයන්තනම් ප්‍රාසාදය බඳු දෙවාලයට ඍද්ධිකාරිවූ මිත්‍රය එකෙණෙහිම යව.

73 පිපියාවූ (දෑසමන් හෙල්මැලි ආදී) සුවඳමලින් ගවසා කොණ්ඩය බැඳ යහපත්වූ කන්පෙති දිලෙන රන්පතින් සරසාගෙන නිල්දික් නෙත්‍රයන්හි රසඳුන් මනා කොට ඇඳ නෘත්‍යභූමියෙහි නැටුම් පවත් වන මනොඥ අඞ්ගනාවන් (මිත්‍රය) බලා සිටුව.

74 වි දෙ න ලෙළෙන නරුබර පුළුලුකුලැ රැ ඳී
හෙ ළ න නා ග න අතැ නුවනග බැලුම් දී දී
රු ව න දි ලෙ න අබරණ කැලුම ගතැ යෙ දී
සැ ලෙන ප හ න සිළු වැනි රඟන ලිය සැ දී

74 පුළුලුකුලැ, පෘථුලවූ ජඝනස්ථලයෙහි; රැඳී, රඤ්ජිතවූ; විදෙන, (සඞ්කොචභාවය හැර) විකසිත වන්නාවූ; ලෙළෙන, ලිලෝපෙත වන්නාවූ; නරුබර, අවලඞ්කාරයෙන් යුක්තවූ; හෙළන නඟන, උත්ක්ෂෙපණාවක්ෂෙපණ කරන්නාවූ; අතැ, හස්තයෙහි; නුවනගබැලුම් දිදී, නෙත්‍රප්‍රාන්ත දර්ශනය පවත්වා පවත්වා; රුවන, (පද්මරාගවජ්‍රකතාදි) රත්නයෙන්; දිලෙන, ජ්වලමානවූ; අබරණකැලුම, භූෂණකාන්තියෙන්; ගතැ, (හස්තපාදාදි) ගාත්‍රයෙහි; යෙදී, යුක්තවැ; සැදී, ( නාටිකාවෙශයෙන් ) අලඞ්කෘතවැ, රඟන, නෘත්‍ය කරන්නාවූ; ලිය, කාන්තාවෝ; සැලෙන, චලත්වූ; පහන සිළුවැනි, ප්‍රදීපශිඛාවන් මෙනි.

75 ලකල පුළුලුකුලැ බඳ මිණි මෙවු ල් ලා
සමඟ රන්සලඹ රැව්දී වෙවු ල් ලා
වයන පදට තබමින් පද කම ල් ලා
රඟන ළඳුන් බල රූසිරු සිය ල් ලා

75 ලකල, මනොඥවූ; පුළුලුකුලැ, විශාලවූ ශ්‍රොණිභාගයෙහි; බඳ, බන්ධනය කරනලද; මිණිමෙවුල්ලා, මාණික්‍යමෙඛලාද්‍රමය හා; සමඟ, එක්ව; රන්සලඹ, ස්වර්ණ නූපුරය; වෙවුල්ලා, කම්පාකොට; රැව් දී, ශබ්ද පවත්වා; වයන පදට, අතෝනා ( මද්දලධ්වනි ) පදයට; පදකමල්ලා; පාදපද්මයන්; තබමින්, වින්‍යාස කෙරෙමින්; රඟන, නෘත්‍ය කරන්නාවූ; ළඳුන්, කාන්තාවන්ගේ; රූසිරුසියල්ලා, සකල රූපසම්පත්තිය; බල, නිරීක්ෂණය කර.

---

74 පුළුල් උකුළු පෙදෙසෙහි රැඳුණාවූ (විටින් විට) පිපෙන ලෙළ දෙන බරවූ නරුපට ඇත්තාවූ, හෙළන්නාවූද ඔසවන්නාවූද දෙඅතෙහි නෙත් කෙළවර බැල්ම හෙළමින් ( රක්තමාණික්‍යාදි ) මැණිකින් දිලි සෙන අභරණයන්ගේ ශොභායෙන් ශරීරයෙහි යෙදුම් ඇතිව නිළිවෙසින් සැරසී නටන්නාවූ, ස්ත්‍රීහු චඤ්චලවන පහන්සිළු වැන්නාහුය.

75 සිත්කළුවූ පුළුල් උකුළෙහි බැනාලද මාණික්‍යරසනාද්‍රමයන් හා සමඟ ( පාදයෙහි වූ ) රන්සලඹ කම්පිත කොට නාද පවත්වා අත ගොමුකරන ( බෙර ) පදයට යොග්‍යලෙස පාපියුම් තබතබා නටන්නාවූ අඟනන්ගේ සියලු රූපශ්‍රිය බලව.

76 ව ස් දඹු බිඟු කොවුල් වීණා නද මියු රු
රැ ස් වූසෙයින් සත්සරරස ගී සොඳු රු
අ ස් වන ලියන් දැක ලියකිඳුරඟන් යු රු
තොස් කර තසිත සවනත නුවනත මිතු රු

76 වස්දඹු, වස්කුලල්ය; බිඟු, භෘඞ්ගය; කොවුල්, කෝකිලයා; වීණා, විපඤ්චිකාය යන මොවුන් සම්බන්ධිවූ; නද, නාදයන්ගේ; මියුරු, මාධුර්‍ය්‍යගුණය; රුස්වූ සෙයින්, රාශීභූතවූවාක්මෙන් හෙවත් එක්තැන්වූ වාක්මෙන්; සත්සරරස, ෂ-සෘ-ගා-ම-ප-ධෛ-නි යන සප්තස්වරරස යෙන් යුක්තවූ; සොඳුරු, (එහෙයින්ම) මනොඥවූ; ගී, ගීතිකාවන්; අස් වන, ශ්‍රාවණය කරන්නාවූ; ලියකිඳුරඟනයුරු, ලියකිඳුරුඅඞ්ගනාවන් වැනි වූ; ලියන්, කාන්තාවන්; දැකැ, දර්ශනය කොට; මිතුරු, මිත්‍රය; තසිත, තාගේ චිත්තයද; සවනත, ශ්‍රවණයද; නුවනත, නෙත්‍රයද; තොස් කර, සන්තොෂ කර.

77 මෙ සේ පැවැති අනතුරු ගිරුඟුම්පු ද
තො සේ සිතින් වැඩසිටි සුරවිමන් මැ ද
ය සේ පතල දියතුල උතුලු මනන ද
ඇ සේ පුරාංදකු විබිසණ සුරිඳුස ද

77 මෙසේ, යථොක්තප්‍රකාරයෙන්; පැවැති, ප්‍රවෘත්තවූ; ගිරුඟුම් පුද අනතුරු, ගීතනෘත්‍යපූජාවට අනන්තරව; තොසේසිතින්, සන්තොෂ චිත්තයෙන්; සුරවිමන්මැද, දෙවවිමානමධ්‍යයෙහි; වැඩසිටි, ස්ථාන ප්‍රාප්තවූ; දියතුල, ජගදභ්‍යන්තරයෙහි; පතළ, ව්‍යාප්තවූ; උතුළ, ඉහිර ගියාවූ; මනනඳ, මනොනන්දනීයවූ; යසේ, කීර්තිඇති; විබිසණසුරිඳුසඳ, විභීෂණ නම් සුරෙන්ද්‍රොත්තමයා; ඇසේ පුරා, දෘෂ්ටිපූර්ණය කොට; දකු, දර්ශනය කර.

---

76 වස්කුලල් බමර කොවුල් වීණා යන මොවුන් පිළිබඳ නාදයන් ගේ මිහිරිගුණය එකතුවූවාක් වැනි ෂඩ්ජ, ඍෂභ, ගාන්ධාර, මධ්‍යම, පඤ්චම, ධෛවත, නිෂාද යන සප්තස්වරරසයෙන් යුත් මනහර ගීතිකා අස්වන්නාවූ ලියකිඳුරුඅඟනන් බඳු ස්ත්‍රීන් දැක මිතුර තාගේ සිත් කන් නෙත් සතුටු කර.

"ෂඩ්ජ ඍෂභගාන්ධාරා මධ්‍යමඃ පඤ්චමස්තථා
ධෛවතශ්ච නිෂාදශ්ච ස්වරාඃ සප්ත ප්‍රකීර්තිතාඃ"

යනු භරතශාස්ත්‍රයි.

77 මේ කියනලදපරිද්දෙන් පැවැත්නාවූ ගීතනෘත්‍යපූජායෙන් පසු දෙවවිමානමධ්‍යයෙහි සතුටුසිතින් වැඩසිටියාවූ ලොකාභ්‍යන්තර යෙහි පැතිර ඉහිරගිය මනොඥ කීර්තිඇති විභීෂණදිව්‍යරාජයාණන් ඇස පුරා දැක ගනුව.

78 පැ මි ණ සිරි අඳුන් ගිරිකුළුමුදුන්වෙ ත
රෙ හෙ ණ නකත් ගැලසිරි විලසින් දිමු ත
ස ර ණ මුළුලොවට එසුරිඳු සිරසප ත
ක ල ණ කිරුළ දිසි මුතුලැල් රුවන්යු ත

78 අඳුන්ගිරිකුළුමුදුන්වෙත, අඤ්ජනපර්වතකූටමස්තකයක්හුගේ සමීපයෙහි; පැමිණිසිරි, ප්‍රාප්තවූ සිරියාවූ; රෙහෙණිනකත් ගැලසිරි, රොහිණිනක්ෂත්‍රශකටශ්‍රීහුගේ; විලසින්, විලාසයෙන්; දිමුත, දීප්තිමත්වූ; මුළුලොවට, සමස්තලොකයට; සරණ, ප්‍රතිෂ්ඨාධාරවූ; එසුරිඳු, ඒ විභිෂණනම් සුරෙන්ද්‍රයාගේ; සිරසපත, මූර්ධයෙහි නියුක්තවූ; මුතුලැල්, මුක්තාලතිකායෙන් හා; රුවන්යුත, රත්නයෙන් යුක්තවූ; කලණ කිරුළ, ස්වර්ණකිරීටයතෙම; දිසි, දෘශ්‍යමාන වී.

79 සු නි ලේ පැහැය හැරැ සුදුවනුය ගනවෙ ලේ
වි දු ලේ එසින් වියොවට පැමිණ වියවු ලේ
නි ස ලේ එමේසිරි ගත් සුරිඳුනැමක ලේ
උ දු ලේ දෙහෝ රන්පටමෙන් නලල්තෙ ලේ

79 ගන, සාන්ද්‍රවූ; වෙලේ, වලාහකතෙම; සුනිලේ, අතිනීලවූ; පැහැය, ප්‍රභාව; හැරැ, හරණය කොට හෙවත් පරිත්‍යාගකොට; සුදු

---

78 අඳුන්වන් (නිල) පර්වතකූටයක්හුගේ මුදුන් අහසෙහි පැමිණි සිරි රෙහෙණිනකත සම්බන්ධ ශකටශ්‍රීයගේ ආකාරයෙන් දිලියෙන් නාවූ මුළුලෝවැස්සන්ට පිහිටවූ ඒ විභීෂණදෙව්රජහුගේ සිරසෙහි පල ඳනාලද මුතුලැලින් හා මාණික්‍යයෙන් යුත් රන් වොටුන්න දක්නා ලැබේ.

රෙහෙණිනකත වනාහි ශකටාකාරයෙන් පිහිටි පංචතාරාත්මක නක්ෂත්‍රයෙකි. එහෙයින් "ගැලසිරිවිලසින්" යි ජ්‍යොතිසතන්ත්‍රොක්ති සලකා කීහු.

"තුරගමුඛසදෘශං යොනිරූපං ක්ෂුරාභං
ශකටනිභමථෛණස්‍යොත්තමාංගෙන තුල්‍යම්"

යනාදීන් නක්ෂත්‍රස්වරූප දක්වූපරිදි දතයුතු.

79 ඝනවූ මෙඝය තෙම (තමාගේ) ඉතා නිල්වූ වර්ණය හැර (ශරත්කාලයෙහි) සුදුපැහැඇති වන්නේය. ඒ වර්ණවිපර්‍යාසය හෙතු කොටගෙන (මෙඝයාගේ පත්නීවූ) විදුලි තොමෝ ( හිමියා හැඳින ගත නොහී) වියොගයට පැමිණ (එම) වියවුල හෙතුකොටගෙන (හිමියා අත් හැර) සියලුකාලයෙහි නිශ්චලවූ නීලමෙඝයක්හුගේ ශොභාව ගත් ඒ විභීෂණ දෙව්රජහුගේ නළල්තෙලෙහි රන්පට වැනිව බබළන්නීද්‍යෙ හොයි (හඟිමි).

විනුය, ශුභ්‍රවර්ණ වන්නේය; එයින්, ඒ (වර්ණවිපර්‍ය්‍යාසවන්නාවූ) කාරණයෙන්; විදුලේ, විද්‍යුල්ලෙඛාතොමෝ; වියොවට පැමිණ, (ඒ මෙඝනමැති වල්ලභයා හා එක්ව ශරත්කාලයෙහි) වියොගයට පැමිණ; වියවුලේ, ව්‍යාකූලයෙන්; ඇමකලේ, සඳකාලයෙහි; නිසලේ, නිශ්චලවූ හෙවත් අනාවර්ණයකට නොපැමිණෙන්නාවූ; මේසිරි ගත්, මෙඝශ්‍රිය ධැරුවාවූ; එසුරිඳුන්, ඒ සුරෙන්‍ද්‍රයාණන්ගේ: නලල්තෙලේ, ලලාටස්ථලයෙහි; රන්පට වෙස්, උෂ්ණීෂපට්ටාකාරයෙන්; උදුලේ දෙ හෝ, බබළන්නී දෙ හෝ.

80 රු වි නේ උතුම් එසුරිඳු මිණිඊල මෙ නේ
ස ව නේ රැඳුණු රසුදුල තෝඩු ගනර නේ
වු ව නේ වැජඹි සිරිසරසවිය හැමදි නේ
සොබ නේ කනා කැටපත්යුවළ විලසි නේ

80 රුවිනේ උතුම්, රූපයෙන් උත්තමවූ; එසුරිඳු, ඒ සුරෙන්‍ද්‍රයාගේ; මිණිඊල මෙනේ, (ඉන්ද්‍රනීල) මාණික්‍ය දෙලාවන් වැනිවූ; සවනේ, කර්ණපාශයෙහි; රැඳුණු, රඤ්ජිතවූ; රසුදුල, රශ්මියෙන් උජ්ජ්වලිතවූ; ගනරනේ, ඝනකනකමයවූ; තෝඩු, තාඩඞ්ක (යුග්මය) තෙම; වුවනේ, මුඛ (පද්ම)යෙහි; හැමදිනේ, සඳකාලයෙහි; වැජඹි, විජෘම්භිතවූ; සිරිසරසවිය, ශ්‍රී සරස්වතී දෙදෙනාගේ; කනාකැටපත්යුවළ, ස්වර්ණබිම්බයවූ දර්පණයුග්මයක්හුගේ; විලසිනේ, විලාසයෙන්; සොබනේ, ශොභමාන වන්නේයි.

81 න ම ක ළ ස ත හැ ලේ සි හි ලේ සැපසිලි ලී
බි ය සෙ ණ රූ පු කැ ලේ තු මු ලේ දෙනනොක ලී
න ල ල ත ගි රි තෙ ලේ සු නි ලේ රැසිනිපි ලී
සු ර ර ද දෙ බැ ම ලේ ග න ලේ සිරි කිය ලී

81 නමකළ, නමස්කාර කළාවූ; සත, සත්වනමැති; හැලේ, ශාලික්ෂෙත්‍රයන්ට; සිහිලේ, ශීතලවූ; සැපසිලිලී, සම්පත්ති නමැති ජලධාරාවන්ද; තුමුලේ, මහත්වූ: රූපුකැලේ, ශත්‍රුගුල්මයට–හෙවත් සතුරු

---

80 රුවින් උතුම්වූ ඒ දෙව්රජහුගේ කන්පෙතිසිදුරෙහි රැඳුණාවූ ඉඳුනිල්මිණි ඔබ්බලි දෙකක් බඳ ගනරන්තෝඩු යුවළතෙමේ (ඒ සුරෙන්‍ද්‍රයාගේ) මුහුණෙහි හැමවේලෙහි වැජඹෙන ශ්‍රී සරස්වතී යන දෙවඟනන් දෙදෙනාගේ රන් කැටපත් දෙකක් මෙන් බබළන්නේය.

81 වන්‍දනය කළාවූ සත්වසමූහ නමැති ඇල්කෙත්වලට සම්පත් නමැති සිහිල්ජලයද, මහත්වූ සතුරු නමැති පඳුරට හෙවත් වනලැහැබට අනිෂ්ටවූ භය නමැති සෙණද (යථාක්‍රමයෙන්) දෙන්නාවූ නලල්තල

නමැති වනලැහැබට; පොකලී, අමනොඳෙවූ; බියසෙණි, භය නමැති නිශ්‍රිතයන්ද; දෙන, දුන ය කරන්නාවූ; නළලත, ලලාට නමැති; ගිරිතෙලේ, පර්වතතලයෙන්; සුඃනිලේරුසින්, අතිනිල කාන්තියෙන් (උපලක්ෂිතව); ඉපිලී; උද්ගතවූ; සුරරද දෙබැම්ලේ, සුරේන්ද්‍රයාගේ භ්‍රෑලෙඛායුග්මය තෙම; ගනලේසිරි ඇඹියලී, මේඝාවලීන් (දෙඟදනකුන්ගේ) ශොභාව ප්‍රකාශ කෙළේයි.

82 සතු රු සුර්අඳුරු එකපැහැර දුරු ක ළ
මිතු රු තඹුරුවන නිරතුරු පුබුදු ක ළ
අතු රු තුසර සිඳුවන දූකුමෙන් පහ ළ
ළහි රු සිරින් දිලිහිණි හිමි නෙත්සග ළ

82 සතුරු, විරුඬවූ; සුර, දෙවතා නමැති; අඳුරු, අන්ධකාරය; එකපැහැර, එකප්‍රහාරයෙන්; දුරුකළ, නිරසනය කළාවූ; මිතුරුතඹුරුවන, මිත්‍ර නමැති තාමරසවනය; නිරතුරු, නිරන්තරයෙන්; පුබුදුකළ, ප්‍රබුඩ කළාවූ; පහළ, ප්‍රකාශවූ; අතුරු, අන්තරාය නමැති; තුසර, තුෂාරබින්දුන්; දූකුමෙන්, දර්ශනයෙන්; සිඳුවන, ශුෂ්ක කරවන්නාවූ; හිමි, ස්වාමීහුගේ; නෙත්සහළ, නෙත්‍රයුග්මයතෙම; ළහිරුසිරින්, බාලාර්ක(මණ්ඩල) ශොභායෙන්; දිලිහිණි, ජ්වලිත විණි.

83 ය ස ගා න කළ තැන තැන සිඳහනන් සැ දී
නොළ හා එහිමි දිගුතුඟු නැහැයට වොරැ දී
ස ම හා රදුන් දෙවියන් සෙවුමින් නිසැ දී
මූ ර ගා අහෝ මිණිකාලම වෙහෙස වි දී

83 සැදී, අලඞ්කෘතවූ; සිදඟනන්, සිඬාඞ්ගනාවන්විසින්; තැනතැන, ඒ ඒ ස්ථානයෙහි; ගාන කළ, ගානය කරනලද්දාවූ; යස, කීර්තිඇත්තාවූ;

---

නමැති පර්වතසමීපයෙන් ඉතා නිල්පැහැයෙන් යුත්ව නැංගාවූ දෙවිරජහු පිළිබඳ බැමරොදයුවළතෙමේ වලාපෙළ දෙකක්හුගේ ශොභාව පහළ කෙළේය.

82 විරොධිවූ දෙවතා නමැති අඳුරු එකවිටම දුරුකළාවූ මිත්‍රවූ දෙවතා නමැති පියුම්වනය නිතර ප්‍රබොධ කළාවූ පැනෙන අනතුරු නමැති පිනිබිඳුන් දැක්මෙන් වියළවන්නාවූ දෙවස්වාමිහුගේ නෙත්යුවළ තෙම තරුණ සූය්‍යීබිම්බයුග්මයක්හුගේ ශොභායෙන් දිලුණේය.

83 සැරසුණාවූ සිඬජාතික අඞ්ගනාවන්විසින් තන්හි තන්හි ගානය කළාවූ කීර්තිඇති ඒ විභීෂණ දෙවිරජහුගේ දික්වූද උස්වූද බබළන්නාවූ නාසිකාවට (හැඩහුරුකමින්) ළං නොව හෙවත් ළංවිය නොහැකිව මැණික් හොරනාව රජුන් හා ද දෙවියන් හා ද එකතුව නිරතුරු (ඔවුන්) සෙවනය කෙරෙමින් මුරගා (අභිමතසිඬිය පිණිස) වෙහෙස විඳියි. අදෝමය.

එහිම්, ඒ ( දිව්‍ය ) රාජයාගේ; දිගු, දිඝීවූ; තුංගු, උත්තුඞ්ගවූ; වොරැදි, විරාජමානවූ; නැගැසට, නාසිකාවට; නොලහා, ( ආකාරසාදෘශ්‍යයෙන් ) ආසන්නනොවී; මිණිකාලම, මාණික්‍යකාහලයෙයෙව; රදුන්, රජදරුවන් හා; දෙව්සන්; දෙවතාවන් හා; සමහා, එක්වැ; නිසැදි, නිරන්තරයෙන්; සෙවුමින්, සේවනය කෙරෙමින්; මුරහා, උද්ඝෝෂණය කොට; වෙහෙස විඳි, දුක් විඳිනේය; අහෝ, ඛේදයෙකි.

84 සිරිසර හිඟුල්විලැ සේහසවැලෙව් ගන
සුරවර සලෙල රතලවනත දල දුල න
මනහර සඳවලාපෙළ කෙලවර පෙනෙ න
පැහැසර ලසඳ යුවලෙක් ඇත්නම් එමෙ න

84 සිරිසර, ශ්‍රීසාරවූ; හිඟුල්විලැ, ජාතිහිඞ්ගුලතටාකයෙක්හි *; ගන, සාන්ද්‍රවූ; සේහසවැලෙව්, ශ්වේතහංසාවලි (යුග්මයක්) හා සමානවූ; සුර වර, දිව්‍යරාජයාගේ; සලෙල, ලීලාසහිතවූ; රතලවනත, රක්තාධරාන්තයෙහි; උදුලන, දිලිහෙන්නාවූ; දල, දංෂ්ට්‍රා ( යුග්මය )තෙම; මනහර, මනොඥවූ; සඳවලාපෙළ, සන්ධ්‍යාභ්‍රපඞ්ක්තියාගේ; කෙලවර, අවසානයෙහි; පෙනෙන, දෘශ්‍යමානවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ලසඳ යුවලෙක්, බාලචන්ද්‍රයුගලයෙක්; ඇත්නම්, විද්‍යමාන වීනම්; එමෙන, ඒ හා සමානයි.

85 කනා මිණිවලලු නැගිරැස් මල් කැනැ ති
මනා දිගු ඇඟිලි නව තඹ ලපලු ඇ ති
දනා කැමැති දෙන පලඹත එසුරප ති
දිනා දිමුතු අතුසිරි සුරතුරැ පැවැ ති

85 කනාමිණිවලලු, කනකමාණික්‍ය නිර්මිතවූ කටකයෙන්; නැගි, උද්ගතවූ; රැස්, රශ්මි නමැති; මල්කැනැති, පුෂ්පස්තවකයන් ඇත්තාවූ;

84 ශොභාවෙන් සාරවූ දැහිඟුල් ( සාදිලිඞ්ගම් ) විලෙක්හි ඝනව පෙළ සැදී සිටි ශ්වේතහංසයන් දෙපෙළක් හා සමානවූ, දෙව්රජහුගේ ලීලොපෙත රක්තවණී අධරයුග්මයාගේ කෙළවරෙහි දිලියෙන්නාවූ, දළයුවළතෙම; සිත්කලුවූ සැඳැවලාපෙළදෙදෙනක්හුගේ අනතයෙහි පැනෙන්නාවූ දීප්තිමත් තරුණ සඳමඬලදෙකක් ඇත්තේ වීනම් එවැනි වේ.

(මේ පද්‍යය වාක්‍යාර්ථොපමා අද්භූතොපමා යන අලඞ්කාර දෙකකින් අලඞ්කෘතයැ. පළමුවන අලඞ්කාරයෙහි උපමෙයවූ අධරයුග්මයට හිඟුල් විල උපමායැ, උපමෙයවූ දංෂ්ට්‍රායුග්මයට සේහසවැල උපමායි. දෙවන අලඞ්කාරයෙහි අධරයුග්මයට සඳවලාපෙළ උපමායැ. දංෂ්ට්‍රායුග්මයට ලසඳයුවල උපමායි.)

85 රන්මැණික් වළලුවලින් නැංගාවූ කාන්තිනමැති මල්පොකුරු ඇති, යහපත් දික්ඇඟිලි නමැති අලුත් තඹවන් ළදළුඇති; සත්වයන්ට

* "කටාක" යනුත් තඩාග ශබ්දයාගේම පුරාතන පාඨාන්තරයෙකි.

මනා, යහපත්වූ; දිගුඇඟිලි, දීර්ඝාඞ්ගුලි නමැති; නව, අභිනවවූ; තඹ, රක්තවර්ණවූ; ළපලුඇති, බාලපල්ලවයන් ඇත්තාවූ; දනා, ජනයන්ට; කැමැති දෙන, අභිමතවස්තුප්‍රදානය කරන්නාවූ; එසුරපති පලඹන, ඒ විභීෂණසුරේන්ද්‍රයාගේ ප්‍රලම්බ හස්තයතෙම; සුරතුරු පැවැති, කල්ප වෘක්ෂයෙහි ප්‍රවෘත්තවූ; දිලිතු, දීප්තිමත්වූ; අතුසිරි, ශාඛාවන්ගේ විභූතිය; දිනා, ජය ගන්නේයි.

86 පා නා සෙනේ සසිනිදු මදලස බැ — ල් ම
ගා නා නිමැහමෙව් දෙවඟන නෙත්කැ ල් ම
නා නා සුරිඳු පුළුලුර සිරිසඳ ඇ ල් ම
නු නා කෙළන ගලතල වැනි ඉඳුනි ල් ම

86 දෙවඟන, දිව්‍යාඞ්ගනාවන්ගේ; සෙනේ පානා, සෙනහය ප්‍රකාශකරන්නාවූ; සසිනිදු, සුස්නිග්ධවූ; මදලසබැල්ම, මන්දාලසාක්ෂ නිරීක්ෂණය කරණකොටගෙන; ගානා, ආලෙපකරන්නාවූ; නිමහ මෙව්, සමාප්තිකර්මයෙහි කරනලද අඤ්ජනරේඛාවන් හා සමානවූ; නෙත්කැල්ම, නෙත්‍රකාන්ති නමැති(ජලයෙන්); නානා, ස්නානය කරන්නාවූ; සුරිඳු පුළුලුර, (ඒ) ඉන්ද්‍රයාගේ පෘථුලවූ වක්ෂඃස්ථලය; සිරිසඳ, ශ්‍රීකාන්තාවවිසින්; ඇල්ම, අනුරාගය; නුනා, විමුක්ත නොකොට; කෙළන, ක්‍රීඩාකරන්නාවූ; ඉඳුනිල්ම, ඉන්ද්‍රනීලමාණික්‍යමයවූ; ගලතලවැනි, ශිලාතලයක් මෙනි.

87 ල කු එ පුළුලුකුළු වටබිම එසුරවි රු
වෙ ර එ මිණිකැලුම් පතරින් මෙවුලතු රු
නැ මු එ සොඳුරු සසිල්වු වටොර රඹතු රු
බැ බ එ සිල්බිල් ඉසිනාවිලස සිරි දු රු

87 එසුරවිරු, ඒ විභීෂණනම් සුරෙශ්වරයාගේ; පුළුලුකුලවටබිම, පෘථුලවූ ශ්‍රොණිවෘත්තනාමැති භූමියෙහි; ලකුළු, අලඞ්කෘතවූ; මෙවුලතුරු, මෙඛලාන්තරයෙහි; වෙරළුමිණිකැලුම්පතරින්, වෛදූර්‍ය්‍යමාණික්‍ය කාන්තිසමූහය කරණකොටගෙන; නැඹුළු, මහත්වූ; සොඳුරු, සුන්දරවූ;

කැමැති දෑ දෙන්නාවූ, ඒ විභීෂණ දෙව්රජහුගේ එල්ලෙන්නාවූ හස්ත යුග්මයතෙම; කප්රුකෙක්හිවූ දිලියෙන අතුදෙකක්හුගේ ශොභාව පරදවයි.

86 දෙවඟනන්ගේ ප්‍රෙමය පහළකරන ඉතාසිනිදු මඳක් මැළිවූ බැල්ම කරණකොටගෙන සිත්හම්නිමාමෙහි කරන අඳුන්රේඛාවැනි නෙත්කැලුම් නමැති ජලයෙන් පවිත්‍රවන්නාවූ ඒ දෙව්රජුගේ පුළුල්වූ ළයතෙම ශ්‍රීකාන්තාවවිසින් ආලය අඩුනොකොට ක්‍රීඩනය කරනුලබන ඉඳුනිල්මිණිමුවා ගලතලක් මෙනි.

87 ඒ විභීෂණදෙව්රජහුගේ පුළුල්වූ වටවූ උකුල නමැති භූමියෙහි අලඞ්කාරවත්වූ මෙවුල්දමෙහිවූ වෛදූර්‍ය්‍යමාණික්‍යයන්ගේ රශ්මිසමූහය කරණකොටගෙන මහත්වූ යහපත්වූ ඉතාසිලිටුවූ වටවූ උරුයුග්මය

සසිලිටු, සුශ්ලිෂ්ටවූ; වටොරරඹතුරු, වෘත්තවූ ඌරු (වන්වය) නමැති රම්භාවෘක්ෂයෝ දෙදෙන; බැබළු, භ්‍රාජිතවූ; සිලිල්ඉසිනා විලසසිරි, ජලසෙචනය කරනුලබන්නාවූ විලාසශොභාව; දුරු, ධැරුවාහුයි.

88 ව ඳ නා සුරන් කිරුළඟ රුවන කැලුමෙ නා
බ ඳ නා කොමළ ලතුවිලසල රතින් ම නා
ම ඩ නා බැවින් සියපත එහිම්පතුලෙ නා
බි යෙ නා ලතඹ හෝපලු සදිසි වෙවුල නා

88 වඳනා, නමස්කාර කරන්නාවූ; සුරන්, දෙවතාවන්ගේ; කිරුළඟ, කිරීටාග්‍රයෙහි; රුවනකැලුමෙනා, ( පද්මරාග ) මාණික්‍යකාන්තීන් හෙතුකොටගෙන; බඳනා, බන්ධනය කරන්නාවූ; කොමළ, මනොඥවූ; ලතුවිලසළ, අලක්තකරසවිලාසය එළවූ; රතින්, රක්තවර්ණයෙන්; මනා, යහපත්වූ; එහිම්පතුලෙනා, ඒ ස්වාමිහුගේ පාදතලයෙන්; සියපත, පද්මය දෙහෝ කොහොත් පද්මපිඨය; මඩනාබැවින්, මර්දනය කරන භාවයෙන්; ලතඹහෝපලු, බාලවූ රක්තාශොකපල්ලවයෝ; බියෙනා, භීතියෙන්; වෙවුලනා සදිසි, කම්පාවන්නවුන් වැන්නාහුයි.

89 වෙසෙසි න් පහන් පැහැසර ගැඹුරු පිවිතු රු
බැ ලු ව න් ඇළුම්කරවන යළිඳු බියක රු
සි රි පි න් රුවන්පිරි එසුරිඳු සයුරයු රු
මු වෙ කි න් කියා නිමවිය හැක්ද රුසි රු

89 වෙසෙසින්, විශෙෂයෙන්; පහන්, ප්‍රසන්නවූ; පැහැසර, ප්‍රභාස්වරවූ; ගැඹුරු, ශීතොෂ්ණාදි දුඃඛපීඩා සහනය කරනහෙයින් ගම්භීරවූ; පිවිතුරු, පවිත්‍රවූ; බැලුවන්, අවලොකනය කරන්නවුන්; ඇළුම්කරවන,

---

නමැති කෙසෙල්රුක්දෙදෙනා බබළන්නාවූ දියවත්කරනුලබන ශොභාව ධැරූහ.

88 වඳනා කරන දෙවියන්ගේ වොටුනුඅක්හිවූ (රක්ත) මාණික්‍යයන්ගේ කාන්ති හෙතුකොටගෙන අලෙප කරනුලබන වොළොක් ලතුදිය ශොභාව පැවාවූ රත්පැහැයෙන් මනොඥවූ ඒ ( විනිෂණ දෙව ) ස්වාමිහුගේ පතුලෙන් (රක්ත) පද්මය දෙහෝ නොහොත් පද්මාකාරවූ පාපුටුව මඩනාබැවින් තරුණවූ රක්තවර්ණවූ හොපලුදළු භයින් වෙවුලන්නවුන් වැනි වෙත්.

මෙහි ප්‍රකෘති ආකාරයෙන් වන හොපලුදළුසැලීම බියෙන් වෙවිලීමෙකැයි කවිහුවිසින් උත්ප්‍රෙක්ෂිත (සලකනලද) හෙයින් මේ උත්ප්‍රෙක්ෂාලංකාරයෙක් අලංකෘතයි.

89 ඉතාම ප්‍රසන්නවූ ප්‍රභා නිකුත්වන්නාවූ ( දුක්පීඩා ඉවසියහැකි හෙයින් ) ගැඹුරුවූ පිරිසිදුවූ දුටුවන් ප්‍රියකරවන්නාවූ යළිත් ( දුටුවන් ) බියකරවන්නාවූ ශ්‍රීමත් පූර්ණලක්ෂණ නමැති රත්නයෙන් පිරුණවූ

ප්‍රෙමඇතිකරවන්නාවූ; යළිදු, නැවතද; බියකරු, භයඞ්කරවූ; සිරිපින්, ශ්‍රීසෞභාග්‍යපුණ්‍යසම්පත්ති නමැති; රුවන්පිරි, රත්නයෙන් සම්පූර්ණවූ: නොහොත්-සිරි, ලක්‍ෂ්මියගෙන් හා; පින්, පවිත්‍රවූ, රුවන්, රත්නයෙන්; පිරි, සම්පූර්ණවූ; සයුරපුරු, සාගරයට බඳුවූ ආකාර ඇති; එසුරිඳු, ඒ සුරෙන්‍ද්‍රයාගේ; රුසිරු, රූපසම්පත්තිය; මුවෙකින්, එක මුබයෙකින්; කියා, කථනය කොට; නිමවියහැකිද; සමාප්තියට පැමිණවිය හැක්ශක්ද(නොහැක්කේමැයි.)

90 ලෙ වී හට තමන් නම කීව රිසි දෙනවි සි නි
දෙ වී තුරු සුරබි සුරම්ණි සරිද කෙලෙ සි නි
ප වි රෝදුකුදු දුරලන පොකුරඹහ සි නි
දෙ වි වෙද ඇසෙන පමණෙකි වියතුන්බ සි නි

90 තමන් නම කිව, තමන්ගේ විභීෂණයයි යන නාමය උච්චාරණය කළකල්හි; ලෙව්හට, ලොකවාසීන්ට; රිසිදෙනවිසිනි, අභිමතාර්ථප්‍රදානය කරන හෙයින්; දෙව්තුරු, මන්දාරාදි කල්පවෘක්‍ෂය; සුරබි, කාමධෙනුය, සුරම්ණි, චින්තාමාණික්‍යය යන මොහු; කෙලෙසිනි, කවරප්‍රකාරයෙකින්: සරිද, සදෘශ වෙත්ද; පොකුරඹහසිනි, පුෂ්කරපත්‍රයෙහි (ලග්න නොවන්නාවූ) ජලයක් මෙන්; පව්රෝදුකුදු, පාපදුඃඛය හා රොගදුඃඛයද (යන දෙෂයන්); දුරලන, නිරාකරණය කරන්නාවූ; දෙව්වෙද, නාසත්‍යයහ යන දෙව්වෛද්‍යයන් දෙදෙනාකු (ඇතැයි කියා); වියතුන් බසිනි, ශාස්ත්‍රකාරකයන්ගේ වචනයෙන්; ඇසෙනපමණෙකි, ශ්‍රවණවිෂය වන මාත්‍රයෙක්මැයි.

91 ම න් පිනවන යස සිරි තෙද නැණ විපු ල
සෙ න් යුද ජය රජබව තනතුරු සිය ල
දෙ න් තෙන් පැතුවිට සුබවැඩ දිගා බ ල
පි න් නම් සතුන්කල දෙව්රජමය මෙක ල

91 මන්පිනවන, මනඃප්‍රීණනය කරවන්නාවූ; යස, කීර්තිය; සිරි, ඓශ්වර්‍ය්‍යය; තෙද, තෙජසය; විපුල නැණ, මහත්වූ ප්‍රඥාව; සෙන්, සෙනාය;

---

නොහොත් සෞභාග්‍යයෙන් හා පවිත්‍රවූ රත්නයෙන් පරිපූර්ණවූ සමුද්‍රයට බඳු ආකාරඇති ඒ (විභීෂණ) දෙව්රජහුගේ රූපශ්‍රිය (එක්) මුබයෙකින් කියා (කෙසේ) නිමවිය හැකිද (නොහැකි මැයි).

90 තමන්ගේ (විභීෂණය යන) නාමය කීකල්හි ලෝවැස්සන්ට කැමැතිදෑ දෙනහෙයින් කල්පවෘක්‍ෂ සුරභිධෙනු චින්තාමාණික්‍ය යන මොහු (මේ විභීෂණ දෙව්රජහු හා සමහ) කෙසේ නම් සමාන වෙත්ද ? (නොවෙත්මය.) නෙළුම්පතෙහි නොඇලෙන ජලයක් මෙන් පව් දුක් හා රෝදුක් දුරුකරන්නාවූ අශ්වින් යන නමැති දෙවවෛද්‍ය දෙදෙනාකු (ඇතිබව) ශාස්ත්‍රඥයන්ගේ කියමනින් ඇසෙන පමණෙකි. ( මේ දෙව්රජතෙම ප්‍රත්‍යක්‍ෂවම පාපරොගදුඃඛයන් දුරලන්නේයැ සිසේයි.

91 සිත පිනවන්නාවූ යස ඉසුරු තෙද මහනුවණ සේනා යුධජය රාජ්‍යලාභ (සෙනෙවිආදි) තනතුරු මඞ්ගලාභිවෘද්ධි දීර්ඝායුෂ් ශරීරශක්ති

සුදජය, යුධයෙහි ජයගැන්මය; රජබව, රාජ්‍යප්‍රාප්තිය; සියල සෙන තුරු, (සෙනාපත්‍යාදි) සකලස්ථානාන්තරය; සුබවැඩ, මඞ්ගලාභිවෘද්ධිය; දිගා, දීර්ඝායුෂය; බල, කායශක්තිය යන අභිමතාර්ථයන්: පැතුම්ට, ප්‍රාර්ථනා කළ කාලයෙහි; දෙන්නෙන්, ප්‍රදානය කරනහෙයින්; සතුන්කළ පින් නම්, සත්වයන්විසින් කරනලද (අනවද්‍යඉෂ්ටවිපාකලක්ෂණවූ) කුශලකර්‍ම නම්; මෙකල, මේ කාලයෙහි; දෙවිරජමය, විභීෂණ දිව්‍යරාජයා මැයි.

| | | | |
|---|---|---|---|
| 92 | තු න් | ලෝ තමා නතුකළ රවුළු සොහොවු | රු |
| | තු න් | කල් බලා රම්ඳුට වූ ඉටුමිතු | රු |
| | තු න් | වේඇදුරු පුලතිසිකුල මිණිමිතු | රු |
| | තු න් | විටෙකම වඳු එසුරිඳු පාතඹු | රු |

92 තුන්ලෝ, ස්වර්ග මනුෂ්‍ය පාතාල සඞ්ඛ්‍යාත භුවනත්‍රයවාසීන්; තමා නතුකල, තමහට අවනතකළාවූ; රවුළු සොහොවුරු, රාවණමහා රාජයාහට සහෝදරවූ; තුන්කල් බලා, (භූත භවිෂ්‍යද් වර්‍තමානය යන) කාලත්‍රය පරීක්ෂා කොට; රම්ඳුට, ශ්‍රීරාමචන්‍ද්‍රයාහට; ඉටුමිතුරු වූ, කල්‍යාණ මිත්‍රවූ; තුන්වේඇදුරු, ( ඍග් යජුස් සාම යන ) වේදත්‍රයට ගුරුවූ; පුල තිසිකුල, පුලස්ති මහර්ෂිහුගේ වංශයට; මිණිමිතුරු, රත්නප්‍රදීපායමාන වූ; එසුරිඳු, ඒ ( විභීෂණ ) දිව්‍යරාජයාගේ; පාතඹුරු, පාදපද්මය; තුන්විටෙකම, ත්‍රිවාරයක්ම; වඳු, නමස්කාර කර.

| | | |
|---|---|---|
| 93 | අනතුරු බලා අදහස අවසර විග | ස |
| | සුහුසුලුනොවී සලකා පසු පලමු බ | ස |
| | පෙරදූරිකොට සුරිඳුට තියුවදන්ගො | ස |
| | සැලකර තබිය කටයුතු සිට එකත්ප | ස |

93 අනතුරු, තදනන්තරව; අදහස, ( ඒ දෙවරාජයාගේ ) අධ්‍යාශයද; අවසරවිගස, අවකාශක්ෂණයද; බලා, අවලොකනය කොට; සුහු සුලු නොවී, ත්වරිතභාවයෙන් චාපල්‍යයට නොපැමිණ; පසුපලමුබස, පූර්‍ව

---

යන කැමැති දෑ පැතුකෙණෙහිම දෙනහෙයින් ජනයන්විසින් කරන ලද පින නම් මේ කාලයෙහි මේ විභීෂණ දිව්‍යරාජතෙමේ මැයි.

92 දෙව්ලොව මිනිස්ලොව නාලොව යන තුන්ලොව වැස්සන් තමා වශග කළාවූ රාවණමහරජහට සහොදරවූ අතීතානාගතවර්‍තමාන යන තුන්කාලය බලා ( රාමරාවණයුධයෙහිදී ) රාමරජහට ඉෂ්ට මිත්‍රවූ ඍග් යජුස් සාම යන තුන්වෙදයට ගුරුතැන්පත් පුලස්ති නම් මහර්ෂිහුගේ ගොත්‍රයට මිණිපහනක් වැනිවූ ඒ විභීෂණදෙවිරජහුගේ පාපියුම්යුවල තුන්වරක්ම වන්‍දනය කර.

93 (වැඳීමෙන්) පසු ඒ දෙවිරජහුගේ අදහසද අවකාශකාලයද කල්පනා කොට ඉක්මන් නොව පෙරපසු වචන සම්බන්‍ධය ක්‍රමයා ඒ

පර වාක්‍ය (සම්බන්ධය); සලකා, විමර්ශනය කොට; සුරිඳුට, (ඒ) සුරේන්ද්‍රයාහට; තිසුවදන්ගොස, ස්තුතිවචනඝෝෂණය; පෙර දැරිකොට, පූර්වංගම කොට; එකත්පස සිට, එක්පාර්ශ්වයෙක්හි අවස්ථිත වැ; නගිය කටයුතු, නා ගියාවූ කාර්‍ය්‍යාවශ්‍යය; සැල කර, විඥාපනය කර.

දැන් පළමුවෙන් කියවමිනා ස්තුතිවාක්‍යය හා විඥාපනය කටයුතු වාර්තාවිශේෂය දක්වන්නාහු "තරසර සුනෙර" යනාදි කීහු.

94 ත ර ස ර සුනෙ ර තදතෙද දිමුතු දිවයු ර
පු ව ත ර ගැඹ ර සමුදුර කැලුම නිලඹ ර
සොම්බ ර ප ව ර නිසයුර නුවණ සුරගු ර
සු ර ව ර දෙසැ ර විබිසණනම් කැලණිපු ර

94 තරසර, ස්ථිරසාර ගුණයෙන්; සුනෙර, මහාමේරුපර්වතරාජයා වැනිවූ; තදතෙද, ඝනබද්ධතේජසින්; දිමුතු, දීප්තිමත්වූ; දිවයුර, දිවාකරයා වැනිවූ; පුවතර, ප්‍රසිද්ධවූ; ගැඹර, ගම්භීරගුණයෙන්; සමුදුර, සමුද්‍රය වැනිවූ; කැලුම, (දෙහ) කාන්තියෙන්; නිලඹර, නීලාම්බරය හා සමානවූ; සොම්බර, සෞම්‍යභාරයෙන්; පවර, උත්තමවූ; නිසයුර, චන්ද්‍රයා වැනිවූ; නුවණ, ප්‍රඥයෙන්; සුරගුර, බෘහස්පතියා වැනිවූ; කැලණිපුර, කල්‍යාණිපුරප්‍රවරාධිපත්වූ; විබිසණ නම් සුරවර, විභීෂණ නම්වූ දෙව්මහරජාණන්වහන්සෙ; සැර දෙ, චිරකාලයක් ජීවත්වූව මැනවි.

95 ර ජ කු ල සුපුල්විලැ රජහස වන් සර න
පෙර ම ල වියාවත් රුසිරෙත් මනනඳ න
හැම ක ල විපුල සව්සැපතින් නොහඩුව න
තෙද බ ල විකුම් ගුණ මිණිබරණින් තෙවු න

95 රජකුල, රාජවංශ නමැති; සුපුල්විලැ, සුත්ඵුල්ලවූ පද්මවනයෙහි; සරන, සඤ්චාරය කරන්නාවූ; රජහසවන්, රාජහංසයකු වැනිවූ;

---

දෙව්දුහට (මේ මතු දක්වන) ස්තුතිවචන පැවැත්වීම පෙරටු කොට එක් පාර්ශවයෙක්හි සිටගෙන නා ගියාවූ කටයුත්ත සැල කරව.

94 ස්ථිරත්වයෙන් හා සාරත්වයෙන් මෙරුපර්වතය බඳුවූ; තදවූ තේජෝ ගුණයෙන් බබලන සූර්‍ය්‍යයා බඳුවූ; ප්‍රසිද්ධ ගම්භීර ගුණයෙන් මහාසමුද්‍රය බඳුවූ; ශරීරකාන්තියෙන් නිලවණී ආකාශය බඳුවූ; අධිකවූ සොම්ගුණයෙන් උතුම් සඳමඬල බඳුවූ; නුවණින් බෘහස්පතිහු බඳුවූ; කල්‍යාණී පුරප්‍රවරයෙහි (වැඩවසන්නාවූ); විභීෂණ නම් සුරරාජයන්වහන්ස (නුබවහන්සේ) චිරාත්කාලයක් මුළුල්ලෙහි ජීවමාන වනසේක්වා.

95 රාජවංශ නමැති සුපිපි (පියුම්) විලෙහි හැසිරෙන රාජහංසයකු බඳුවූ; සිත් සතුටු කරවන රූපසෞන්දර්‍ය්‍යයෙන් (පෙර මහදෙවියාගේ

මනනඳන, මනොනන්දනීයවූ; රුසිරෙන්, රූපශ්‍රීයෙන්; පෙර මලවියාවන්, පූර්වමන්මථයා හා සමානවූ; හැමකල, සර්වකාලයෙහි; විපුල, මහත්වූ; සව්සැපතින්, සකලසම්පත්තියෙන්; නොහඩුවන, ඌනත්වයක් නැත්තාවූ; තෙදබලවිකුම්ගුණ, තෙජෝබලවික්‍රමගුණ නමැති; මිණිබරණින්, මාණික්‍යාභරණයෙන්; බැබළුන, විරාජමානවන්නාවූ–

96 ගරුතර නන්නුරුතුනයා නමැති මැ ති
සිහිකර නිතර මහපුද පඬුරු දී රු ති
නොවිසිර ඔබට දන්වනලෙස කී සිතැ ති
සුරවර මඳක්කල් එපවත් ඇසියයු ති

96 ගරුතර, අතිශයින් මහත්වූ ගුණඇති; නන්නුරුතුනයා නමැති, නන්නුරුතුනයාභිධානවූ; මැති, (සෙනානායක) අමාත්‍යතෙම; නිතර සිහිකර, නිරන්තරයෙන් (ඔබවහන්සේ) සඳහන් කොට; රුති, අභිමතවූ; මහපුදපඬුරු දී, මහත්වූ පූජාපිප්‍රාභෘතයන් ප්‍රදානය කොට; සිතැති, (ස්වකිය) චිත්තසන්තානවර්තිවූ අභිප්‍රාය; නොවිසිර, විශීර්ණ නොකොට–හෙවත් අන්‍යවිහිත නොවී; ඔබට, ඔබවහන්සේට; දන්වනලෙස, විඥාපනය කරන පරිද්දෙන්; කී, කථනය කෙළේය; සුරවර, දිව්‍යරාජොත්තමයාණන්වහන්ස, එපවත්, (ඔහුවිසින් කියා එවනලද) ඒ ප්‍රවෘත්තිය; මඳක්කල්, ස්වල්පමාත්‍රකාලයක් මුළුල්ලෙහි; ඇසියයුති, ශ්‍රවණය කටයුත්තීය.

97 රිවිකුල ලමැණිගොත් පිරිසිදු ගුවන්මැ ද
පැහැදුල සරාකල් පත් සහසකරබ ද
කිවිකැල ගලට මුතුහරවන් යස පබ ද
සිරිකල කුලතිවෙස් දියපතල තඳතෙ ද

97 රිවිකුල, සූර්‍ය්‍යවංශයෙහි (ප්‍රවෘත්තවූ); ලමැණිගොත්, ලම්බකර්ණවංශ නමැති; පිරිසිදු, නිර්මලවූ; ගුවන්මැද, ගගනමධ්‍යයෙහි; සරාකල්පත්, ශරත්කාලයට ප්‍රාප්තවූ; පැහැදුල, ප්‍රභායෙන් දිලිහෙන්නාවූ; සහසකරබඳ, සහස්‍රකිරණයා වැනිවූ; කිවිකැල, කවිසමූහයාගේ;

---

ලලාටනෙත්‍රාග්නියෙන් දවනුලැබීමට) පළමු ප්‍රකෘතිරූපශ්‍රීන් යුක්තව සිටි කාමදෙවයා බඳුවූ; සියලු සැපතින් අඩුවක් නැත්තාවූ; තෙජෝබලවික්‍රමගුණ නමැති රත්නාභරණයෙන් දිලියෙන්නාවූ–

96 අතිශයෙන් ගරුවූ ගුණඇති; "නන්නුරුතුනයා" නම් සෙනෙවිරත් ඇමතිතෙම නිතර (නුබවහන්සේ) සිහිකොට කැමැතිවූ මහත් පුදපඬුරුදී (තමන්) සිත්හි පවත්නා අදහසක් සාවධානව නුබවහන්සේට සැලකරන මෙන් (මට) කීයේය. දෙවිතුමාණනි! ඒ (අමාත්‍යොත්තමයන් සැලකර එවූ) පුවෘත්තිය මඳවේලාවක් ඇසිය යුත්තිය.

97 සූර්‍ය්‍යවංශයෙහිවූ ලම්බකර්ණගොත්‍ර නම් රජපෙළපත නමැති නිර්මල ආකාශමධ්‍යයට ශරත්කාලයෙහි පැමිණියාවූ ප්‍රභාකදම්බයෙන්

ගලට, කණ්ඨයට; මුතුහරවන්, මුක්තාහාරයක් බඳුවූ; යසපබඳ, කීර්ති ප්‍රබන්ධඇැති; සිරිකල, ශ්‍රීකාන්තාවට; කුලනිවෙස්, කුලගෘහයක් බඳුවූ; දියපතළ, ජගද්ව්‍යාප්තවූ; තදතෙද, ඝනීභූතතෙජස් ඇත්තාවූ-

98 හ ළ දුසිරි දැන තෙවලා මුනිඳුබ ණ
කෙ ළ පත් සියල් අවිසිප් කිවිනළු සත ණ
ඔ ළ මොළ රුපුන් දප මැඩ පෑ උපානැ ණ
ක ළ මුළු ලක්දිව එකසේසත් සෙව ණ

98 තෙවලාමුනිඳුබණ, ත්‍රිපිටක බුද්ධවචනය; දැන, ( ශ්‍රැතමය ඥානයෙන් ) අවබොධ කොට; දුසිරි, දුශ්චරිතයන් හෙවත් දශඅකුශල කර්මපථයන්; හළ, පරිත්‍යාග කලාවූ; සියල් අවිසිප්, ( චාපචක්‍රප්‍රාසාදි ) සියලු ආයුධශිල්ප හා; කිවිනළුසතණ, කාව්‍යනාටකතර්කව්‍යාකරණාදි ශාස්ත්‍රනමැති සමුද්‍රයෙහි; කෙළපත්, කොටිප්‍රාප්තවූ; උපානැණ පෑ, ( සාමදානාදි චතුර්විධ ) උපායඥානය දක්වා; ඔළමොළ රුපුන්, උද්දාම ගුණයෙන් ප්‍රචණ්ඩවූ ශත්‍රූන්ගේ; දප මැඩ, දර්ප මර්දනය කොට; මුළු ලක්දිව, සමස්ත ලඞ්කාද්වීපය; එකසේසත්සෙවණ කළ, එකශ්වේතච්ඡත්‍ර ච්ඡායාවට පැමිණවූ-

99 සතනෙත දුන් රූසිරු රස අ ඳු න් ව න
පත නරලොව පුරඳරසිරි හ ඳු න් ව න
විකුමෙන් මෙදඹදිවැ නිරිඳුන් මු දු න් ව න
අප පැරකුම් නිරිඳුට දූ ල දු න් ව න

99 සතනෙත දුන්, (සකල) සත්වයාගේ නෙත්‍රයට ( ආලම්බනවශයෙන් ) දෙනලද්දාවූ; රසඅඳුන්වන, රසාඤ්ජනයක් හා සමානවූ; රූසිරු,

---

දිලියෙන සූර්‍ය්‍යමණ්ඩලය බඳුවූ; කවිජනසමූහයාගේ කණ්ඨයට මුක්තාහාරයක් වැනි කීර්තිරාශියක් ඇත්තාවූ; ශ්‍රීකාන්තාවගේ වාසයට කුල පරම්පරාගත මන්දිරයක් බඳුවූ; ලොකයෙහි පතළ තදතෙද ඇත්තාවූ-

98 ත්‍රිපිටක බුද්ධධර්මය (ඇසීමෙන්) අවබොධ කොට දුසිරිත් දුරුකළාවූ; දුනුසක් කුන්තාදි සියලු ආයුධ ශිල්ප හා කාව්‍යනාටක(තර්කව්‍යාකරණාදි) ශාස්ත්‍රනමැති සාගරයාගේ පරතෙරට පැමිණියාවූ;(සාම දාන භෙද දණ්ඩ යන සිව්වැදෑරුම් ) උපානුවණ ප්‍රකාශ කොට චණ්ඩාභිචණ්ඩවූ සතුරන්ගේ අභිමාන මැඩ පවත්වා සකල ලඞ්කාද්වීපය එකසේසත්සෙවණට පත්කළාවූ-

99 ජනයන්ගේ ඇසට දෙනලද රසාජනයක් වැනි රූප ශ්‍රී ඇත්තාවූ; මිනිස්ලොවට පැමිණි සක්දෙවිඳුහුගේ ශොභාව අඳුන්වන්නාවූ; අතිශූරත්වයෙන් මේ ජම්බුද්වීපයෙහි රජුන්ට මුදුන් පැමිණියාවූ; අපගේ ශ්‍රීපරාක්‍රමබාහු නරෙන්ද්‍රයාණන්ට-දුහිතෘ කුමාරීවූ-

රූපශ්‍රී ඇත්තාවූ; නරලොව පත, මනුෂ්‍යලොකප්‍රාප්තවූ; පුරඳරසිරි, පුරන්‍දරශ්‍රිය; හඳුන්වන, ප්‍රත්‍යභිඥනය කරවන්නාවූ; විකුමෙන්, වික්‍රම යෙන්; මෙදඹදිවැ නිරිඳුන්, මේ ජම්බුද්වීපයෙහි නරේන්‍ද්‍රයන්ට; මුදුන්වන, ශිරොභූතවූ; අප පැරකුම්නිරිඳුට, අපගේ ශ්‍රීපරාක්‍රමබාහු මහාරාජොත්තම යාණන්ට; දූළඳුන්වන, දුහිතෘභාවයට පැමිණි තරුණවයසෙහි සිටියාවූ-

100 සි රි ස ඳ ව න් සව්සිරි දියුණුවැ රඳ න
සිතු මි ණ ව න් යදි යදිහට දනින් දෙ න
ස ර ස වි ව න් නුවණින් පහලවැ පෙනෙ න
න ව ස ඳ ව න් ලෙව්වැසි අදරින් වඳ න

100 සව්සිරි, සියලු (ත්‍රිවර්ග) සම්පත්තිය; දියුණුවැ, අධිකවැ; රඳන, රඤ්ජමානවූ; සිරිසඳවන්; ශ්‍රීකාන්තාව හා සමානවූ; යදි, යාච්ඤකලාවූ; යදිහට, යාචකසමූහයහට; දෙන, පරිත්‍යාග කරන්නාවූ; දනින්, දෙය ධර්ම්‍ය කරණකොටගෙන; සිතුමිණවන්, චින්තාමාණික්‍යයක් බඳුවූ; නුව ණින්, බුද්ධියෙන්; පහලවැ පෙනෙන, ප්‍රකාශව දෘශ්‍යමානවූ; සරසවිවන්, සරස්වතිය හා සමානවූ; ලෙව්වැසි, ලොකවාසීන්; අදරින්, ආදරයෙන්; වඳන, නමස්කාර කරනුලබන්නාවූ; නවසඳවන්, අභිනව, චන්‍ද්‍ර ( රේඛා වක ) බඳුවූ-

101 යෙහෙ ළි න් කෙරේ සකිසැප සමඟ සි ත් මේ
කු ලු ණෙ න් දූසිදසුන් වෙතැ වසිත ව ත් මේ
ර කි මි න් පතිනි දම් යහපත් සිරි ත් මේ
සි හි ණෙ න් නිපන්වන් දසපින් පැවැ ත් මේ

101 යෙහෙළින්කෙරේ, සඛීජනයා කෙරෙහි; සකිසැප සමඟ, සඛ ඛිය සම්පත්තියෙහි ( වෙනසක් නැතිව ) සමඟව පවත්නාවූ; සිත්මේ, චිත්තයක්ම ඇති; කුලුණෙන්, කරුණායෙන්; දූසිදසුන්වෙතැ, දුශ්ශීල ජනයා කෙරෙහි; වත්මේ, වස්තු නමැති මෙඝය; වසිත, වර්ෂණය කරන් නාවූ; පතිනිදම්, පතිව්‍රතාධර්ම්‍ය හා; මේ, මෙධ්‍යවූ හෙවත් පවිත්‍රවූ; යහ

100 ( ධර්ම්‍ය අර්ථ කාමය යන ) සියලු ත්‍රිවර්ගසම්පත්තියෙන් දියුණුව රඳනාවූ; (ප්‍රත්‍යක්ෂ) ශ්‍රීකාන්තාව හා සමානවූ; අයදුම් කල අර්ථිජනයාහට දෙනුලබන දන වස්තූන් කරණකොට ගෙන සිතුමිණි රුවනක් වැනිවූ; ඥනය කරණකොටගෙන ප්‍රත්‍යක්ෂව ප්‍රකාශවූ සරස්වතිදෙවිය වැනිවූ; ලෝවැස්සන් ආදරයෙන් වඳිනුලබන පුරසඳරෙඛාවක වැනි වූ-

101 මිතුරු අඟනන් කෙරෙහි තමන් සැපතෙහි නොවෙනස්ව පවත්නා චිත්තයක්ම ඇත්තාවූ; දයාව කරණකොට ගෙන දූසිදස්ජන යන්කෙරෙහි වස්වන ධන නමැති මෙඝය ඇත්තාවූ; පතිව්‍රතාධර්ම්‍ය හා පිරිසිදු මනා සිරිත් රක්‍ෂාකෙරෙමින් දශපුණ්‍යක්‍රියා පැවැත්වීමෙහි සිහිනුවණින් (නිර්මිතව) උපන්නියක වැනිවූ-

පත්සිරිත්, මනොඥවූ චාරිත්‍රයන්; රකිමින්, රක්‍ෂාකෙරෙමින්; දසපින් පැවැත්මෙි, ( දානශීලාදි ) දශපුණ්‍යක්‍රියාවස්තූන් ප්‍රවර්ත්තනයෙහි; සිහිණෙන් නිපන්වන්, සිහිනුවණින් උපන්නියක වැනිවූ-

102 මි හි රි තෙපලැ තන්වැසි කිවිකම් පුරු දු
ඉ ති රි බැතිපෙමැති පෙළදහමෙහි මුනි ඳු
නොහැ රි පෝයැ අටසිල් රැකුම පිරිසි දු
ස සි රි උලකුඩය දේවිහට පසි දු

102 මිහිරිතෙපලැ, මධුරවචනයෙහි තන්වැසි, නොපිරිසරවූ ප්‍රෞඪවූ හෙවත් ප්‍රසතාවොචිත කොට ප්‍රියතෙපුල් කිමෙහි දක්‍ෂවූ; කිවිකම්පුරුදු, කවිකම්යෙහි පරිචිතවූ-හෙවත් ගද්‍යපද්‍යබන්ධනයෙහි යමක ප්‍රහෙලිකා ක්‍රියාගුප්තක අක්‍ෂරච්‍යුතක ගූඪචතුර්ථාදිවූ අනෙකකවික්‍රියායෙහි දක්‍ෂවූ; මුනිඳු,මුනීන්‍ද්‍රවූසර්වඥයන්වහන්සේගේ; පෙළදහමෙහි, (ත්‍රිපිටක) පාලිධර්මයෙහි; ඉතිරි, අධිකවූ; බැතිපෙමැති, භක්තිප්‍රෙම ඇත්තාවූ; පෝයැ, පොෂධදිනයෙහි: පිරිසිදු, නිර්මලවූ; අටසිල්රැකුම, අෂ්ටාඞ්ගශීලරක්‍ෂණය; නොහැරි, වර්ජනය නොකළාවූ; පසිදු, ප්‍රසිඬවූ; සසිරි, සශ්‍රීකවූ; උලකුඩය දේවිහට, ලොකනාථා නම්වූ රාජකුමාරිකාවට-

103 දි ත් රුපුකිරුළු මල්දම් සුවඳ මී වැ ස
තෙ ත් සිරිපායුත් සුරිඳුනි තිලෝ ඇ ස
සි ත් පිනවන ඇති ආසිරි නුවණ ය ස
පු ත් රුවනක් සොඳ දුනමැනවි නිසිලෙ ස

103 දිත්රුපුකිරුළු, දෛත්‍යාරිදිව්‍යරාජයන්ගේ කිරීටයන්හි; මල්දම්, මාලාදමයන්ගේ; සුවඳමී වැස, සුගන්ධමකරන්දවර්ෂණය කොට; තෙත්, ආර්ද්‍රවූ; සිරිපායුත්, ශ්‍රීපාදයෙන් යුක්තවූ; තිලෝඇස, ත්‍රෛලොක්‍යනෙත්‍රවූ; සුරිඳුනි, එම්බා විභීෂණ නම් දිව්‍යරාජයාණනි, සිත්පිනවන, ජනමනොරඤ්ජනය කරවන්නාවූ; ආ, ආයුෂය; සිරි, ( ත්‍රිවර්ග ) සම්පත් තිය; නුවණ, ප්‍රඥය; යස, කීර්ත්‍යය යන මෙකී ගුණයන්; ඇති,

---

102 මිහිරිබස් කීමෙහි තැත්පත්වූ; යමකබන්ධනාදි කාව්‍යරචනායෙහි ප්‍රගුණවූ; ශාක්‍යමුනීන්‍ද්‍රයන්වහන්සේගේ පාලිධර්මයෙහි අතිශයභක්තිප්‍රෙමාන්විතවූ; පොහෝදවස්හි පිරිසිදු අෂ්ටාඞ්ගශීලසංරක්‍ෂණය අත්නොහැරියාවූ; ප්‍රසිඬ ශ්‍රීමත්වූ "ලොකනාථා" නම් රාජකුමාරිකාවන්ට–

103 අසුරශත්‍රුවූ දෙව්රජුන්ගේ ඔටුනුමල්දම් පිළිබඳ සුවඳමුවරඳ වැස්සෙන් තෙත්වූ සිරිපතුල්ඇති; තුන්ලොවට ඇසක් බඳුවූ; (විභීෂණ) සුරෙන්ද්‍රයාණනි ! ( ජනයන්ගේ ) සිත් පිනවන්නාවූ ආයුශ්ශ්‍රීප්‍රඥකීර්ති ඇති යහපත් පුත්‍රරත්නයක් නිසිසේ ප්‍රදානය කළහොත් යෙහෙකි.

විද්‍යමානවූ; සොඳ, සුඳුරවූ; පුත්රුවනක්, පුත්‍රරත්නයක්; නිසිලෙස, යොග්‍යවූපර්ද්දෙන්; දුන මැනවි, ප්‍රදානය කළ මැනවි.

මෙසේ පුත්‍රදානය පිණිස අරාධනා කොට දෙවෙනිවත් දූජිාව දානයක් උදාහරණ කොට දක්වා අරාධනා කරවයි කියන්නාහු "බිසො වට පළමු" යනාදි කීහු.

104 බිසො ව ට පළමු රත්නාවලිනම් සොඳු රෑ
සහ තු ට දෙවූ හිමි දිවැසින් කුලුණු පි රෑ
මෙ ල ක ට ඉසුරු වී පැරකුම් රජකුම රෑ
පල කො ට ක්මෙක ඔබ සොඳ තෙදබල මහ රෑ

104 පළමු, පූර්වකාලයෙහි; සොඳුරු, සෞන්දර්‍ය්‍යයෙන් යුක්තවූ; රත්නාවලිනම් බිසොවට, (මහලුවිජයබාහුනම් රජ්ජුරුවන්ගේ දූවූ මානාභරණ රජ්ජුරුවන්ට බිසෝවූ) රත්නාවලිනම් බිසොවුන්ට; හිමි, ස්වාමිහු විසින්; කුලුණුපිරු, කරුණාපූර්ණවූ, දිවැසින්, දිව්‍යදෘෂ්ටිප්‍රභායෙන්; සහතුට, සන්තොෂසහිතව; දෙවූ, ප්‍රදානය කරවූ; පැරකුම්රජකුමරු, පරාක්‍රමබාහුනම් රාජකුමාරතෙම; මෙලකට ඉසුරු වී, මේ ලඞ්කාවීපයට අධිපතිවූයේය; ඔබ, තත්‍රභවත්වූ නුබවහන්සේගේ; සොඳ, සුඳුරවූ; මහරු, මහාර්‍ඝවූ; තෙදබල, තෙජොබලය; පළ කොට කිමෙක, ප්‍රකාශ කොට (කියනු මැ) කවරේද ?

105 එසෙයි න් දෑසමන්මහනෙල් කුසුම් ගෙ න
පු ද මි න් ඒසුරවර සිරිසරණ වඳිමි න
බු හු ම න් කරන රජදූසඳුට මෙකිය න
දු න පි න් සමඟ යසසිර වඩි පුත්රුව න

105 එසෙයින්, ඒ කාරණයෙන්; දෑසමන් මහනෙල්කුසුම් ගෙන, ජාතිසුමනාපුෂ්පරක්තොත්පලපුෂ්පයන් ග්‍රහණය කොට; පුදමින්, පුෂ්පාඤ්ජලි කොට අර්චනය කෙරෙමින්; ඊසුරවර, ඒ (විභීෂණ) සුරොත්තමයාගේ; සිරිසරණ වඳිමින, ශ්‍රීපාදය නමස්කාර කෙරෙමින්; බුහුමන් කරන, භක්ති බහුමාන කරන්නාවූ; මෙකියන, මේ යථොක්තවූ; රජදූසඳුට, උත්තමවූ රාජපුත්‍රියට; පුත්රුවන, පුත්‍රරත්නයක්; දුන, ප්‍රදානය කළහොත්; පින් සමන, ධර්මය හා සමඟ; යසසිරි වඩි, කීර්තිශ්‍රීවර්ධනය වන්නේයි.

---

104 (මීට) පූර්වකාලයෙක්හි (මානාභරණ නරෙන්ද්‍රයාණන්ගේ) සුඳුරිවූ රත්නාවලිනම් මෙහෙසියට දෙවිස්වාමිදරුවන්විසින් කරුණායෙන් පිරුණු දිවඇසින් (බලා) සතුටුසහිතව දෙවාවදාලාවූ පරාක්‍රමබාහු නම් රාජකුමාරතෙම මේ ලක්දිවට අගරජ විය. ඔබගේ යහපත් මාහැඟි තෙජශ්ශක්තිය ප්‍රකාශ කොට (කාලක්ෂෙප කිරීමෙන්) ප්‍රයොජන කවරේද ?

105 එසේහෙයින් දෑසමන්රත්මහනෙල්මල් (ආදිය) ගෙන (මල් දෙනොහින්) පුදකෙරෙමින් ඒ දෙවිතුමාගේ සිරිපා වඳිමින් බැතියෙන්

106 මෙ හ සු ත් සුරිඳුහට සැලකැරැ මෙ සේ යා
ව ඳි මි න් බැතින් පැදකුණුකොට තො සේ යා
ද කි මි න් බිසෝ දෙවියන් නොව ල සේ යා
කි ය මි න් සඳින් සකිසඳ මෙම ලෙ සේ යා

106 මෙහසුන්, මේ ( යථොක්තවූ ) සන්දෙශය; සුරිඳුහට, ( විභීෂණ නම්) සුරෙන්ද්‍රයාහට; මෙසේයා, එනත්ප්‍රකාරයෙන්; සැලකැරැ, විඥාපනය කොට; බැතින්, භක්තියෙන්, වඳිමින්, නමස්කාර කෙරෙමින්; තොසේයා, සන්තොෂ (චිත්ත)යෙන්; පැදකුණු කොට, ප්‍රදක්ෂිණ කොට; බිසෝ දෙවියන්, ( ඒ සුරෙන්ද්‍රයාහට ) අග්‍රමහිෂීවූ දෙවතාදුව; දකිමින්, දර්ශනය කෙරෙමින්; නොව ලසේයා, (එතැන්හි) ප්‍රමාදනොවී; සකිසඳ, මිත්‍රොත්තමය; මෙම ලෙසේයා, මේ ලෙශයෙන්ම; කියමින්, කථනය කෙරෙමින්; සඳින්, යාච්ඤා කරන්.

107 පැ හැ ප ත් පුන්සඳෙව් කිරිසමුදුරැ පළ ට
සි ය ගො ත් බබුළුවන දෙව්රජ කුමරහ ට
නැ ව ත ත් එකලාව අවසර ලැබුණුවි ට
මෙ ප ව ත් කියව සැලකරනුව සුරරදු ට

107 කිරිසමුදුරැ, ක්ෂීරසාගරයෙහි; පළට, ප්‍රකටවූ; පැහැපත්, ප්‍රභා ප්‍රාප්තවූ; පුන්සඳෙව්, පූර්ණචන්ද්‍රමණ්ඩලය මෙන්; සියගොත්, ස්වකීයවූ (පෞලස්ත්‍ය) ගොත්‍රය; බබුළුවන, දීප්තිමත් කරවන්නාවූ; දෙව්රජ කුමරහට, ඒ දෙව්රජහුගේ පුත්‍රවූ කුමාරදෙවියන්ට; නැවතත්, නිවෘත්ත වත් හෙවත් දෙවෙනිවත්: එකලාව, එකාකිව; අවසරලැබුණුවිට, අවසරප්‍රාප්තවූකල්හි හෙවත් ප්‍රාප්තාවසරයෙහි; සුරරදුට, ( ඒ විභීෂණ ) නම් සුරරාජයාහට; මෙපවත්, මේ ප්‍රවෘත්තිය; සැලකරනුව, විඥාපනය කරනු පිණිස; කියව, කථනය කරව.

108 මේ සි ය ලූම අදහස කුලුණෙන් ගිහි ණි
සේ සි ය පත සලසා උදයැ දිනමි ණි
නෑ සි ය ඉටුමිතුරු සමඟින් සැලලිහි ණි
වා සි ය පවතු සිතුලෙස සැපතින් පැමි ණි

---

ගෞරව කරන්නාවූ මේ පෙරකී උතුම්රජකුමරියට පුත්රුවනක් දෙවා වදූළහොත් පින් හා සමඟ යශශ්‍රීවර්ධනය වේ.

106 මේ පණිවුඩය මෙලෙසින් විභීෂණදෙවිඳුට සැලකර ආදර යෙන් වන්දනය කෙරෙමින් සතුටුසිතින් ප්‍රදක්ෂිණ කොට ඒ දෙවිඳුගේ අගමෙහෙසිදෙවිඳුව දකිමින් එහි පමානොව මිතුරුතුමනි මෙලෙසින්ම (ඇයටද) සැලකෙරෙමින් යාච්ඤාකරව.

107 කිරිසයුරෙහි පැවූ දීප්තිමත් පූර්ණචන්ද්‍රයා මෙන් තමන්ගේ පුලස්තිසෘෂිවංශය බබුළුවන්නාවූ විභීෂණපුත්‍රවූ කුමාරදෙවියන්ට දෙවනුවත් තනිව අවකාශලත් විටෙක විභීෂණදෙවිඳුහට මේ කොරතුර සැල කරනුපිණිස ආරොචනය කරව.

108 සැලලිහිණි, ඒම්බාශාරිකාපක්‍ෂිරාජෝත්තමය; මේ සියලුම අද හස, මේ (යථොක්තප්‍රකාරයෙන් නිර්දිෂ්ටවූ) සියලු අධ්‍යාශයම; ගිහිණි, (චින්තායෙන්) ග්‍රහණය කරනලද්දවූ–නොහොත් ගහණිවූ; කුළුණෙන්, කරුණාවිශෙෂය හෙතුකොටගෙන; දිනමිණි, නාහොරත්නවූ සහස්‍රරශ්මිහුගේ; උදයෑ, ප්‍රාදුර්භූතවන්නාවූ කාලයෙහි; සියපත සේ, ශතපත්‍රයක් මෙන්; සලසා, සංශ්ලෂ්‍භාවයට අභික්‍රියාසම්බන්ධයට පමුණුවා; හෙවත් යම්සේ හිරුඋදුවූ පමණින් ඒ හිරුහුගේ අන්‍යප්‍රයොගයක් නැතිව පද්මය තෙම පත්‍රවිකසනාදිකාය්‍ෂීයෙන් යුක්තව ප්‍රබුධවේද එසේම මෙහි කිවාවූ වචන සඞ්ක්‍ෂෙප වුවද විස්තරවශයෙන් ප්‍රස්තාවානුරූප කොට තමාගේ ස්ථානොචිත ප්‍රඥයෙන් අනුක්තකාය්‍ෂීද විස්තර කොට පරීක්‍ෂා කිරීමෙන් නිෂ්පත්තියට පමුණුවා; සිතුලෙස, චින්තානුකුල්වූපරිද්දෙන්; පැමිණි, සම්ප්‍රාප්තවූ; සැපතින්, (යොගක්‍ෂෙම) සම්පත්තියෙන් යුක්තව; නෑසිය ඉටුමිතුරු සමගින්, ඥාතිජනයා හා සුවකියපරිවාරජනයා හා ඉෂ්ටමිත්‍රයන් සහිතව; වාසිය පවතු, වර්‍ෂශතයක් මුළුල්ලෙහි සැපසේ ජීවත්වා.

සැලලිහිණිසන්දෙශ සන්නය නිමි.

---

(109) පැරකු ම් රජුට පන්තිස්වනු නවම්ම ස
මනර ම් කැරැ බඳුනු මෙහසුන් නොවීල ස
අයදු ම් ලෙසට සිදුකැරැ කිවිඳු අදහ ස
දෙව් ර ම් මිතුරු දුන් ගැබ බිසොවට සක ස

---

108 පින්වත් සැලලිහිණි පක්‍ෂිරාජය මේ පෙරකීපරිද්දෙන් විසතර කරනලද සියලුම අභිප්‍රාය සිතින් ගත් (සිතෙහි ගහණිවූ හෝ) කරුණායෙන් සූර්‍ය්‍යෝදයකාලයෙහි ප්‍රබොධවන පද්මයක්සේ සිඬියට පමුණුවා සිත්වූපරිද්දෙන් ලබනලද සැපතින් යුක්තව නෑදෑපිරිවරජනයන් හාද කල්‍යාණමිත්‍රයන්හාද සමඟව සියක්හවුරුද්දක් මුළුල්ලෙහි ජීවත් වෙහිවා.

(109) පැරකුම් රජුට, ශ්‍රීසඞ්ඝබොධි ශ්‍රීපරාක්‍රමබාහු නරෙන්‍ද්‍රයාහට; පන්තිස්වනු, (රාජ්‍යාදයෙන්) පඤ්චත්‍රිංශත්තම වර්‍ෂයෙහි; නවම්මස, මාඝමාසයෙහි; මෙහසුන්, මේ ශාරිකාසන්දෙශනම් දූතකාව්‍යය; මනරම්කැරැ, මනොරම්‍ය කොට; ලසනොවී, අනලස වැ; බඳුතු, (පද්‍යරචනාවශයෙන්) බන්ධනය කළ කල්හි, රම්මිතුරු, රාමචන්‍ද්‍රයාහට මිත්‍රවූ; දෙව්, (විභීෂණ) සුරෙන්ද්‍රතෙම; කිවිඳු, කවීන්ද්‍රයාගේ; අදහස, අධ්‍යාශය; අය දුම්ලෙසට, ආයාචනය වූපරිදෙන්; සිදුකැරැ, සිඬ කොට; සකස, මනා කොට; බිසොවට, (ලොකනාථානම්වූ) මහිෂියට; ගැබ, පුත්‍රගර්‍භය; දුන්, ප්‍රදානය කෙළේයි.

(110) ස හි ස් වනු නවමැ පුර අස්ලිස නක ත
ප හ ස් ලැබ සුපුන්සඳ නුබ තුරැ පැනෙ ත
ස හ ස් කරකුලට වැඩවන ලෙස සත ත
වෙසෙ ස් රජකුමරු විලසින් දුකුම්ප ත

(111) ක ද වු රු කුලමැදුරැ මිණිපහනෙව් සුසැ දි
නැ ණ ගු රු සබස සමයද දනුමෙහි වොරැ දි
ර ජ ගු රු විජයබාපිරුවන් හිමිපැහැ දි
මෙ මි යු රු පදැති සැලලිහිණිය අස්න යෙ දි

---

(110) සතිස්වනු, (ඒ මහරජහට) ෂට්ත්‍රිංශත්තම වර්‍ෂයෙහි; නවමැ, මාඝ මාසයෙහි; පුර, ශුක්ලපක්‍ෂයෙහි; අස්ලිසනකත, අශ්ලෙෂා නක්‍ෂත්‍රයාගේ; පහස් ලැබ, ස්පර්‍ශප්‍රතිලාභ කොට; සුපුන්සඳ, සම්පූර්‍ණචන්‍ද්‍රයා; නුබතුරැ, නභොමධ්‍යයෙහි, පැනෙත, දෘශ්‍යමානවූකල්හි; සහස්කර කුලට, සහස්‍රකිරණවංශයට හෙවත් හිරුගොත් රජපරපුරට; සතත, නිත්‍යරයෙන්; වැඩවනලෙස, අභිවෘඬිවනපරිද්දෙන්; වෙසෙස්, විශිෂ්ටවූ; රජකුමරු, ක්‍ෂත්‍රියකුමාරයොම; විලසින්, දෙහවිලාසයෙන්; දුකුම්පත, දර්‍ශනප්‍රාප්ත විය; හෙවත් මාතෘකුක්‍ෂියෙන් නිෂ්ක්‍රාන්තවැ ප්‍රකාශ වී.

(111) කදවුරුකුල, ස්කන්ධාවාරවංශ නමැති; මැදුරැ, මන්දිරයෙහි; මිණිපහනෙව්, රත්නප්‍රදීපයක් මෙන්; සුසැදි, සුසජ්ජිතවූ; නැණගුරු, නුවණින් සුරාචාර්‍ය්‍යා වැනිවූ; සබස, (සංස්කෘත ප්‍රාකෘතාදි) ෂඩ්භාෂාවන් හා; සමයද, ස්වසමයසමයාන්තරයන්ද; දනුමෙහි, පරිඥානයෙහි; වොරැදි, විරාජිතවූ; රජගුරු, රාජගුරුපදප්‍රාප්තවූ; විජයබාපිරුවන්හිමි, ශ්‍රීඝනසබොධිවිජයබාහුපරිවෙණාධිපති ශ්‍රීරාහුල ස්වාමිතෙම; පැහැදි, ප්‍රසාදගුණවත්වූ; මියුරු පදැති, මධුරපදාන්විතවූ, මෙ සැලලිහිණිය අස්න, මේ ශාරිකාසන්දෙශය; යෙදි, රචනාකළසේකි.

උපසංහාර කාව්‍යාර්ථවර්‍ණනායි.

---

# ශා රි කා ස න්දේ ශ
## ග්‍ර න්ථි ප ද වි ව ර ණ ය.

අක්ෂරච්‍යුතක, පද්‍යයෙක්හි අක්ෂරයක් අඩුකොට ඒ පද්‍යයෙන්ම එය ගත හැක්සේ ගුප්තකොට රචනා කරන (දුෂ්ටප්‍රහෙළිකාවන්ට ඇතුළත්) "ච්‍යුතාක්ෂරා" නම් ප්‍රහෙළිකාවිශෙෂය.

"පදමෙකං න කා යාති
යදි හාරෙණ වර්ජිතා" යනු මෙනි.

මෙහි "හාරෙණ" යනු "කාහාරෙණ" යි කියයුතුතැනි.

අක්ෂිපක්ෂ්මස්පන්දන, ඇසිපිය සැලීම.

අචලභාර, නරුපටෙහි නොවත් නෙරීපෙහි බර.

අත්‍යොන්‍යා, (සි) (අත්-ඕනා) අත තබන.

අනවද්‍යෂ්‍ටවිපාකලක්‍ෂණ, නිවරදබව හා සැපවිපාක ගෙනදීමත් ලක්‍ෂණකොට ඇති (කුශලධර්‍ම).

අනුවර්‍තන, වැටීම; පූර්‍වවාක්‍යයක පදයක් අපරවාක්‍යයක් හා සම්බන්‍ධවීම.

අන්‍යවිෂය, අනික් තැනක්; අනික් අරමුණක්.

අපභ්‍රංශ, ෂඩ්භාෂාමය දෘශ්‍යකාව්‍යයන්හි ගොපලු සැඩොල් ආදීන් විසින් කියයුතුසේ යොදන හීනභාෂාව.

"අපභ්‍රංශෙන තුෂ්‍යන්ති ස්වෙන නාන්‍යෙන ගුර්ජරාඃ" යනු කියෙයින් අපභ්‍රංශය ගුර්ජරදෙශවාසීන්ට ප්‍රියභාෂාවක් වේ. "ෂඩ්භාෂා" යන්න බලනු.

අපරාර්ධ, (අපර-අර්ධ) පද්‍යයක තුන්වන සතරවන පාදදෙක; දෙකට බෙදූ සමභාගදෙකින් දෙවෙනි සමභාගය.

අබ්භ්‍රමයිකාදි, (අබ්භ්‍ර-මයිකා-ආදි) වලා පිනි ආදිය.

අභිලාෂ, කැමැත්ත.

අර්චන, පූජාව; පිදීම.

අලකාපුර, වෛශ්‍රවණදෙව්රජහුගේ අගනුවර.

අලක්‍තකරස, ලතුදිය; ද්‍රවවූ ලාකඩ.

අවනත, නැමුණු; යොමුවූ.

අවයවාර්‍ථ, පදයක් පාසා කියයුතු අර්‍ථය; පදගතාර්‍ථය.

අවසර, අවකාශකාලය; ඉවරඇති වේලාව.

අවස්ථාන, සිටීම; (පොරොත්තුවීම)

අශ්වමුඛ, අශ්වාකාර මුහුණක් හා මනුෂ්‍යාකාර ශරීරයක් ඇති කින්නර විශෙෂය.

අශ්විනී ගමනෙ ශ්‍රේෂ්ඨා, අස්විදනකත ගමනෙහි උතුම්; (සඳු ගේ ශ්ලොකපාදයෙහි අවියි.)

අෂ්ටාදශරාග, ගීතියෙහි අඩංගු ස්වරභේද අටළොසක්. (සංගීත ශාස්ත්‍රඥයන්ගේ මතභේදයෙහි මාලවරාග, මල්ලාරරාග, ශ්‍රීරාග, වසන්තරාග යනාදීන් භේද සතිසක් කියත්. එයින් ද්‍රාවිඩ සංඛ්‍යාතයට අනුරූප කොට මෙහි අටළොසක් කීහයි හැඟේ.)

ඊෂද්‍රක්ත, (ඊෂත්-රක්ත) මඳරත්පැහැය.

උච්චක්ෂේත්‍ර, ග්‍රහයාගේ උසස්ගුණය ධරන රාශිය; උසස් ස්ථානය.

උත්ක්ෂේපණාවක්ෂේපණ, උඩට නැඟීම හා පහතට හෙළීම.

උදයපර්වත, හිරු උදාවන තැන; පළමුකොට ඉරඋදාවනු පෙනෙන තැන. (මෙහි පර්වතයක් නැතත් උපචාරවශයෙන් පර්වතයයි කියනුලැබේ.)

උෂ්ණීෂපට්ට, නළල්පට නම් පළඳනාව.

එකශ්වේතච්ඡත්‍රච්ඡායා, (රාජසිංහාසන මස්තකයෙහි බඳවනලද) එකම සේසතෙහි සෙවණ; එකම අණසක.

ඓරාවණහස්තිරාජ, ශක්‍රදේවේන්ද්‍රයාගේ ඇත්රජු.

ඕජෝගුණිෂ්ඨ, ඕජස් අධික; දීප්ති අධික.

ඔෂධීවෘක්ෂ, රාත්‍රිකාලයෙහි ආලෝකවත්වූ ඖෂධනම් වෘක්ෂවිශේෂය.

කර්බුර, කසල; කිළුට.

කථාශරීර, කථාවේ ස්වරූපය; කථාකාය.

කර්ණාවතංස, කන්පළඳනාව.

කලහපීලා, ඩබරින් වන බාධාව.

කල්පවෘක්ෂ, සිතූපැතූදෑ දෙන දිව්‍යවෘක්ෂ.

කස්තූරිතිලක, නළල්ආදිතැන කස්තුරුකල්කයෙන් තබන ලපය.

කහ්ලාර, දියෙහි හටගන්නා හෙල්මැලිනම් ඉනාමෙ මාලොක් මල්වර්ගය.

කාංචනදීපයෂ්ටි, (සිවුවන පහනක) රනින් කළ පහන්දණ්ඩ.

කාමධේනු, සිතූපැතූදෑ ප්‍රසව කරන දිව්‍යධේනුව; සුරභිධේනුව.

කාව්‍ය, දෘශ්‍ය ශ්‍රව්‍ය විශයෙන් දෙවැදෑරුම් ප්‍රබන්ධ; (ප්‍රධානවශයෙන් ශ්‍රව්‍යකාව්‍යවූ ශිශුපාලබධ-කිරාතාර්ජුනීය-රඝුවංශාදි පද්‍යග්‍රන්ථද කාදම්බරී-වාසවදත්තා ආදි ගද්‍ය ග්‍රන්ථද මෙහි කාව්‍යනම්).

කිංකිණී, රසුවැල; ඉනපළඳනාව.

කිරණශ්‍රේණි, රශ්මිපංක්තිය; රශ්මිසමූහය.

කීර්තිශ්‍රීමේඝවිහාර, කීර්තිශ්‍රීමේඝවර්ණනම් රජහුවිසින් කැලණිගඟ දක්ෂිණතීරයෙහි කරවූ කිත්සිරිමෙවන් කැලණිවිහාරය.

කුක්කුටේන්ද්‍රධ්වජ, කුකුළුරාජයන්ගේ රූපයෙන් යුත් ධ්වජ.

කුංකුමාංගරාගරේණු, කොකුම්පොතුයෙන් කළ ඇඟ ගානා විලවුන් සුණු.

කුණ්ඩලවිලාස, කන්තෝඩුවක ආකාරය.

කුත්සිත නර, නින්දිත මනුෂ්‍ය.

කුරුවින්දපාෂාණ, පද්මරාගමාණික්‍ය, (රතුමැණික්)

කුලක, පද්‍ය පසකින් හෝ ඉන් අඩුවැඩි සංඛ්‍යාවකින් පරස්පරසම්බන්ධ ඒකවාක්‍යත්වයට පැමිණි රචනා.

කුශලප්‍රශ්න, සැපසහසු ඇසීම.

කුසුමකෙශර, මල්රෙණු.

කූල, ඉවුර; ගඞ්ගාදීන්ගේ අසබඩ.

කෘතපුණ්‍යභාව, පෙර කළ පින්ඇතිබව.

කෘතමාලවෘක්ෂ, ඇසළරුක්.

කෛරවපුෂ්ප, හෙළමහනෙල්මල්.

ක්‍රියාගුප්තක, ක්‍රියාපදය අන්‍යපදයකින් වැසී නොහැඟෙන්සේ සඟවා රචනාකරන ප්‍රහෙලිකාවිශෙෂය. මීට උදාහරණ.

" ඝනනජඝනභරාභිරාමි මන්දං
ගමනමිදං මදිරාරුණෙක්ෂණායාඃ "යනුයි.

මෙහි ජඝනශබ්දය ලංවූහෙයින් ඝනනශබ්දයයි හැඟෙනු මිස "න ඝන"යි අව්‍යයපදයුක්ත ක්‍රියාපදයක් ප්‍රකාශව නොහැගේ. මේ "ක්‍රියාගුප්ත" නමැයිද කියත්.

ගද්‍ය, මාත්‍රා අක්ෂර නියමයක් නැතිව යොදනලද පදසමූහය(වාක්‍යයම්.)

ගගනොල්ලඞ්ඝන, (ගගන-උල්ලඞ්ඝන). අහසට නැඟීම.

ගුප්තභාෂණ, රහස්කථාව.

ගූඪචතුර්ථ, සවැදෑරුම් ගුප්තබන්ධනයන් අතුරෙහි පාදගූඪ නම් බන්ධන විශෙෂය. හෙවත් පද්‍යයක පාදතුනක් රචනා කොට සතරවෙනි පාදය නොකියා මුලපාදදෙක්හි අක්ෂරවලින්ම සතරවෙනි පාදය උපුටාගන්නාලෙස සැඟවීමය. මීට උදාහරණ,

1 ද්‍යුවියද්ගාමිනීතාර
2 සංරාවවිහතශ්‍රුතිඃ
3 කොවිඥ මාලා ශුශුභෙ
4 , , , , , , , ,

මෙහි එක්වෙනි දෙවෙනි පාදදෙක්හිවූ 2, 1, 7, 5, 11, 9, 13, 16, යන අටකුරෙන් චතුර්ථපාදය සකවනලදහෙයින් එයින් නඟාගෙන "විද්‍යුතාමිව සංහතිඃ"යි කියයුතුයි. මේ "පාදගූඪ" නමැයිද කියත්.

චඤ්චු, තුඩ; පක්ෂීන්ගේ මුඛය.

චතුෂ්ෂෂ්ටි ආභරණ, සිව්සැටක් රජපලඳනා.

චන්දනාඞ්ගරාග, සඳුනෙන් කළ ඇඟ ගානා විලවුන්.

චන්ද්‍රකාන්තපාෂාණ, සඳපහස වැටීමෙන් ජලවහනය වන ගල්වර්ගය.

චන්ද්‍රශාලා, මතුමහල; උඩුමහල්හි සඳඑළිය වැටෙන ශාලාව.

චමූපති, භටසේනාවේ අධිපතියා; සෙනෙවියා.
චාපචක්‍රප්‍රාස, දුනු-පාරවළලු-කුන්තායුධ.
චාපල්‍ය, චපලබව; නොවිමසා කරනසුලුබව; අලක්නැතිව අත්පා සෑලීම් ආදී ක්‍රියා.
චිත්තාධාන, සිත පිහිටුවීම.
චින්තාමාණික්‍ය, සිතූපැතූ දෑ ගෙනදෙන මැණික.
ඡදන, සෙවෙනිය; සෙවිල්ල.
ජගත්ත්‍රය, තුන්ලොව; ස්වර්ග-මර්ත්‍ය-පාතාල.
ජඝනස්ථල, උකුළුපෙදෙස.
ජල්පමානාවස්ථා, (ජල්පමාන-අවස්ථා); කථාකරන කාලය.
ජාතිසුමනාපුෂ්ප, දෑසමන්මල්.
තත්‍රභවත්, පූජ්‍ය; ගරුකටයුතු.
තදනන්තර, (තත්-අනන්තර); ඊළඟ, ඊට පසු.
තදර්ථසාධක, (තත්-අර්ථසාධක) ඒ අර්ථය සිද්ධකරන.
තරඞ්ගපඞ්ක්ති, රළපෙළ.
තර්ක, න්‍යාය වෛශේෂික පූර්වමීමාංසා සාංඛ්‍ය පාතඤ්ජල වේදාන්ත යන ෂඩ්දර්ශනශාස්ත්‍ර.
තාම්‍රසපඞ්ක්ති, නෙළුම්මල්පෙළ.
ත්‍රිභූමික, තුන්මහල්ඇති.
ත්‍රිවර්ගසම්පත්ති, ධර්ම අර්ථ කාම යන සම්පත්තුන.
ත්‍රිවිධකාව්‍යමුඛ, ආශිස් නමස්ක්‍රියා වස්තුනිර්දේශයයි තුන්ප්‍රකාරවූ කාව්‍යාරම්භය.
දම්පති, අඹුසැමිදෙදෙන.
දර්ශනක්ෂම, දකින්ට පුළුවන්.
දීක්ෂිත, (වේදසම්පෙහි කියනලද) ව්‍රතඋපවාසාදියෙහි නියුක්ත.
දූතකාව්‍යලක්ෂණ, පණිවුඩ යවන්නාක් මෙන් රචනාකරන කාව්‍යයක ලකුණු.
දූතක්‍රියා, පණිවුඩ ගෙනයාම.
දෛත්‍යාරි, (දෛත්‍ය-අරි) අසුරයන්ට සතුරු.
දොලා, ඔංචිලි; (උංචිල්ලා).
ධනද, වෛශ්‍රවණ දෙව්රජ; වස්තුදෙන ධනවතා.
ධනුර්ගුණසම්බන්ධන්‍යාස, දුනුදියෙන් දුන්නේ දෙකෙළවර එකක්වී බැඳෙන්නාක්මෙන් පද්‍යයේ ආදිඅන්තපද සම්බන්ධවන විධිය.
නක්ෂත්‍රාවිජ්කුනං චරම්-(යත්‍ර ශ්ලොකපාදභාති.) නැකතට වඩා ජීවිතය උතුම්.
නමේරුවෘක්ෂ, කිණිගස.
නලකූබර, වෛශ්‍රවණයාගේ පුත්‍රයා.
නාගමාණවිකා, නාගජාතික තරුණස්ත්‍රී.

නාටක, දෘශ්‍යකාව්‍ය; වික්‍රමෝර්වශී ශකුන්තලා මාලවිකාග්නිමිත්‍රාදි නාට්‍ය
    කාව්‍යයි.

නාසක්‍ය; දිව්‍යවෛද්‍යදෙදෙන.

නිරසන; දුරලීම.

නිර්යාතන; නිපදීම, ගටගැනීම.

නිඝ්‍රාත, සෙණි, අකුණ.

නූපුර, රනුගෙඩි; පාසලඹ.

නෛෂධචරිතකාව්‍ය, නිෂධදේශාධිපති නලරජහුගේ චරිතවර්ණනාව;
    ( ශ්‍රීහර්ෂනාකවීන්‍ද්‍රයන්විසින් විරචිත සංස්කෘත මහාකාව්‍යයකි).

නෛසර්ගික, ස්වභාවයෙන් සිඩවූ.

පාඬුරුණවර්ණ, පැසි රත්පැහැවූ.

පක්‍ෂපත්‍රසංහති, පියාපත්සමූහය.

පඤ්චාඞ්ගිකතූර්‍ය, ආතත-විතත-ආතතවිතත-ඝන-ශුෂිර යන පඤ්චවිධවූ
    තූර්‍යභාණ්ඩ.

පද්මපීඨ, නෙළුම්මලක ආකාරවූ පාපුටුව.

පද්මරාගමාණික්‍ය, රක්තමාණික්‍ය; (රතුකැට).

පද්මාකර, නෙළුම්විල.

පද්‍ය, ඡන්දශ්ශාස්ත්‍රයෙහි කීනියායෙන් අක්‍ෂරනියමය හෝ මාත්‍රානියම ය-
    හෝ ඇති පාදසතරකින් යුත් රචනා; හෙවත් කවි-ගී-ගාථා-
    ශ්ලෝක යන මේයි.

පරාඞ්මුඛ, පිටිපෑම; මුහුණ අන්අතකට හැරවීම.

පරිච්ඡේද, පිරිසිඳීම; මෙතෙකැයි නියම කිරීම.

පරිත්‍යාග, අත්හැරීම.

පරිලිකා, කොළපුව; මල වසා සිටි කොපුව.

පර්‍ය්‍යඞ්කමස්තක, ඇඳමතුපිට.

පර්‍ය්‍යාප්ත, තෘප්තවූ; ඇතැයි සම්පූර්ණවූ.

පිඤ්ජරවර්ණ, පීතවර්ණය, රත්රනට බඳු පැහැය.

පීලුවෘක්‍ෂ, මොරගස.

පුරස්සර, පෙරදැරි; පෙරටු.

පුලස්ති, රාවණවිභීෂණාදීන්ගේ වංශයෙහි පූර්වපුරුෂවූ එනම් ඍෂි-
    යෙක්.

පුෂ්පාඤ්ජලි, මල්ඇඳිලි, දෙඅතින පිරූ මල්.

පූර්වමන්මථ, ඊශ්වරයාවිසින් දවා ගළකරන්ට පළමු ප්‍රකෘතියෙන් සිටි
    අනඞ්ගයා.

පූර්වාපරවාක්‍යසම්බන්ධ, පෙරපසු වාක්‍යයන්ගේ ගැළපීම.

පූර්වාර්ධ, පළමුවෙනි සමභාගය; පද්‍යයක එක්වෙනි දෙවෙනි පාදදෙක.

පූර්වවෘත්ත, පෙර චරිතය; පෙර සිදුවූ පුවත්.

පෛශාචි, ශෞරසේනිභාෂාව ප්‍රකෘතිකොට ඇති පිසසුන්ගේ භාෂාව,

ප්‍රක්‍ෂේප, බහාලීම; දැමීම.

ප්‍රත්‍යක්ෂ, ඇසට පෙනෙන; ඉන්ද්‍රියයන්ට විෂයවූ.

ප්‍රත්‍යූෂකාල, ඉරඋදාවන්ට පළමු අහස එළිබවහන්වන කාලය; අලුයම් වේලාව; දවස ආරම්භවන කාලය.

ප්‍රබුද්ධ, පුබුදු, පිපුණු.

ප්‍රභාස්වර, ඉතා දීප්තිමත්.

ප්‍රරූඪ, වැඩුණු; ඇතුළුවුණු.

ප්‍රස්ඛලිත, පැකුලුණු; වැටුණු.

ප්‍රහෙලිකා, කෙළි සිනා සතුටුපිණිස හෝ ද්‍යූත්වියුක්තකු හැර අන් සවුන්ට නොහැඟෙන පිණිස හෝ අර්ථ සඟවා කරන රචනා විශෙෂයෙකි. ( අදුෂ්ට දුෂ්ටවශයෙන් විවිධවූ අලඞ්කාර නොවූ මේ ප්‍රහෙලිකාවගේද විශෙෂප්‍රභෙදයෝ බොහෝ වෙත්. )

ප්‍රාකෘත, සංස්කෘතභාෂාව ප්‍රකෘතිකොටඇති තද්භව තත්සම දෙශී වශයෙන් ප්‍රභෙදයනවූ ෂඩ්භාෂාවන් අතුරෙහි දෙවෙනිවූ භාෂා විශෙෂය.

ප්‍රාවෘත, පෙරෙව්; කය වසාගත්.

ප්‍රෞඪ, ඉතා වැඩුණු; තරුණවයස පසුකළ; වැඩි තැන්පත්.

බහුමාන, ගරුකාරය, ආදරය.

භෘඞ්ගාවලි, බමරපෙළ; මීමැසි සමූහය.

භොගාවලි, දරණවැල.

මකරන්දකීර්ණ, රෙණුයෙන් ( මල්රසයෙන් ) ගැවසුණු.

මථන, ඇලළීම; කැළඹීම.

මධ්‍යප්‍රදෙශ, ශරීරයේමැද පෙදෙස; ඉඟ.

මනොරථසිද්ධි, මනදෙළ සිදුවීම; අදහස ඉෂ්ටවීම.

මන්දරපර්වත, විෂ්ණුහුවිසින් සමුද්‍රමථනයෙහි දඬුකොට ගන්නාලද්දැයි ව්‍යවහාරවූ පර්වතය.

මරකතමාණික්‍ය, පලාවන්මැණික්; (පච්ච)

මර්දලධ්වනි, මර්දලනම් පණබෙර වෙසෙසෙහි හඬ. "සඝොෂ ප්‍රණව මර්දලෙෂ" යනු යාදවකොෂයි.

මලයතාම්බූලලතාලිඞ්ගිත, ගස්බුලත්වැලින් වැළඳගන්නාලද.

මලියදෙව, (පා) ලක්දිව මහරහතන් අතුරෙහි සුප්‍රසිද්ධවූ එනම් රහතන් වහන්සේ.

මහලුවිජයබාහු, (සි) පොළොන්නරුපුරයෙහි අවුරුදු පනස්ගණනක් රජකළ 'මහාවිජයබාහු' නම් නරෙන්ද්‍රයා.

මාගධී, ශෞරසෙනී භාෂාව ප්‍රකෘති කොටඇති දෙශභාෂාවිශෙෂයකි; ෂඩ්භාෂාවන් අතුරෙහි 'මාගධී' යනු මේ අශුද්ධමාගධියයි. (පාලි භාෂා නම්ලද ශුද්ධමාගධීමූලභාෂාව ෂඩ්භාෂාසඞ්ඛ්‍යාවට නොගණිනුලැබේ.)

මානාභරණ, මහාවිජයබාහුරජහුගේ බෑනණුවූ වීරබාහුරජ.

මාලතීලතාප්‍රතාන, පැතිරගිය දෑසමන්වැල්; දෑසමන්කැලය.

මුක්තාලතිකා, මුතුලැල්; මුක්තාහාර වැනිකොට එල්වන මුතුදැල්.
මෘදඞ්ගනාද, මිහිඟුබෙරහඬ; ( වැටකොළු එලයකට බඳු ආකාරඇති බෙරවෙසෙස මිහිඟු නමැයි කියත්).
මෙඛලාදාම, මෙවුල්දම; තුණුපලඳනාව.
යථාක්‍රම, පිළිවෙල නොඉක්ම.
යථොක්ත, පෙරකී ප්‍රකාර.
යමක, පද්‍යයන්ගේ ආදි මධ්‍ය අවසානයන්හි එක්වැනි ස්වරව්‍යඤ්ජනසමූහයන් නැවත නැවත ඇසෙන සේ යොදා රචනාකටයුතුවූ ප්‍රබන්ධ විශෙෂය.
යොගක්ෂෙම, නොලද දෙය ලැබීම හා ලද දෙය රැකීම; නිර්භය සැපත.
රක්තාධර, රත්පැහැ ඇත්තාවූ දෙතොල.
රජ්‍යමාන, සිත් ගන්නාවූ; සිත් අලවන්නාවූ.
රත්නප්‍රදීපායමාන, මැණික්පහනක් බඳුවන්නාවූ.
රත්නාවලි, මහාවිජයබාහුරජහුගේද ත්‍රිලොකසුන්දරීනම් බිසවගේද සතරවෙනි දියණිවූ වීරබාහු ( මානාභරණ ) රජහුගේ බිසෝවූ මහාපරාක්‍රමබාහු රජහුගේ මෑණිවූ එනම් බිසව.
රහස්‍යසම්භාෂණ, රහස්කීම, රහස්කථාව.
රාජකුල, රජසමූහය, රජපවුල.
“රාජහංසාස්තු තෙ චඤ්චු චරණෛර්ලොහිතෛඃසිතාඃ” අමරකොෂයි. රත්වූ තුඩු හා පාඇති ඒ සුදුවූ හංසයෝ රාජහංසනම් වෙත්.
රොහිණීනක්ෂත්‍රශකටශ්‍රී, රෙහෙණනකත සම්බන්ධවූ ගැලක් වැනිව පිහිටීමේ ශොභාව.
රොහිතමත්ස්‍ය, ලුහුලුමත්ස්‍යයා.
“ලග්නස්ථඃ සර්වදෝෂඝ්නඃ” ( බෘහස්පතීතෙම ) ලග්නයෙහි සිටියේ සියලු දෙස් නසයි යනු මේ ශ්ලොකපාදයෙහි අර්ථයි.
ලතාගෘහ, වැලින් වැසී අතුළත ගෙයක්වැනිව අවකාශ ඇතිවූ තැන්.
ලම්බකර්ණවංශ, එලෙන කන්ඇති ශාක්‍යරජකුමරුවන්ගේ වංශය; මෙහෙවත් මහබෝ වඩා ආ සුමිත්‍රනම් ශාක්‍යරාජකුමාරයා මුල්කොට ලක්දිව පැවති එනම් රාජපරම්පරාව.
ලංකාජනප්‍රවෙශ, ලපය ඇතුළුවීම
වජ්‍රාසන, අභෙද්‍යවූ ආසනය; අනිකකුවිසින් නහාලන්ට නොහැකි අස්න.
වනලක්ෂ්මී, වනශොභාව.
වරප්‍රාර්ථනා, කැමැතිදෙයක් අයදීම. වර ඉල්වීම.
වරුණදෙවරාජ, මුහුදට අධිපති එනම් දෙවරජ.
වර්ගබන්ධන, සමූහව බැඳීම; පෙළ ගැසීම.
වර්ණවිපර්‍යාස, පැහැ වෙනස්වීම.
වාණිජාවිශෙෂ, ප්‍රවෘත්තිවිශෙෂය; නොරතුරුවෙසෙස.

වාසවදත්තාකාව්‍ය, වාසවදත්තානම් කුමරියකගේ කථාවශයෙන් සුබන්ධු නාමි කිවිඳුවිසින් විරචිත සංස්කෘත ගද්‍යකාව්‍යය.

විජෘම්භමාණ, වැජඹෙන; සතුටින් පැලඹෙන.

විභීෂණ, රාවණරජහුගේ මලණුවූ එරජහු ඇවෑමෙන් රාක්‍ෂසාධිපතිව රජසිරි ලත් එනම් දෙව්රජ.

විලිප්ත, තවරනලද; ආලේප කරනලද.

විස්ඵුරිත, බැබළුණාවූ; දිලිහුණාවූ.

වේලාතට, වෙරළඅසල.

ව්‍යාකරණ, ඉන්ද්‍ර චන්ද්‍ර පාණිනි කාත්‍යායනප්‍රමුඛ ශාබ්දිකයන්විසින් කරන ලද ශබ්දානුශාසනශාස්ත්‍ර.

ශරත්කාල, වප්ඉල් දෙමස ප්‍රමාණකොට ඇති ශරත්සෘතුව.

ශරීරලාවණ්‍ය, රූපසෞන්දර්‍ය්‍යය; මනාරූ ඇතිබව.

ශාඛාභාර, අතුබර; බරවූ අතුපතර.

ශාලිගොප්කා, ඇල්ගොයම් රක්නා තැනැත්ති.

ශිඛර, මස්තකය; මුදුන.

ශිෂ්ටාභිෂ්ට, (ශිෂ්ට-අභිෂ්ට) පණ්ඩිතයන්ට අභිමතවූ කැමතිවූ.

ශෛවසමය, ශිවාගම.

ශෞරසේනී, සංස්කෘත ප්‍රකෘතිකොට ඇති ශූරසේනරටවැස්සන්ගේ භාෂාව.

ශ්‍යාමවර්ණ, අඳුරුනිල්පැහැය.

ශ්‍යාමායමාන, තමා ශ්‍යාමවර්ණවැනි කරන්නාවූ, පලාවන් හෝ නිල් වන් කරන්නාවූ

ශ්‍රවණමනොහාරී, කනට මනොඥවූ; කන්සිත් සතුටු කරන්නාවූ.

ශ්‍රීසනානන්දකාව්‍ය, ලක්දිව පෙරපැවති එනම් බෞද්ධ කාව්‍යග්‍රන්ථයක්; (විදාගම ශ්‍රීසනානන්ද පරිවෙණාධිපති මහාස්ථවිරයන්විසින් විරචිත බෞද්ධකාව්‍යයකැයි හැඟේ.)

ශ්‍රීවත්ස, විෂ්ණුහුගේ ළෙයි පිහිටි ශෛවතරොමාවර්තනය; එවැනි මඞ්ගල ලක්‍ෂණය.

ෂඩ්භාෂාකවිත්ව, අලඞ්කාරශාස්ත්‍රයෙහි නියමිතවූ සංස්කෘත ප්‍රාකෘතාදී භාෂාසයෙන් ශ්‍රව්‍යකාව්‍ය හා දෘශ්‍යකාව්‍ය රචනාකිරීම. (ෂඩ්භාෂා වන්ගේ ස්වරූපනිරූපණය අපගේ පඤ්කාප්‍රදීපසංඥපනයෙන්ද දතයුතුයි.)

ෂණ්මුඛදෙවරාජ, මුහුණුසයක්ඇති දෙව්රජ; කඳකුමරු.

සංලාල, තරුණයා; ක්‍රීඩාපරවශ පුරුෂයා; සලෙළු.

සංශ්ලෂභාව, සම්බන්ධබව; එකතුබව.

සංස්කාරජන්‍ය, පූර්වජාතික වාසනාගුණයෙන් හටගත්.

සබ්‍රජන, යෙහෙළිසමූහය; සගළු සත්‍රිහු.

සප්තාහවර්ෂලිකා, (පා) සතියක් නොකඩව පැවති වැස්ස.

සන්තතිවිච්ඡේද, පරම්පරාවගේ කඩවීම.

සන්දෙශහර, පණිවුඩ ගෙන යන්නා.

"සන්ධ්‍යාකාලමතික්‍රම්‍ය කිඤ්චිද්දෘශ්‍යන්ති තාරකාඃ

යොගො'යං විජයො නාම සර්වකර්මසු පූජිතඃ"

සවස්වේලාව ඉක්මවා මඳක් තාරකාවන් දක්නාහුද මේ විජයයොග නම්. සියලු ක්‍රියාවෙහි ප්‍රශස්තයි.

සමුදායාර්ථ, වාක්‍යයෙක්හි ගළපනලද පදසමූහයාගේ මුළුඅදහස.

සම්මාර්ජන, පිසදැමීම, ඇමදීම.

ස-රි-ග-ම-ප-ධ-නි, ගාන්ධර්වශාස්ත්‍රඥයන්ගේ මතයෙහි ෂඩ්ජාදිස්වර සතට ක්‍රමයෙන් සලකුණුවූ මෙකී ව්‍යඤ්ජනෂට්කය ෂඩ්ජාදි ව්‍යජන නම්. එයින් කීහ-

" සරිගා මපධා නිශ්ච වර්ණාඃ සප්තස්වරාදයඃ

ෂඩ්ජාදිකෘතසංඥකා ඥෙයා ගාන්ධර්වවෙදිභිඃ" යි.

සර්වගුණසෞන්දර්‍ය්‍ය, සියලුගුණයන්ගේ යහපත්බව.

සස්‍යමඤ්ජරි, ගොයම්කරල්.

සාන්ද්‍ර, ඝන, හැසුණු.

සාමදානාදි, සාමය දානය යන උපාය දෙක ආදිකොට ඇති; (ආදිශබ්දයෙන් භෙදය දණ්ඩය යන උපාය දෙක ගැණෙනයි. මෙසතර එක්වූවිට රජුන්ගේ චතුරුපාය වේ).

සිංහාවලොකනන්‍යාය, සිංහයා සිටිතැනම සිටිමින් ඉදිරිපසද පිටිපසද බලන්නාසේ එක්ශබ්දයක් මැද සිටිමින් දෙපස ශබ්දයන් හා සම්බන්ධවන විදිය.

සිද්ධාඞ්ගනා, ( සිද්ධ-අඞ්ගනා ) සිද්ධනම් දෙවයොනි විශෙෂයාගේ ස්ත්‍රීහු.

සුකුමාරභාව, ඉතාමොලොක්බව.

සුභට, යහපත් යොධයා; දක්ෂ යුධකාරයා.

සුභාෂිතාදිපඨන, යහපත් (අවවාද) වචනාදිය කීම.

සුවෘත්ත, ඉතා සිළුටු; ඉතා මට්ටම්.

සුසජ්ජිත, මනාව සරසනලද.

සුස්නිග්ධ, ඉතා සිනිඳු.

සුත්ඵුල්ල, ඉතා හොඳින් පිපුණු.

සූර්‍ය්‍යවංශ, සූර්‍ය්‍යයාහට බත්වූ මනුරජහු මුල්කොට පැවති රාජවංශය.

සෞකුමාර්‍ය්‍යප්‍රාප්ත, මොලොක්බවට පැමිණි.

ස්කන්ධ, කඳ, වෘක්ෂයාගේ මුලහටන් ශාඛා අවසන්කොට ඇති මධ්‍යභාගය.

ස්මෘතිවිප්‍රවාස, සිහිමුළාව; ප්‍රමාදය; මතකනැතිවීම.
හස්තපුට, දෙහොත; එකතුකළ අතුල්දෙක.
හුද, මහඹ; ගැඹුරුජලාශය.
ළ, (සි) හෘදය; සිත; තරුණ; (මාගධී හදශබ්දයට අභේදවූ හළය-
යන ශබ්දරූපයෙන් ආදිලෝපව සිද්ධවූ තද්භවශබ්දරූපයෙකි.
“ආණ්‍ය” ශබ්දයෙන් අකාරලෝපව ණකාර යකාර දෙදෙනා-
ගේ විශ්ලේෂයෙන් සිද්ධවූ සෘණවාචී ණ යශබ්දය මෙනි).
ළකල්, (සි) මනොඥ; මනඃකාල්‍ය; සිත්කලු.
ළද, (සි) තරුණජාතික ස්ත්‍රී; කන්‍යාව; ළඳරී.
ළඳ, (සි) කාන්තාව; (ඉරසඳ නොදක්නා රාජස්ත්‍රීන් මෙන් බැහැර
කරුණු නොදත්) මුග්ධත්වය ඇත්තී.
ළැහැබ, (සි) කැලය; (ප්‍රකෘතිය ‘ළැහැබ්’ යනුයි).

---

## ශ්ලෝකාර්ථ විවරණය.

විචාන්, ප්‍රාඥවූ කවිතෙමෙ; ප්‍රසිද්ධම්, (තත්‍රගතකෘතපුණ්‍යකුලීනත්වාදි ගුණයෙන්) ප්‍රකටවූ, පුරුෂංවා, පුරුෂයකු හෝ; අථ, නොහොත්; යෝෂිතම්, ස්ත්‍රියක හෝ; නායකීකෘත්‍ය, කාව්‍යනායක කොට; වංශාදිභිඃ, වංශාදිගුණයන් කරණකොටගෙන; ශුභෛඃ, ශොභනවූ; දූතෛඃ, දූතයන් ලවා; ඉතිහාසකථාපූර්වම්, පුරාවෘත්තකථනයක් පෙරටු කොට ඇති; අථාපි වා, නොහොත්; ආශීඃපූර්වම්, ආශිර්වාදයක් පෙරටු කොට ඇති; සන්දේශම්; වාචිකය, හෙවත් හස්න; ප්‍රේෂයන්ති, යවත්තේය.

දූතස්තු, දූතයා වනාහි; ආදෞ, පළමුකොට; කුශලප්‍රශ්නපූර්වකම්, ආරොග්‍යප්‍රශ්නය පෙරදැරි කොට; වර්ණයේත්, වර්ණනා කරන්නේය; තස්‍ය, ඒ දූතයාගේ; වර්ණනානන්තරම්, ගුණකථනයෙන් ඉක්බිති; ගන්තව්‍යස්ථානකීර්තනම්, (පණිවුඩය ගෙන) යායුතු ස්ථානයාගේ වර්ණනාව (කරන්නේය); පශ්චාත්, ඉන්පසු; තත්, එහෙයින්; ශ්‍රොෂ්‍යසි ඉති, අසන්නෙහියයි; උක්ත්වා, කියා; මාර්ගදේශාදි, මාර්ගදෙශආදිය; වර්ණයෙත්, වර්ණනා කරන්නේය; තතඃ, ඉක්බිති; තද්දේශනගරනායකානාම්, ඒ දෙශාධිපතීන් හා නගරාධිපතීන්ගේ; ගුණස්තුතිඃ, ගුණවර්ණනය (කටයුතු වේ); තතඃ, ඉක්බිති; වෘත්තාන්තකථනම්, සන්දේශයාගේ ප්‍රවෘත්තිකථනය වේ; පරම්, එයින් මත්තෙහි; දූතස්‍ය, දූතයා පිළිබඳවූ; ආශිෂඃ, ආශිර්වාදය වේ.

තදපිම්, ඒ (නලරජහට) ශ්‍රුතිපිණ්ඩිස; අධ්‍යාපන, (ස්තුතිවාදයන් උගන්වා; ජනෙන, සම්පවර්ජ්න් ජනයාවිසින් අහෝ නොහොත් උද්‍යානපාලජනයාවිසින්; තවනෙ, ඒ වෙනෙහි; විමුක්තාඃ, (පජරබන්ධන-යෙන්) මුදා හරනලද; පටවඃ, වියත්බෙපුල් ඇති; ශුකාඃ, ගිරපැටවු

(ශිරවූ); තම්, ඒ නලරජහට; අසතුවන්, සතුතිකලහ; තශෛවෙ, ඒ කිර පක්ෂීන් මෙන්ම; තත්පෞරුෂගායනී කෘතාඃ; ඒ නලරජහුගේ වික්‍රමය පිළිබඳ ගායනීන් කරනලද්; ශාරිකාශ්ච, (කිරාඞ්ගනාඃ) සැලලිහිණිහුද; ස්වරාම්‍ෘතෙන, අමාබඳු ස්වරයෙන් හෙවත් මධුරස්වරයෙන්; උපජගුඃ, සඞ්ගීත කළාහුය.

යත්‍ර වධූසු, යම්අඞ්ගනාකෙනකුන් වෙතෙහි; පඤ්චමමඤ්ජුවචවඃ, පඤ්චම ස්වරයෙන් මධුරවූ බස්ඇති හෙවත් තුඩුඇති; පිකාඃ, කොකිලපක්ෂීහු; කලම්, මධුර කොට හෙවත් මියුරු අව්‍යක්ත හඬින් යුක්තව; උජ්ජගුඃ, උසස් නාදකළාහුද; චන්‍ද්‍රකිණඃ, මයුරයෝ; ගෘහාඞ්ගණෙෂු, (යම්කෙන කුන්ගේ) ගෙමිදුල; අම්‍ෘජංඝතරාම්, අතිශයින් ඇමද පිරිසිදුකළාහුද; ශාරිකාඃ, සැලලිහිණිහු; වචොහරාඃ, (යම්කෙනකුන්ගේ)පණිවුඩ ගෙන යන්නාහුද; (එබඳුවූ;) වඃ කෘතෙ, තොප පිණිස; (කවිවරයෝ;) කවි තෘෂ්ණම්, කාව්‍යකර්තෘබවට; න අගුඃ, නොපැමිණියාහුය. කවින්ගේ වර්ණනාශක්තිය ඉක්මිණැයි සේයි.

---

විද්‍යාලඞ්කාර පරිවෙණාධිපති පූජනාචාර්‍ය්‍ය

ර ත් ම ලා නේ

**ධ ර් ම කී ර්ති ශ්‍රී ධ ර්මා රා මා භි ධා න**

ලක්දිව බටහිර වයඹ දෙදිසාවෙහි

ප්‍රධානනායක ස්වාමිපාදයාණන්වහන්සේ විසින්

වි ර චි ත.

ශාරිකාසන්දෙශ ග්‍රන්ථිපද විවරණය

නි මි.

# දැන්වීමයි.

## ප ද වි නි සං

ජේදවත්තේ ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාවේ අප ඉගෙනගන්නා කල පහළ පන්තිවල ළමයින්ගේ ප්‍රයෝජනය සඳහා අප ආචාර්ය උගත් ඈම්. සී. ප්‍රේරා ගුරුතුමන්විසින් ශී 172 කින් යුත් මෙම කුඩා ව්‍යාකරණ පොත ලියනලද්දේය. හතරවෙනි පස්වෙනි පන්ති දෙකේදී අපි මේ පොත කියා හයවෙනි හත්වෙනි අටවෙනි පන්තිවලට පැමිණි පසු අනිකුදු ව්‍යාකරණ පොත් භාවිතා කෙළෙමු. එයින් අපට ලැබුණු පහසු වද ප්‍රයෝජනයද අත්දුටුනිසා මේ පොත අපේ ආධුනික බාල පරම්පරාව අතටද අත්කරවන අදහසින් අච්චුගස්වා ප්‍රසිද්ධ කෙළෙමු. දැනට එයින් ඉතුරුව තිබෙන්නේ පොත් ස්වල්පයක්බැවින් පොත් ලබාගනු කැමති භවතුන් වහාම අපෙන් සහ කොළඹ කච්චේරිය ඉදිරිපිට පොත් වෙළඳ මහතුන්ගෙන්ද ඉල්ලුම් කටයුතුයි. සියගණනේ ගන්න අයට විශේෂ කොමිස් අඩුකරනුලැබේ.

පොතක මිල ශත 10 යි    තැපැල් මිල ශත 02 යි.

ඩී. ජී. වණිග සූරිය අප්පුහාමි
කිත්තාන්පහුව
ජේදවත්ත
ග්‍රෑන්ඩ්පාස්